ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

**03** භාග්‍යවන්ත සමාජයක් ආදරණීය වෙනසක්



**09** මරිය වසර සඳහා වූ එඬේරික අනුශාසනා පත්‍රය



**13** ගිලටිනය සුනිලුන්ට පමණක් ද?




# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07

www.colombocatholicpress.com


**මරණය...**

මනුලොවින්
සග උපත ලැබීමකි
සදාකාල ජීවනයේ
දොරකඩට පිවිසීමකි
අනන්ත ජීවිතයේ
නිත්‍ය සුව විඳීමකි

**සුබ මරණයක් සඳහා ඔබ සූදානම් ද?**



ක්‍රි.ව. 2013 ක් වූ නොවැම්බර් 17 ඉරිදා 148 වෙළුම 25 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/51/NEWS/2013

## පිලිපීනයේ හයියාන් සුළි කුණාටු විපත ගැන

# ශ්‍රී ලංකා කතෝලික රදගුරු මඬුල්ලේ හා සමස්ත කතෝලික ජනතාවගේ සොව පළ වේ!

## මේ දුක්බර මොහොතේ දී ඒ ජනතාව සිහිපත් කරන්නැයි ආයාචනයක්

**පිලිපීනයේ හයියාන් සුළි කුණාටුව හේතුකොටගෙන එරට ජනතාව විශාල පිරිසකගේ ජීවිත අහිමි වී, තවත් ලක්ෂ සංඛ්‍යාත පිරිසක් අවතැන් වී, උන්හිටි තැන් විනාශ වී ගොස් තිබෙන මේ මොහොතේ ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු සම්මේලනය බලවත් කම්පාවටත් සංවේගයටත් පත්වී ශ්‍රී ලාංකේය ජනතාව සමග පිලිපීනයේ කතෝලික රදගුරු මඬුල්ලට ශෝකය පළ කර ඇත.**



සුන්බුන් ගොඩක් බවට පත් වූ සුන්දර ටැක්ලොබාන් නගරය

ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ මහ ලේකම් සලාපුර රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් රදගුරු හිමිපාණන් විසින් මේ ශෝක පණිවුඩය නිකුත් කර තිබේ.

එහි මෙසේ ද දැක්වේ. ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය මේ දුෂ්කර මොහොතේ දී විපත් පත් ජනතාවටත් ඔවුන්ගේ නෑ හිතවතුන්ටත් ශක්තිය හා ධෛර්යය ලබා දෙන්නැයි දෙවි පියාණන් වහන්සේගෙන් ඉල්ලා සිටින අතර ඒ වෙනුවෙන් යාච්ඤා කරන බවට ද ප්‍රකාශ කරයි.



විනාශ වූ කතෝලික දෙව්මැඳුරක් තුළ බංකුවක් මත තම මියගිය ඥාතියාගේ සිරුර තැන්පත්කොට දුකින් වැළපෙන පිලිපීන කාන්තාවක්

## ගරු බර්ට්‍රම් දබරේරා පියතුමා සගසුව දිනයි



කොළඹ කතෝලික මුද්‍රණාලයේ හිටපු අධ්‍යක්ෂ, ඥානාර්ථ ප්‍රදීපයේ වැඩබලන කර්තෘ, කොළඹ අගරදගුරු වසමේ භාණ්ඩාගාරික ලෙස සේවය කළ ගරු බර්ට්‍රම් දබරේරා පියතුමා ඉකුත් ඉරිදා සදා සාමය දිනීය.

මාලිගාවත්ත සාමයේ අප රැජින දේවස්ථානය ගොඩනැංවීමට පුරෝගාමී වූ එතුමා පසු කලෙක අතුරුගිරිය සාන්ත පියෝ දෙව්මැඳුර ගොඩනැංවීමට ද ඇප කැප විය. ඉකුත් අඟහරුවාදා මාලිගාවත්තේ දී එතුමන්ගේ අවසන් කටයුතු සිදු කැරිණ. එතුමාට සගසුව පතමු.

**(විශේෂ ලිපියක් 14 පිටුවේ)**

## කුරුණෑගල හිටපු අනුනායක පියතුමා සදා සාමය දිනයි



කුරුණෑගල රදගුරු වසමේ හිටපු අනුනායක අතිගරු ලූෂන් ප්‍රනාන්දු පියතුමා ස්වර්ගස්ථ වී වදාළේය. එතුමාගේ දේහය මල්කඩුවාව පාතිමා දෙව්මැඳුරේ තැන්පත් කර තබා ඉකුත් සඳුදා කුරුණෑගල පොදු සුසාන භූමියේ කතෝලික අංශයේදී භූමදාන කළේය. එතුමන්ගේ ආත්මයට සගසුව ලැබේවා!

## නව මීසමක්

කොළඹ ග්‍රෑන්ඩ්පාස් මීසමට මෙතුවක් අයිතිව තුබූ මහවත්ත සා.අන්තෝනි දෙව්මැඳුර නව මීසමක් බවට පත් කළ බව දකුණු කොළඹ කලාපීය නාහිමි අතිගරු ඇන්තනි ප්‍රනාන්දුපුල්ලේ පියතුමා නිල වශයෙන් දන්වා සිටී.

# මෙදා නත්තලට මීගමුවේ නත්තල් කලාපයක්

## රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අත්වැල් බැඳගනී



**මෙල්වින් ද කොස්තා විසිනි**

2013 වර්ෂයේ නත්තල නිමිත්තෙන් මීගමුව අගරදගුරු නික්ලස් මාකස් ප්‍රනාන්දු මාවත දෙපස නත්තල් කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කැරෙන අතර ඒ මාවතේ පිහිටා ඇති නාගරික ක්‍රීඩාංගනය කේන්ද්‍ර කරගෙන දෙසැම්බර් 20, 21 හා 22 දිනවල නත්තල් ප්‍රසංග, සංස්කෘතික වැඩසටහන්, කැරොල් ගායනා, නාට්‍ය, නැටුම් තරග පැවැත්වීමට සැලසුම් කර තිබේ. මීගමුව කතෝලික ශාසනාරක්ෂක බල මණ්ඩලයේ මහ සභා රැස්වීමේදී මේ තීරණ ගැනිණි.

උතුරු කොළඹ කලාපීය නාහිමි, බලමණ්ඩල සභාපති අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මේ මහ සභා රැස්වීමට මහවීදිය මීසම් සේවක ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු, කෝන්ගොඩමුල්ල මීසම් සේවක ගරු බර්නාඩ් කුරේරා පියතුමන්ද, මීගමුව මහ නගර සභාවේ කතෝලික මන්ත්‍රීවරුන් ද තම්මිට කාදිනල් කුරේ මධ්‍යස්ථානයේ පැවති මේ රැස්වීමට එක්විය. දෙසැ. 20, 21 දිනයන්හි අගරදගුරු පදවි සහයක රදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ද, 22 වැනි දා කාදිනල් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ද පැවැත්වීමට තීරණය කැරිණ. (තරග විස්තර ලබන සතියේ)

# යහපත් එඬේරා තාපස නිකායේ ශ්‍රී ලංකා/පාකිස්ථාන කලාපයේ නව ප්‍රාදේශාධිපතිනිය පත්වීම් ලබයි



ගරු මේරි ප්‍රැන්සින් මුතුගල පැවිදි සොයුරිය

"සානුකම්පිත බවින් දැල්වී, විශ්වයම දවාලන්න" තේමාව මුල් කරගනිමින් මෙවර යහපත් එඬේරා පැවිදි නිකායේ ශ්‍රී ලංකා / පාකිස්ථාන ප්‍රාදේශිකයේ 18 වන ප්‍රාදේශීය සමුළුව 2013 නොවැ. 01 දින සිට 09 දින දක්වා රෝමයේ සිට පැමිණි නිකා නායිකාව වන අතිගරු බ්‍රිජිඩ් ලෝලර් සහ ඇයගේ අනුශාසකවරියන්ගේ ද සහභාගිත්වය ඇතිව නායකකන්ද යහපත් එඬේරා මුල් ගෘහයේදී පැවැත්විණ.

එහිදී ශ්‍රී ලංකා / පාකිස්ථාන ප්‍රාදේශීය නව නායිකාව ලෙස ගරු මේරි ප්‍රැන්සින් මුතුගල පැවිදි සොහොයුරිය තේරී පත්වූවාය.

15 පිටුවට »

**"ස්ථිරව සිටීමෙන් ඔබ ජීවනය දිනා ගන්නහු ය." (ලූක් 21:5-19)**

පදවියෙන් පදවියට

## සුබාසිංසන



කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් කාදිනල් වරයට එසවීමේ සංවත්සරය නොවැම්බර් 20 දාට යෙදේ. එතුමනට ප්‍රදීප සුබාසිංසන!

## ලේ දන්දීම තෙවන වරටත්

හෙට්ටිපොල දිව්‍ය හෘදයේ දෙව්මැඳුරේ "ටෙරන්ස් පිය" සමරු ශාලාවේදී ලේ පරිත්‍යාග කිරීමක් පවත්වන ලදී. ලේ පරිත්‍යාග කිරීමට සියයකට අධික පිරිසක් ඉදිරිපත්වූ අතර බොදුනු සහ අන්‍යාගමික ජනතාවගේ වැඩි සහභාගිත්වයක් දක්නට ලැබීම විශේෂත්වයකි.

මීසම් සේවක ගරු එමාඩ් ප්‍රනාන්දු පියතුමන්ගේ මඟ පෙන්වීම යටතේ දේවස්ථාන අවමංගල්‍යාධාර සමිතිය හා දායක සභාව මෙය සංවිධානය කළහ.

ප්‍රිස්කා සුමුදිනී

# සුසාන භූමිය ශුද්ධ භූමියක් වන්නට නම්
# හොල්මන්, අවතාර මත දුරු කර ගන්න

## ගාල්ල රදගුරු හිමිපාණෝ සුසාන භූමියේදී පවසති

**කෙනෙක් මිය ගිය පසු ඇතැම් අයට හොල්මන් අවතාර ගැන සිතිවිලි ඇති වෙනවා. සුසාන භූමිය ශුද්ධ භූමියක් වන්නට නම් හොල්මන් අවතාර මත සිතින් දුරු කර ගත යුතුයි. ඔවුන් ජීවත් වූ කාලයෙ සමාදානයෙන් ප්‍රේමයෙන් හා බෙදා ගැනීමෙන් ගත කළානම් මරණයෙන් පසු ඒ දේව දීමනා ගුප්ත බවට පත්වන්නෙ කොහොම දැයි ගාල්ල රදගුරු අතිඋතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණෝ විමසා සිටියහ.**

ගාල්ල දඩල්ල පොදු සුසාන භූමියේ කතෝලික ඒකකයේ පැවති මළවුන්ගේ මංගල්‍ය දේව මෙහෙයේදී උන්වහන්සේ එසේ පැවසූහ.

ගාල්ල මීසම් සේවක ගරු මයිකල් කොලින් පියතුමා හා මීසමේ මරණාධාර සමිතිය මළවුන් ගේ මංගල දේව මෙහෙය සංවිධානය කර තිබූ අතර ගාලු පදවි කලාපීය නාහිමි අතිගරු චාල්ස් හේවාවසම් පියතුමා හා පූජක පැවිදි සංඝය ද කිතුනු හා වෙනත් ආගමික සැදැහැවතුන් විශාල පිරිසක් ද මේ අවස්ථාවට සහභාගි වූහ.

මංගල ජයවර්ධන



කොළඹ අගරදගුරු පදවි සාන්ත වින්සෙන්ති ද පාවුළු සංගමයේ මධ්‍යම මණ්ඩලය මෙවර ළමා දිනය වෙනුවෙන් නායකත්වය හා තීරණ ගැනීමේ ශක්තිය වර්ධනය කර ගැනීමට පදවියේ ළමුන් සඳහා වැඩ මුළුවක් මාදම්පේ සෙත්සරණ ආදර්ශ ගොවි පළ පරිශ්‍රයේදී පවත්වන ලදි. ඒ සඳහා මූලිකව පූර්ණ අනුග්‍රහය හා මඟ පෙන්වීම, සාන්ත වින්සෙන්තිද පාවුළු සංගමයේ මධ්‍යම මණ්ඩල අධ්‍යක්ෂ ගරු රෝහාන් ද අල්විස් පියතුමාගෙන් ලැබුන අතර, සෙත්සරණ ආයතනයේ විධායක කළමණාකාර ටයිටස් විමලසිරි මහතා සහ ඔහුගේ කාර්යය මණ්ඩලය විසින් එය මෙහෙයවන ලදි. අගරදගුරු පදවියේ සියලුම කොන්ෆරන්ස වලින් මේ සඳහා ළමුන් සහභාගි කර ගැනීමට මධ්‍යම මණ්ඩල ගරු සභාපතිනි විසාකා වැලිවිට මහත්මිය විශාල කැප කිරීමක් කර තිබිණ.

ඇනක්ලීටස් සිල්වා

## රත්නපුර ආසන දෙව්මැඳුර නවීකරණයෙන් පසු අබිසෙස් ගැන්වේ



රත්නපුර සා. පේදුරු පාවුළු ආසන දෙව්මැඳුරේ ප්‍රතිසංස්කරණය කර විශාල කිරීමෙන් පසු අබිසෙස් ගැන්වීමේ උලෙළ රත්නපුර රදගුරු අතිඋතුම් ක්ලීටරස් චන්ද්‍රසිරි පෙරේරා සා. බෙ.නි හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකැරිණි.

ගාල්ල රදගුරු අතිඋතුම් රේමන්ඩ් වික්‍රමසිංහ, අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් එම්මැනුවෙල් ප්‍රනාන්දු හිමිපාණන් ද, සා.බෙ.නි ලෝක ශ්‍රෙෂ්ඨාධිපති අතිගරු මයිකල් කෙලී පියතුමන්ද මේ සුවිශේෂි අවස්ථාවනට එක්විය.

අතිඋතුම් එම්මැනුවෙල් ප්‍රනාන්දු රදගුරු හිමි දමිල බසින් දෙසුම පැවැත්විය. ආසන දෙව්මැඳුරු පාලක රත්නපුර මීසම් සේවක ගරු රංජන් මාල් මොරායස් පියතුමා ඉඩකඩ ඇති සුව පහසු ආසන දෙව්මැඳුරක් ගොඩනැගීමේ සිහිනය සාර්ථක කරගන්නට සුවිශේෂි දායකත්වයක් දැක්වූ අතර සිහිනය යථාර්ථයක් වූ බව සනිටුහන් කරමින් සමරු කලඹක්ද එදින එළිදුටුවේය.

තියබෝල්ඩ් සමරතුංග

## වාර්ෂික මංගල්ලයෙන් ආඩිඅම්බලම පිබිදේ!



කටුනායක ආඩිඅම්බලම ශුද්ධවූ ජපමාල මාතා දෙව්මැඳුරේ වාර්ෂික මංගල්ලය අර්ථවත්ව පැවැත්වුනි. අර්ධ මීසමක් ලෙස ක්‍රියාත්මක වන ආඩි අම්බලම සංඝයේ වාර්ෂික මංගල්ලයට පෙර මීසම් සේවක ගරු නිමල් පොන්වීර පියතුමා පවුල් බැහැදැකීම ආරම්භ කර කොට්ටාශ නායික නායිකාවන්ද සමගින් ගියහ. නිවෙස්වල ජනතා අවශ්‍යතා සොයා බලමින් අවශ්‍ය විසඳුම් ලබාදෙමින් පවුල් බැහැදැකීම සිහිග ැන්වීමට සකස් කළ විශේෂ යැදුම් පතක් සෑම පවුලකට ලබාදී තිබුණි.

පවුල් බැහැදැකීමෙන් පිබිදුනු මීසම් ජනතාව වාර්ෂික මංගල්ලයට මහත් උද්‍යෝගිවත්ව එක්වූ අතර වාර්ෂික මංගල්‍ය දින අවසන් දිව්‍ය පූජා යාගය මීසමේ පූජක පුතුන් තිදෙනකු වන ජාඇල මීසම් සේවක ගරු ග්‍රෙගරි ජයන්ත ප්‍රනාන්දු නිමල මරිය නිකායේ ගරු ජනප්‍රිය වාස් හා රොෂාන් චමින්ද ප්‍රනාන්දු පියතුමන්ලාගේ සහභාගිත්වයෙන් සිදුකෙරිනි. නුවාන දිනවල ජනතාව පිදූ පඬුරු ප්‍රදේශයේ දුගී දුප්පත් පවුල් අතර බෙදාහැරිණ.

ටී. සුනිල් ප්‍රනාන්දු

## මළවුන් සමරා කනුවන මීසමේ නව වැඩසටහනක්

කනුවන මීසම් සේවක ගරු ලෙස්ටර් නෝනිස් පියතුමාගේ සංකල්පයක් අනුව මළවුන්ගේ මාසය පුරා කිතුනු පවුල් ශ්‍රී කුරුසිය වටා රොද බඳිමින් මීසමේ දියත් කර ඇති කිතුනු ඒකක යැදුම් මෙහෙය ඉතා සාර්ථකව පැවැත්වේ.

සෑම කිතුනු නිවසක් පාසාම ශ්‍රී කුරුසිය රැගෙන ගොස් ශුද්ධ වූ බයිබලය සිංහාසනාරූඪ කර, මළවුන් සිහිපත් කර මළවුන්ගේ ජපමාලයත්, ප්‍රාර්ථනාවත්, දේව වචනය බෙදා ගැනීමත්, අවසානයේදී දේව මාතා ගීය ගැයීමෙන් යැදුම් මෙහෙය අවසන් කෙරේ.

ධර්මසිරි ප්‍රනාන්දු

# අධිවේගි සමාජයක දිවිගෙවන අපට සියල්ල අධිවේගි කරගන්න සිදුවෙලා

අද අපි ජීවත්වන්නේ අධිවේගී සමාජයකයි. අපි ගමන් කරන්නේ අධිවේගී මාර්ග වලයි. කන්නේ බොන්නේ නා නා විධි අධිවේගි ආහාරයි. නැටුම් ගැයුම් පමණක් නොවෙයි අධ්‍යාපනයත් අධිවේගි වෙලා. මුදල් හදල් සොයන්නෙත් අධිවේගිවයි. මෙයින් අපගේ අවශ්‍යතා වැඩිවෙනවා. ආශාවන් වැඩිවෙනවා මිසක් කිසිදාක අපි තෘප්තිමත් වන්නේ නැතැයි කොළඹ සහයක රදගරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණන් ප්‍රකාශ කළේ කඩලාන සා. දොන් බොස්කෝ සමිතියේ 50 වන ස්වර්ණ ජයන්ති මංගල දිව්‍ය පූජාවේදීය.

දිව්‍ය පූජාවට පෙර දේවස්ථානයේ දකුණු දෙසින් ඉදිකරන ලද නව අලංකාර මණ්ඩපය ආසිරි ගැන්වීම රදගුරු හිමිපාණන් අතින් සිදුවිය. එම අවස්ථාවේදී සැදැහැවතුන් අමතා කතා කළ මීසම් සේවක මොරටුව දිසානායක අතිගරු ලලිත් පෙරේරා පියතුමා මෙම මණ්ඩපය තමාගේ අදහසක් අනුව ඉදිවූවක් නොවන බවත් මෙම අදහස මීසමේ තරුණයින් තුන්දෙනකු පැමිණ තමාට දුන් බව අනාවරණය කළේය.

50 වන සංවත්සරය නිමිත්තෙන් ශුද්ධෝත්තම පියතුමාගේ විශේෂ පණිවිඩය ගරු පියතුමා අතින් ප්‍රකාශයට පත් කැරිණ.

සහයක ගරු දිනේෂ් ප්‍රශාන් පියතුමා කුඩා මල කන්‍යාරාමයේ පැවිදි මව්තුමියන් ශාන්ත දොන් බොස්කෝ සමිතියේ ආරම්භක සභාපති සිරිල් ඩයස් මහතා ඇතුළු පැරණි හා වර්තමාන සාමාජිකයින් සමග අති විශාල සැදැහැවත් ජනතාවක් එක්වී සිටියහ.



සටහන - සුමිත් මාර්ක් ද සිල්වා

සේයා - සුරන් ද සිල්වා

## ජුබිලියට සමගාමිව අපේ කොරටුව බටගමදී

බටගම සා. අන්තෝනි දෙව්මැඳුරේ 125 ජුබිලි වසරට සමගාමීව අපේ කොරටුව දේශීය ගෙවතු වගා ප්‍රදර්ශනයක් නොවැ. 15, 16, 17 දිනවලදී බටගම හර්මන් ස්ටූවට් ශාලාවේදී පැවැත්වේ. දේශීය වී වර්ග දැක බලා ගැනීමටත් සහල් වර්ග මිලදී ගැනීමටත් මෙහිදී හැකිය.



කටාන දිසා සා. වි. පාවුලා සමිති ඥානකාන්තිය කළුවාරිප්පුව දේවස්ථානයේදී පසුගියදා කටාන දිසා සා. වි. පා. අධ්‍යක්ෂ ගරු ඇන්ටන් රංජිත් පියතුමාගේ සහභාගිත්වයෙන් පැවැත්වුනි. එදින ඥානකාන්තිය මෙහෙයවීම සඳහා සහභාගි වූයේ ගරු ජයන්ත ප්‍රනාන්දු (පැ.තු.නි) පියතුමාය.

ඩබ්. ජී. සුනිල් ප්‍රනාන්දු

# අගරදගුරු හිමිපාණෝ උතුරු අධිවේගී මාර්ගය පිළිබඳ පැන නැඟි ඇති ප්‍රශ්නයට ජනතාව වෙනුවෙන් සිටිති

පාරවල් හැදීම අවශ්‍ය බව අප පිළිගන්නවා. ජන ජීවිතය අවුල් කර, පවුල් පරිසරය, සංස්කෘතික සබඳතා, සම්ප්‍රදායන් කඩා බිඳ දමා, පාරවල් හදන්න අවශ්‍යද? ජනාකීර්ණ ප්‍රදේශ හරහා ජනතාවට ප්‍රශ්න ඇති කර මේ ක්‍රමයට පාරවල් හදන එකට පෞද්ගලිකව මා විරුද්ධයි.

කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් මෙසේ අවධාරණය කළේ, රාගම ශු. පේදුරු හා පාවුළු මුනිවරුන්ගේ දෙව්මැඳුරේ, දහම් පාසල් ශාලාවේ පැවැති, උතුරු අධිවේගී මාර්ගය සම්බන්ධව රාගම, බුළුගහගොඩ, ගනේමුල්ල, ගලහිටියාව ආදී ප්‍රදේශවල ජනතාවට පැන නැඟී ඇති ප්‍රශ්නයට ජනතාව වෙනුවෙන් පෙනී සිටීමේ ජනහමුවක දීය. ජා-ඇල කලාපීය නාහිමි අතිග රු ශාන්ති කුමාර් වැලිවිට පියතුමන්, රාගම මීසම් සේවක ගරු ජූඩ් ලක්ෂ්මන් හා තිබ්බොටුගොඩ මීසම් සේවක ගරු රංජිත් ටෙරී යන පියවරුන් විසින් සංවිධානය කර තිබුණි. මේ ව්‍යාපෘතියට අදාළ රජයේ නිලධාරීන් රැ සක් මීට සහභාගී වූහ. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිෂ්ටාපන කටයුතු භාර මහාචාර්ය කේ. කරුණාතිලක මහතා අදාල කටයුතු පිළිබඳ පැහැදිලි විස්තරයක් කළ අතර යෝජිත රාගම බුළුගහගොඩ මං තීරුව තවම තීරණය වී නොමැති බවත්, තොරතුරු රැ ස්කරන කණ්ඩායම අත්වැරැද්දකින් වල්පොල කපුවවැව දක්වා තොරතුරු රැස් කර තිබීම ගැන සැමට කනගාටුව ප්‍රකාශ කරන බවත් පැවසීය.



සී. ආර්. ඩික්සන් ඇන්ටනි

ඥානාර්ථ ප්‍රදීපය
ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com
ක්‍රිස්තු වර්ෂ 2013 නොවැම්බර් 17 ඉරිදා

# පිලිපීනයේ ඛේදවාචකය හා සුනාමි අපේ අතීත කථාව

මධ්‍යම පිලිපීනය හරහා හමා ගිය 'හයියාන්' සුළි කුණාටුව අද මුළු මහත් පිලිපීනයම මළ ගමක් බවට පත් කර ඇත. ටක්ලොබාන් ප්‍රදේශය සම්පූර්ණයෙන්ම විනාශ කරමින්, ජන ජීවිතය අඩාල කරමින් දස දහසකට අධික පිරිසකට මරණය කැඳවමින්, තවත් මිලියන නවයකට උන් හැටි තැන් අහිමි කොට ඇඳිවත පමණක් ඉතිරි කරමින් හමා ගිය මේ සුළි කුණාටුව මෑත භාගයේ සමාන කළ හැක්කේ 2004 දකුණු ආසියාවට බලපෑ සුනාමියට පමණක් බව කාල ගුණ නිරීක්ෂකයන්ගේ මතයයි. පැයට කි. මී. 195 වේගයෙන් හමා ගිය එම චණ්ඩ මාරුතය මේ වන විට තවත් රටවල් කිහිපයකට බලපා ඇතැයිද ලෝක ජනමාධ්‍ය වාර්තා කරයි.

2004 දකුණු ආසියාවට බල පෑ සුනාමි ඛේදවාචකය පිළිබඳව ලෝක ජන මතය සංවේදී කරන්නට මූලික ලෙස කටයුතු කළ සී. එන්. එන්, බී.බී.සී, අල් ජසීරා, ප්‍රාන්ස් 24 වැනි ප්‍රධාන පෙලේ ජාත්‍යන්තර රූපවාහිනී නාලිකා මෙවරත් පිලිපීනයට එල්ල වූ මේ චණ්ඩ මාරුතයේ පසු සිදු වීම් පුන පුනා වාර්තා කරන්නට පෙරට ආවේ ජන හදවත් සංවේදී කොට ඔවුනගේ සැබෑ උණුවුන හදවත් ඒ ජනතාව වෙනුවෙන් යොමු කිරීමටමයි. එය සිදුවිය යුත්තක් මයි. එය අඛණ්ඩව සිදුවිය යුත්තක්මයි.

ස්වභාවික ආපදාවකදී අසරණ වන ජනතාවට මූලික වශයෙන්ම මුහුණ දෙන්නට සිදුවන්නේ පිරිසිදු පානීය ජලය හා ආහාර ප්‍රශ්නයටයි. නවාතැන් හා ඇඳුම් පැළඳුම් ප්‍රශ්නය ද ඒ අතර වේ. සම්පූර්ණයෙන්ම අසරණ වන ජනතාවකට මේ දේවල් ලබාගැනීම ඉතා දුෂ්කරයි. මේ අත්දැකීමට අප රටේ ජනතාවද 2004 දී මුහුණ දුනි. ජාත්‍යන්තර සහය අවශ්‍යවන්නේ මේ මොහොතේදියි. ජාත්‍යන්තර අවධානය යොමු විය යුත්තේ මේ අවස්ථාවේදීයි. අන් රටවල් වල ජනතාවගේ හදවත් උණුවිය යුත්තේ මේ හෝරාවේදියි.

ක්‍රිස්තියානි සංකල්පය ජීවත් කරවන රටවල් බොහෝ සෙයින් මෙවන් ආපදා වලදී ඉදිරියට පැමිණෙන්නේ 'අසල්වැසියා වෙනුවෙන් කැපවන්න' යන ඒ කිතුනු ආකල්පය ජීවිත වල ආත්ම ගත වී ඇති බැවින්මයි. මෙය කිසිවෙකුට නිෂේධනය කළ නොහැකියි. 2004 සුනාමි ඛේදවාචකයේදී බටහිර රටවල ජනතාව අතරින් කුඩා දරුවන් පවා උදව් කිරීමට ඉදිරියට ආවේ ඒ දැක්ම ජීවිත තුළ නිදන්ගත වී ඇති නිසා බව පැහැදිලි වූයේ දේවස්ථාන මූලිකව සියළු ආධාර ශ්‍රී ලංකාව වෙනුවෙන් ලබාදීමට ඔවුන් කටයුතු කළ බැවින්මයි. 'මට' වඩා 'අන් අය' ගැන සිතන ධර්මයක් ලෙස කිතුනු ආගම නම් දරා ඇති නිසා ජනතාව බලපෑමකින් තොරව ආපදා වලදී උදව් කිරිමට පෙළ ගැසීම අරුමයක් නොවේ.

ඒ අනුව යමින් පිලිපීනයේ 'හයියාන්' සුළි කුණාටුව නිසා විපත් පත් ඒ ජනතාව වෙනුවෙන් නැවතත් බටහිර රටවල උදව් උපකාර බොහෝ සෙයින් පිලිපීනයට ලැබෙන බව ජාත්‍යන්තර මාධ්‍ය ප්‍රකාශ කරයි. බටහිර රටවල කුඩා දරුවන් පවා ඉතා කම්පනයට පත්ව තම කෑම වේල් පවා පරිත්‍යාග කරමින් ඉතිරි කරන මුදල් පිලිපීනයේ ජනතාව වෙනුවෙන් ලබාදීමට ඉදිරිපත් වී සිටියි.

2004 දී සුනාමි ඛේදවාචකයේදී ශ්‍රී ලංකාවට සිදුවූ සියළු අනතුරු වෙනුවෙන් අන් රටවල හදවත් උණුවී ඒ නිසාම දිගු කළ අසරණ සරණ දෑත් නිසා අප රටක් වශයෙන් නැවතත් ගොඩනැගුනෙමු. රෝහල්, නිවාස ගොඩනැගුවෙමු. ආහාර පාන මහත් සේ බෙදා ගත්තෙමු. ඇඳුම් පැළඳුම් බෙදා ගත්තෙමු, සුනාමි අරමුදල් බොහෝ සෙයින් ගොඩනැංවූවෙමු.

එහෙත් පිලිපීනයේ ඛේදවාදකයේදී අපේ ප්‍රතිචාරය කුමක් වීද? අපේ ජාතික මාධ්‍ය පවා ඒ ගැන නිහඬ වීද? ජනතාව එය තවත් සිදුවීමක් සේ අසා සැනෙකින් එය අමතක කරදැමුවාද? ජාතික වශයෙන් අපට පුළුල් වැඩ පිළිවෙලක් ඒ වෙනුවෙන් නොතිබීද? ආසියාවේ අපේ කලාපයේ සහෝදර රටක, කතෝලික එකම රටේ ඛේදවාචකයකදී අපේ ප්‍රතිචාරය ඒ තරමටම හීන වුයේ ඇයි?

# භාග්‍යවන්ත සමාජයක් ආදරණීය වෙනසක්

වි. ලෙ. පීරිස්

අප සැමදෙනාම ජීවිත ගංගාවේ අර්ථය සොයා වන්දනාවෙ යෙදෙන සොඳුරු යාත්‍රිකයන් විය යුතුය. නමුත් අද බහුතරයකගේ ජීවිත අර්ථවත් පරිපූර්ණ ජීවිත බවට පත්කර ගන්න වන්දනාවෙ යෙදෙනවා වෙනුවට සිදුවී ඇත්තෙ වෙළෙඳපොළ ආර්ථිකයෙන් මෙහෙය වනු ලබන වෙනත් වන්දනා ගමනක යෙදෙන්නටය. මෙම වන්දනා ගමනෙ මාලිමාව වෙළෙඳපොළ ප්‍රචාරණයයි. එදා පල්ලියෙන් පන්සලෙන් අපේ ජීවිත ගමනෙ මාර්ග සිතියම නිර්මාණය කර දුන් නිසා අපේ ජීවිත ගමන නිශ්චිත දිසාවකට යොමුකර ගන්නට හැකිවුනා. අද අපේ ජීවිත ගමනට අර්ථය සපයන්නෙ වෙළෙඳපොළයි. කන්නෙ බොන්නෙ, අධ්‍යාපනය ලබන්නෙ, රසස්වාදනය ලබන්නෙ, සැපත සොයන්නෙ වෙලෙඳපොළේ මඟපෙන්වීම අනුවය. මේ නිසා අද වෙළෙඳපොළ අලුත් 'ආගමක්' බවට පත්වී ඇත.

## මහ සමාජ ක්‍රියාකාරිත්වය

වෙළෙඳපොළේ ආධිපත්‍ය පතුරුවන විවෘත ආර්ථිකය හඳුන්වාදීමේදී ආචාරාත්මක පදනමක් මත සිදු නොවූ නිසා, ධනයට, වස්තුවට ආකර්ෂණය වු සමාජයක් ගොඩනැගුන අතර, ආගමේ මූලික හරයන් යටපත් කරමින්, එහි පිට ඔපයට නතුවීම අපට දැකිය හැක.

"මම ඔබට ප්‍රඥාවෙ මග පෙන්වමි" යන ආදර්ශ පාඨයෙන් සිසු සිසුවියන් මෙහෙයවූ පාසල් අධ්‍යාපනයේ, අද ආදර්ශ පාඨය වී ඇත්තෙ "මම ඔබට වෙළෙඳ පොලේ මග පෙන්වමි" යනුවෙන්ය. එනම් මමායනයෙන් පිරුණු, පරාර්ථයට වඩා ආත්මලාභයද, සාමුහිකත්වය වෙනුවට අනර්ථකාරි තරගයක යෙදෙන උගතුන් බිහිකිරීම අද සිදුවෙමින් පවති. වෙළෙඳපොළ. ජන ජීවිතය සැම අංශයක්ම ආක්‍රමණය කරමින් සියළුම ආගම්වලට තර්ජනයක් වෙමින් පවතින බව අප තේරුම් ගත යුතුය. අද සියලු ආගම් මුහුණ දී තිබෙන්නෙ "වෙළඳපොල' නමැති මෙම අලුත් ආගමෙන්, විනාශවී යන ජනතාව ආධ්‍යාත්මය බේරා ගැනීමේ අභියෝගයටය. ඒ සඳහා ගතානුගතික ආගම් ප්‍රචාර ධර්මදූත සේවාවන් ඉක්මවන බලකැවුණු මහා සමාජ ක්‍රියාකාරිත්වයක් සියලුම ආගම් වලින් සිද්ධ විය යුතුය. මේ සඳහා ආගම් අතර ඒකාත්මික බවක් ගොඩනගා ගත යුතු නමුත් අපට අත්විඳින්නට සිදුවී ඇත්තෙ "ආගමික ගැටුම්ය" කිතුනුවන් වන අපේ කිතුනු සභාවන් අතර පවා 'ජේසුව' බෙදා ගැනීමට කරන තරගය කොතරම් අවාදර්ශයක්ද? එය කොතරම් දුරට ගොස් තිබේද?

## මූලධර්මවාදය පිටුදැකීම

කිතුනු මූලධර්මවාදය ප්‍රචලිත කරන ලද්දෙ විවෘත අර්ථයට එරෙහි පැන නැගුන කිතුනු විමුක්ති දේව ධර්ම ක්‍රියාකාරිත්වය දුර්වල කිරීමටය. සමාජ විමුක්තිය අතහරිමින් පුද්ගලානුබද්ධ විමුක්තිය කෙරෙහි අවධාරණය කරන මූලධර්මවාදි කිතුනු යයි කියා ගන්නා සභාවන් සේවය කරනුයේ දැනුවත්ව හෝ නොදැනුවත්ව ලෝකය පුරා ධනවතුන් වඩා ධනවත් කරන, දිළිඳුන් වඩාත් දිළිඳුකරන පාපිෂ්ඨ වෙළෙඳපොල ආර්ථිකයටය. මූලධර්මවාදී සභාවන් හුදකලා කරනු ලබන විරෝධය සැබැවින්ම රෝග නිධානය නොසොයා රෝග ලක්ෂණවලට බෙත් හේත් කිරීමක්ය. මූලධර්මවාදය අද අනෙකුත් ආගම් වලටද බෝවී ඇත. මෙයද වෙළෙඳ පොළ ආර්ථිකය අදිසි හස්තයෙන් මෙහෙයවනු ලබන බව අප වටහාගත යුතුය. මූලධර්මවාදය පිටුදැකීමට රෝග නිධානය වන විවෘත ආර්ථිකය වෙළෙඳ පොළ නමැති අලුත් 'ආගමට' එරෙහි සියලුම ආගම් එක්විය යුතුය. මේ සඳහා අලුත් 'ආගමෙන්' විනාශ කරනු ලබන ජනතාවගෙ ආධ්‍යාත්මය සුවපත් කිරීමට නම් 'ආගම් ප්‍රචාර ධර්මදූත සේවාවන් ඉක්මවන බලකැවුන මහා සමාජ ක්‍රියාකාරිත්වයකට මුලපිරවිය යුතුය. මේ සඳහා යා යුතු මග ආචාර්ය අදිකාරම් මෙසේ පෙන්වාදෙයි. "මට යාමට ගමනක් ඇත. එය සඳමතට නොව හදවතටය" සියලුම ආගම් එක්ව මිනිස් හදවත් සුවපත් කළ යුතුය. අද ආගමික ආයතනවල 'හදවත්' පවා රෝගිවී ඇත. මෙම සන්දර්භය තුළ මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ පවසන්නේ "අද අපට අවශ්‍යවී ඇත්තේ ආදරණීය වෙනසක්. සමාජයෙ පවතින ගැටලුවලට ඇති එකම පිළියම නම් මිනිසා තුළ සෙනෙහස වර්ධනය කිරීමය."

## භාග්‍යවන්ත සමාජයක්

"ජීවිතයට වැදගත්වන්නේ ස්නේහයයි (සෙනහසයි). ස්නේහය සිඳී ගියවිට ජීවිත ගමනද අක්‍රිය වෙයි. සත්‍ය වු ස්නේහය යම් තැනක පවතියිද එතැන ගැටලුවලට තැනක් නැහැ. ඔවුනොවුන් කෙරෙහි ස්නේහයෙන් සැදුන යම් සමාජයක් වේ නම් ඒ සමාජය භාග්‍යවන්තවේ" යයි මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ අවධාරණය කරයි. සෙනෙහස අත්විඳින සමාජයක ගොඩනැගෙන්නේ බදාගෙන කන සමාජයක් නොව බෙදා හදා ගන්න සමාජයක්. මෙවන් සමාජයක් තුළ ගොඩ නැගෙන්නේ 'නව මිනිසෙක්ය' වඩාත් සාධාරණ සමාජයක් කියුබාවෙ ගොඩනගා ගැනීමේද චේගුවේරා පැතු 'නව මිනිසා' පිලිබඳ සංකල්පය මෙහිදී අපට වැදගත්වේ.

"සමාජ පරිසරය තුළ තනියම හුදකලාව කරනු ලබන ක්‍රියාකාරිත්වය හුදු ආත්මාර්ථය සඳහා කරනු ලබන්නකි. මෙම ආත්මාර්ථය සඳහා කරනු ලබන මෙවැනි ක්‍රියාකාරිත්වයන් කියුබාවෙන් තුරන් විය යුතුය. හෙට දවසේ පුද්ගලාර්ථය විය යුත්තෙ ප්‍රජාවෙ යහපතම සඳහා වූ සමස්ත පුද්ගලයාම සම්පූර්ණයෙන්ම වැයවීමයි." සෙනෙහස නමැති තෛලයෙන් ක්‍රියාත්මක කරනු ලබන සමාජයක් ගොඩනැගීමෙ වගකීම පැවරෙනුයෙ සැම ආගමකම ඇති සමාජ විමුක්ති ධර්මය සමාජගත කරවීමට බැඳී තිබෙන සමාජ විමුක්ති ධර්මය කෙරෙහි විශ්වාසය තබන ආගමික නායකත්වයටය. ධාර්මික පදනමක් මත සමාජ විමුක්තිය සඳහා වැයවෙන, කැපවෙන පූජක ගිහි මූලිකයන් රැක ගැනීම සම්ප්‍රදායික ආගමික ආයතන ප්‍රධානින්ගෙ වගකීමකි. එය පැහැර හැරීම අධර්මිෂ්ඨ සමාජයට පාරකැපීමක් වනු ඇත. වැයවීම පිළිබඳව ජෝජ් බර්නාඩ් ෂෝ මෙසේ පවසයි. "මගේ මතය අනුව නම් මා අයිති සමස්ත ප්‍රජාවටය. මා මෙම ප්‍රජාව තුළ ජීවත්වන විට මා ලබා ඇති වරප්‍රසාදය නම් මෙම ප්‍රජාවට මට කළ හැකිදේ ප්‍රශස්ථ ලෙස කිරීමය. මං අභාවයට පත්වන විට මේ ප්‍රජාව වෙනුවෙන් මා සම්පූර්ණයෙන්ම වැයවී තිබිය යුතුය. මම වඩ වඩාත් වෙහෙසවී වැඩකරන විට වඩ වඩාත් ජීවිතයෙන් ප්‍රමෝදමත් වෙමි." මට ජීවිතය කෙටි ඉටිපහනක් නොව, මට මගේ ජීවිතය දැනට දරාගෙන තිබෙන පහන් සිළුවකි. එය ඉතා උත්කර්ෂවත් පහන් සිළුවකි. මට වුවමනා වී ඇත්තෙ මෙය අනාගත පරපුරට බාර දෙන තෙක් දීප්තිමත්ව දල්වා තබාගැනීමය.

කිතුනුවන් වන අපේ පරමාදර්ශය වන ජේසු තුමා තම ජීවිතය නමැති පහන් සිළුව දරාගෙන අපට බාර දී ඇත. සමාජය තුළ එම පහන් සිළුව දරාගෙන කිතුනු සභාවක් ලෙස ඉදිරියට ගෙන යැමට අප බැඳී ඇත. ජේසු තුමාගෙ කුරුසගත මරණයෙන් පසුවත්, එම පහන් සිළුව අදත් නොනිමි පවති. වෙලෙඳ පොළ ආර්ථිකයෙන් පීඩා විඳින සමාජය වෙනුවට සෙනෙහස නමැති තෛලයෙන් ක්‍රියාත්මක වන භාග්‍යවන්ත සමාජයක් ගොඩනැගීමට ආත්මාර්ථයෙන් මිදුන තම ජීවිත සමස්ත ප්‍රජාව වෙනුවෙන් වැයකරන සමාජිකයන්ගෙන් යුත් කිතුනු සභාවක් ලෙස අපි ආදරණීය වෙනසකට කැපවෙමු.



මීසමෙන් මීසමට

# විශ්වාසයේ වසරේදී නොබිඳෙන විශ්වාසයෙන් සවිමත් වෙමු

## බදුල්ල රදගුරු හිමිපාණෝ ආරාධනා කරති

**මේ විශ්වාසයේ වසරේ අපට විශ්වාසය ඇතිකර ගනිමින් එම විශ්වාසය තුළ නැසීගිය අය සමග උන්වහන්සේ සමග සම්බන්ධතාවය ඇතිකර ගනිමු. සමහරු ජීවත්වෙන්නේ සදහටම ජීවත්වන බලාපොරොත්තු වෙනි. නමුත් අපගේ ආත්මය පමණයි අමරණීය වන්නේ" බදුල්ල රදගුරු අතිඋතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි හිමිපාණෝ පැවසූහ.**

උන්වහන්සේ එසේ පැවසුවේ මළවුන්ගේ මංගල්ලයෙ දේව මෙහෙය බදුල්ල පොදු සුසාන භූමියේ පවත්වමිනි.

ගරු සැම් පෙරේරා පියනම මීසම්පතිව සිටි කාලයේ වර්තමාන නගරාධිපති සමග එක්ව ඉදිකළ සුසානභූමියේ දෙව්මැඳුර තුළ මෙම දේව මෙහෙය පැවැත්විය.

ශ්‍රීකාන්ති ගුණවර්ධන



එඬේරමුල්ල ශු. සෙබස්තියන් මුනිඳුන්ගේ දේවස්ථානයේ දහම් පාසල් දරුවන්ගේ සුබ සාධනය උදෙසා වාර්ෂිකව පවත්වනු ලබන රථවාහන සේදීම මෙවරත් දහම් පාසල් දෙමව්පිය සංගමය, දහම් පාසල් ගුරු මණ්ඩලය හා මීසම් සේවක පියතුමන්ගේ එකමුතුවෙන් පවත්වන ලදි. එහිදි මීසම් සේවක ගරු ප්‍රසන්න රෝහාන් සහ එඬේරමුල්ල සා. ජෝශප් විදුහලේ උප විදුහල්පති එඬේරමුල්ල මීසමේ නේවාසික ගරු කමල් පියතුමන්ද, ආරම්භක අවස්ථාවට සහභාගි විය.

සම්පත්

## ගල්වැටිය මංගල උලෙළ 127 වන වරට

වත්තල ගල්වැටියේ ශු. ජපමාල රාජේශ්වරියගේ දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය පසුගියදා උත්සවාකාරයෙන් පවත්වන ලදි.

සූදානම් වීමේ නුවාන ගරු නිශාන්ත කුරේ පියතුමා මෙහෙය වූ අතර, ගරු ප්‍රසන්න ක්‍රිස්ටෝපර් පියතුමාගේ ප්‍රධානත්වයෙන් සන්ධ්‍යා මෙහෙය ද මංගල දිව්‍ය යාගය මීසම් පුතු කුරුණෑගල පදවියේ ගරු ප්‍රසන්න අමරසේකර පියතුමාගේ ප්‍රධානත්වයෙන්ද පවත්වන ලදි.

මංගල කටයුතු වත්තල මීසම් සේවක ගරු බැසිල් වික්‍රමසිංහ සහ සහයක ගරු ක්‍රිෂාන් ජයශාන්ත පියතුමන්ගේ මඟපෙන්වීම යටතේ ශු. ජපමාල රාජේශ්වරියගේ සංගමයේ සභාපති ස්ටැන්ලි ඩයස් මහතා ඇතුළු විධායක කමිටුව මගින් සංවිධානය කරන ලදි.

ක්ලැරන්ස් ලෙනාඩ්

## සදහම් සජීවක වැඩසටහන වැලිවිටදී

කොළඹ අගරදගුරු පදවිය මගින් ගරු සිසිල් ජෝයි පියතුමා විසින් මෙහෙයවනු ලබන වැඩමුළුව වැලිවිට මීසම් සේවක ගරු අර්නස්ට් මෙල් පියතුමාගේ ඉල්ලීම මත පසුගියදා වැලිවිට උත්පත්ති දේවමාතා දෙව්මැඳුරේදී පවත්වනු ලැබීය.

සුසිල් හැරිසන්



නුවරඑළිය මීසමේ සා. වින්සෙන්තිද පාවුලා සංගමය මගින් පස්වන වරටත් 'වැඩිහිටි දිනය' ඉතා උත්සවාකාරයෙන් පැවැත්වින. මීසම් සේවක ගරු නීරියෝ ඒබ්‍රහම් පියතුමන් විසින් දිව්‍ය යාගය සිදුකරන ලදි. නාසරෙත් ආයතනයේ ගරු නොයෙල් සහෝදර තුමන්ද මීට සහභාගි විය. මෙදින පැරණි සාමාජිකාවන් හට සමරු තිළිණ ද අනෙක් වැඩිහිටියන්හට තිළිනද පිරිනැමින. මෙම උත්සවය සාර්ථක කර ගැනීමට සභාපති ඇන්තනි කෲස් ලේකම් ශර්ලි මැක් හා භාණ්ඩාගාරික පර්ලි මහත්ම මහත්මින් ගේ දැඩි කැපවීම හේතුවිය.

ජේ. ඒ. බානබස්

## රාජකදළුව දෙව්මැඳුර අභිනවයෙන් ඉදිවේ

රාජකදළුව ශුද්ධ වූ පවුලේ මීසම් ජනතාව දේවස්ථානය අභිනවයෙන් ඉදිකිරීම සඳහා, මීසම් සේවක ගරු චමින්ද ප්‍රසාද් සහ සහයක ගරු රනිල් සඳරුවන් පියතුමන් සමග එක්ව එකමුතුව මහත් වෙහෙසක් දරති.

තම දායක මණ්ඩලය සහ ගොඩනැගිලි කමිටුව පියතුමන් සමග එක්ව විවිධ ක්‍රම මගින් ආධාර උපකාර සොයමින් වෙහෙසෙන අතර දැනටමත් කොට්ඨාශ මට්ටමින් වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කර ඇත.

ක්‍රිස්ටෝපර් ජාන්ස



උස්වැටකෙයියාව දෙව්මැඳුර භූමියේ පැවති වැඩිහිටි දින උත්සවය ඇරඹීම පිණිස උස්වැටකෙයියාව මීසම සේවක ගරු අයිවන් පීටර්ස් පියතුමා පමුණුගම පොලිස් ස්ථානාධිපති සුරේෂ්ද සිල්වා හා වැඩිහිටි බල මණ්ඩල සභාපති ඇන්ටනි ජයමහ යන මහතුන් සමග කොඩි එසවූ අයුරුයි මේ.

එස්. කේ. ජේ. කුරේරා

## දහම් පාසල් ගොඩනැගිල්ල පිළිසකරට මන්ත්‍රීගෙන් අරමුදල්

රාගම මීසම් සේවක ගරු ජූඩ් ලක්ෂ්මන් පියතුමන්ගේ ඉල්ලීම පරිදි රාගම, ලෙන්චියාවත්ත ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුරේ, දහම් පාසල් ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම සඳහා, පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතාගේ විමධ්‍යගත අරමුදලින් රු. 97000/= ක (අනුහත්දාහක) මුදලක් වෙන් කර ඇත.

එම ව්‍යාපෘතිය සාර්ථකව නිමකර ගැනීම සඳහා බස්නාහිර පළාත් සභා මන්ත්‍රී ශ්‍රීනාත් පෙරේරා මහතා සම්බන්ධීකරණ කටයුතු කරන බව ජෝශප් මයිකල් පෙරේරා මහතා පවසයි.

සී. ආර්. ඩික්සන් ඇන්ටනි

## හල්කඳවිල සා. ජූඩ් මුනි දෙව්මැඳුර




කළුතර යටදොළ මාර්ගේ 16 වන කි.මීටරයේ පිහිටි හල්කඳවිල 1940 දී සා. තෙරේසා මුනිවරිය නමින් දෙව්මැඳුරක් ඉදිවිය. හල්කඳවිල වලව්වේ විසූ දානපතියකු වූ ජෝන් ගෝමස් වින්සන් ජයවර්ධන මුදලිතුමන් අක්කර එකහමාරක බිම් ප්‍රමාණයක් සභාවට පවරා දුනි. මග්ගොන මීසම් සේවක ගරු ඒ දොන් වින්සන් පියතුමන්ගේ මඟපෙන්වීම මත මහ මාර්ගය මායිම්වන පරිදි කළුගල් අත්තිවාරමක් මත ගොඩනගී. පළමු දෙව්මැඳුරේ බිත්ති මැට්ටෙන් හා කබොක් ගලෙන් සවිමත් වූ අතර වහලය සෙවිලිව තිබුනේ පොල්අතුවලිනි. එම දෙව්මැඳුරේ පළමු මංගල පූජාව ජයවර්ධන මුදලිතුමාගේ ඥාතීන් හා මග්ගොන හා පයාගල පදිංචි කිතු බැතිමතුන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විණ.

මුදලිතුමන්ගේ දෙව්මැඳුරු සිහිනය සැබෑ වුවද, එතුමන්ගේ මරණින් පසුව, කිසිදු කිතුනු පවුලක් හල්කඳවිල නොසිටියෙන් දෙව්මැඳුර ගරාවැටී පරිහානියට පත්විය. මෙසේ තිබියදී මග්ගොන මීසමෙන් හල්කඳවිල මතුගම මීසමට 1958 දී එක්කැරිණ, මීසම් සේවක ගරු හැරී ප්‍රනාන්දු පියතුමා දෙව්මැඳුර පිළිසකර කර, නව අල්තාරයකින් ඔපවත්කර, මුදලිතුමන්ගේ ලේලියකවන ඔලිවියා ජයවර්ධන මැතිනියගේ සහයෝගය ඇතිව, එය සා. ජූඩ් මුනිතුමන් නමට කැපකර කොළඹ අගරදගුරු අතිඋතුම් තෝමස් කුරේ හිමිපාණන් අතින් ආසිරි ගන්වා විවෘත කළේය. ජූඩ් මුනිඳුන් නමින් පළමු මංගල්ලය පැවතියේ 1960 ඔක්තෝබර් 28 දාය.

හල්කඳවිල දියලගොඩ මීසමට එක්වූයේ 2000 දීය. ගරු වික්‍රම පොන්සේකා පළමු බ්‍රහස්පතින්දා උදේ 9 ට හා සවස 5 ට පූජා දෙකකුත් පැවැත්වීම හේතුකොට අවට ගම්මාන වලින්ද ජූඩ් මුනිඳුන් සරණ පතන සැදැහැවතුන් වැඩිවිය. ගරු කිරුල් ජයනාත් පියතුමන්ගේ හා වර්තමාන මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ මඟපෙන්වීම මත හල්කඳවිල දෙව්මැඳුර ප්‍රගතියක් ලබා ඇත.

සුනාමි ව්‍යසනයෙන් පසුව, මුහුදු බඩ තීරයේ කිතුනු ජනතාව රට තුළට ඇදීඒම හේතුකොට, ජූඩ් පියගම, මොනාකෝගම හා ජනසෙතගම වැනි ගම්මාන බිහිවූ අතර, හල්කඳවිල කිතුනු සංසය පවුල් 280 දක්වා වර්ධනය වී ඇත. ළමුන් 200 කින් යුතු දහම් පාසලක් ද, විසෙන්ති පාවුලා සමිතිය, තරුණ සමිතිය ආදියෙන් හල්කඳවිල කිතුනු ගම්මානය පිබිදී ඇත. වර්තමාන අවශ්‍යතාවයට අනුව වඩා විශාල දෙව්මැඳුරක් තැනීමේ වැඩකටයුතු දැන් ආරම්භකර ඇත. මෙහි බිම් මහලයේ වැඩ කටයුතු නිමවෙමින් පවතී. මෙහි සම්පූර්ණ ශ්‍රම දායකත්ය ගම්වාසි කිතුනුවන්ගෙන්වීම කැපී පෙනේ. මේ සඳහා ආධාර උපකාර කරන්නැයි දියලගොඩ මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමෝ ආයාචනය කරති.

දියලගොඩ
සැම්සන් සී. ඒකානායක

## අපගේ ජීවිතය ගොඩනගන තෝතැන්න පාසලයි

ලෝකයට දෙන්න පුළුවන් ලොකුම දේ අම්මාගෙ ආදරයයි. එය අමතක කරන්න බැහැ. ආදරය අවශ්‍යයි. ඕනෑම දහමක් හඳුන්වා දුන් නිර්මාතෘවරුන් කළේ බුද්ධියත් හදවතත් සැනසීමයි. පාසලෙන් බුද්ධිය, ඥානය ගොඩනැගෙනවා ගුණනුවණින් දැනුමෙන් උත්තරීතර සේවාව කරන ගුරුවරුන්ට දරුවන් ගෞරව කළ යුතුයි. ස්තුති කළ යුතුයි. අපේ ජීවිතය ගොඩනගන තෝතැන්න පාසලයි. එහි ගුරුවරුන් වැදගත්. ගොඩනැගිලි තිබුනට මදි යැයි මොරටුව මීසම් සේවක ගරු බර්ට්‍රම් රංජිත් පියතුමා පසුගියදා මොරටුව සාන්ත සෙබස්තියන් බාලිකා විදුහලේ විදුහල්පතිනි චන්ද්‍රා වික්‍රමසිංහ මහත්මියගේ ගුරු වෘත්තියට වසර 25 ක් සපිරීම, ළමා දිනය හා ගුරු දිනය වෙනුවෙන් එම විදුහල් භූමියේ පැවැත්වූ දිව්‍ය පූජා යාගයේ දේශනයේදී පැවසීය.



විදුහල්පතිනියගේ 25 වසරක සේවයට තුති පිදිණි. සියලුම ගුරු මැණිවරු එදින ගුරු ප්‍රතිඥාදීමත් සිසුදැරියන්ගේ ගුරු උපහරයත් සිදුවිය.

ඩොරින් පෙරේරා

## තලාහේන මංගල්ලය හා සත්ප්‍රසාද උලෙළ

විවිධ අවස්ථාවන් වලදී දේවමාතාවන් දර්ශණය වෙමින් පැවසුවේ මනස්ථාපනය වන්න, යාච්ඤා කරන්න, ජපමාලය උච්චාරණය කරන්න කියායි. එතුමිය එසේ කළේ මුළු මිනිස් සංහතිය දෙවියන් වහන්සේ වෙතට ඔසවා ලන්නට යැයි ගරු ජයන්ත වික්‍රමසිංහ පියතුමා තලාහේන පාතිමා දේවස්ථාන වාර්ෂික මංගල දේව මෙහෙයේදී පැවසීය.

පෙරදින සන්ධ්‍යා මෙහෙය හා දිව්‍ය සත්ප්‍රසාද මෙහෙය මහවීදිය මීසම් සේවක ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු පියතුමා සිදුකළ අතර දිව්‍ය සත්ප්‍රසාද පෙරහර දේවස්ථානය වටා ගමන් කළේය. මංගල්‍ය කටයුතු ගරු ප්‍රදීප් චමින්ද පියතුමා සමග මීසම් ධර්මසේවා සභාව විසින් සංවිධානය කරන ලදි.

සෙබස්තියන් පෙරේරා

## ජනවන්දනාව පිළිබඳ වීඩියෝ පටයක්!

දිව්‍ය පූජා යාගයන්හිදි සිදුවිය යුතු ජන වන්දනා වත් පිළිවෙත් පිළිබඳ වීඩියෝ පටයක් නිපදවීමට වෙන්නප්පුව මීසම් සේවක ගරු එරික් සී. ප්‍රනාන්දු පියතුමා කටයුතු සූදානම් කොට ඇත. වඩාත් අර්ථවත්වූත්, නිවැරදි වූත්, ජන වන්දනාව පිළිබඳව ආදර්ශයක් සැපයීම මෙහි අරමුණ බව ¸ මෙම ගරු පියතුමා පවසයි. ඒ පිළිබඳ රූපගත කිරීම් පසුගියදා වෙන්නප්පුව ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේදී සිදුවිය.

ප්‍රියන්ත පීටර්ස්



මළවුන්ගේ මංගල්‍ය දේව මෙහෙය රත්නපුර පොදු සුසාන භූමියේ මග්ගොන නිමල මරිය නිකායේ ගරු අජිත් පෙරේරා නි.ම.නි පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවත්විණ. රත්නපුර මීසම් සේවක ගරු රන්ජන් මාල් මොරායස් පියතුමා ද මෙහි සිටී.

තියබෝල්ඩ් සමරතුංග

# "මරිය වසර" පිළිගන්නට සැදැහැ සිතින් පෙළ ගැසෙමු

## මරියෝත්තමාවිය - දේව ආදරයේ ප්‍රතිරූපය

**පසුගිය සතිය හා සබැඳේ**

මෙහිදී සමූහයා අතරින් එක් ස්ත්‍රියක් කරන ප්‍රකාශනයක් ස්වාමින් වහන්සේ ස්ථිර කරන සේක. ඒ තුළ මරියෝත්තමාවන් ඇත්තෙන්ම භාග්‍යවන්ත තැනැත්තියක් බව සනාථ කෙරේ. දේව වචනය අසා එය පිළිපදින්නටත් මේ ස්වර්ගික මාවතේ මරිය මවුන් අනුගාමී වෙන්නටත් අප ලබන වටිනා ඇරියුමක් නොවේද මේ වචන, මේ අදහස් පුරාණ ගිවිසුමේ "සමිඳාණන් වහන්සේගේ සේවකයා පිළිබඳ අදහස් වලට බොහෝ සමානකම් දක්වන බව පෙන්වයි. (යෙසායා 42:1-9 / 50: 4-11) එම දාසයා විශ්වාස පක්ෂව දුක් දරා සිටින තැනැත්තෙකු බව එම කොටස් වලින් පැහැදිලි කරයි.

මංගලම් කීමේ සිට කුරුසියේ යාගය දක්වා එදිනෙදා ජීවිතයේ ඔප්පු වන මරියෝත්තමාවන් ක්‍රිස්තු තුමන් ලෙසම එකට ස්ප්‍රීතුවන ප්‍රාණ පරිත්‍යාගවරියකි. ආධ්‍යාත්මිකව ඔප්පුවන ආත්මික යාගයකි. ගැඹුරු නිශ්ශබ්දතාවක දිවි ගෙවන ඇය ඒ නිශ්ශබ්දතාව "දේව සම්බන්ධතාව" කරගනී. කිතුනුවෝ අනාදියේ සිටම දේව අම්මාට ගෞරවාදරය දැක්වීය. දේව පුත්‍රයාණන්ට "සර්වබලධාරි වූ බැවින් කිසිවෙකුගේ උදව්වක් අවශ්‍ය නොවූවද එතුමාණන් මරියෝත්තමාවන් තෝරා ගෙන එතුමියගේ කුස අල්තාරයක් කළේ "දේව වචනයේ දාසිය ලෙස සනාථ කරමින් ය. ක්‍රියා පොතේ 1:14 න් පැහැදිලි වනුයේ මරියෝත්තමාවන් මුල් කිතුනු සභාව සමඟ ඉතා සමීපව සම්බන්ධ වී සිටි බවයි.

ජොහාන් සුවිශේෂය තුළ පැහැදිලිව පෙනෙනුයේ මරියෝත්තමාවන් අවසානය තෙක් අප්‍රතිහත ධෛර්යයකින් හා අපරිමිත මාතෘ ප්‍රේමයකින් යුතුව කුරුසිය පාමුල සිටි බව මෙයින් සනාථ වේ. තමන් ප්‍රේම කළ ශ්‍රාවකයාගේ මව ලෙස මෙහිදී ජේසුස් වහන්සේ ඇයව එම ශ්‍රාවකයාට බාර දුන් සේක. ප්‍රේමවන්ත ශ්‍රාවකයා මෙහිදී එක් පුද්ගල චරිතයක් නොවන්නේ ය. ඔහු කිතුනු අනුගාමිකයන්ගේ සංකේතය විය. එබැවින් ඔහුගේ මව වීම තුළින් මරියෝත්තමාවෝ ක්‍රිස්තු ශ්‍රාවකයන්ගේම මව වන්නාහ.

ශුද්ධවූ ලියවිල්ල තුළින් පෙනී යන්නේ මරියාවන්ගේ ප්‍රධාන භූමිකාව වූයේ ජේසුස් වහන්සේගේ මෑණියන් වීම බවයි. එබැවින් එතුමියගේ භූමිකාව අවබෝධ කර ගැනීමේදී විශේෂ වන්නේ මෙම ගැලවීමේ සැලැස්ම තුළ ජේසුස් වහන්සේට සම්බන්ධ කර අවබෝධ කරගැනීමයි.

ජේසුස් වහන්සේගේ මෑණියන් ලෙස මරියෝත්තමාවන් "විශ්වාසයේ අති විශිෂ්ට පරමාදර්ශයකි. එතුමියගේ විශ්වාස හා නොසැලෙන ජීවිත පිළිවෙත සාන්ත සභාවට අති වැදගත් පූර්වාදර්ශයකි. විශ්වාසයේ වසර අවසාන කර මරියෝත්තමාවන්ගේ වසර අරඹන්නේ ද මේ නිසාම විය හැකිය.

මරියාවන්ගේ කිතුනු ශ්‍රාවකත්වය ද ප්‍රබල ආදර්ශයකි. එතුමිය ජේසුස් වහන්සේට හා දෙවියන් වහන්සේට "නිරන්තරයෙන්ම සවන් දෙමින් දේව කැමැත්ත සොයා ඉටු කරන්නට උත්සාහ කළ ප්‍රථම කිතුනු ශ්‍රාවිකාවිය බවද කිව හැකිය.

පළමු කිතුනු අනුගාමිකාව වූ මරිය තුමිය ශුද්ධාත්ම ක්‍රියාවලිය පූර්ණත්වයට ගෙන ආ පළමු මිනිස් දියණිය ඇය වන්නීය. සැනසිලිදායකයාණන්ගේ පැමිණීමත් සමඟම එකම සළුවක් යට තම දයාබර පුතණුවන්ගේ ශ්‍රාවකයන් එක්කර පිය පුතු ස්ප්‍රීතුව තුළ සාක්ෂි දැරීමට හා සභාවේ ආරම්භයට නිරතුරු එතුමිය සියල්ලන් සමඟ එක්වී ගැඹුරු යාච්ඤාවක නිරත විය. එම නිසා ක්‍රියා පොත ගැඹුරුම වූ අර්ථයකින් දේව පුතණුවන්ගේ මෑණියන් බවට එතුමිය හඳුන්වා දෙයි (ක්‍රියා. 1:14). එදා ශුද්ධාත්ම ආනුභාවය තුළ ලොවටම රහසින් මංගලම් කියා දේව පුත්‍රයා ඇයගේ කුස තුළ මාංශගත කළ ගැලවීමේ ක්‍රියාවලිය මරියෝත්තමාවන් ගෙන් ආරම්භ කළා සේ සභාවේ ක්‍රියාකාරිත්වය ද එතුමියගේම දයාබර මාතෘත්වය තුළ ගොඩනඟන්නට දේව ස්ප්‍රීතුව ක්‍රියා කළේය. ගිනි දැල්ලක් ලෙස වැඩම කරන ශුද්ධාත්මයාණෝ ආලෝකයත් උණුසුමත් ලෙස මෙය සංකේතවත් කරවිය. මරියාවන්ගේ ජීවිතයේ දේව ආලෝකයෙන් යාච්ඤාව පූර්ණ වී ආදරයේ උණුසුමින් දයාව සියල්ලටම මුල් විය. එතුමිය ජීවිතයේ එදිනෙදා ක්‍රියාකාරිත්වය තුළ සාමාන්‍ය සියල්ල ස්වර්ගීක කරවිය. මැවීමේ හා ගැලවීමේ කථාව පූර්ණත්වයට මෙලෙස එසවීය.

සෑම කිතුනුවකුගේ ම බලාපොරොත්තුව "වරප්‍රසාද ජීවිතයක් තුළින් දේව කාර්යයන් කිරීම නම්, සාමාන්‍ය දිවිය ස්වර්ගීක කරවීම නම් මරිමවුන් සමඟ පළමු කිතුනු සංඝය ලෙස අප ද ජීවිතයෙන්ම දේව සාක්ෂිකරුවන් වන්නෙමු. ස්වර්ගීක පියාණන්ගේ සාන්තභාවය කරා එතුමිය සමඟින්ම පියමං කරමු. (මතෙව් 5:48)

✍ **තේවත්ත**
**ගරු අමතා සේනානායක නි.ම.නි.**
**පැවිදි සොයුරිය**



## මළවුන්ගේ දා සිතිවිල්ලක්!

**කිතුනුවන් විසින් නොවැම්බර් මාසය සළකනු ලබන්නේ මළවුන්ගේ මාසය ලෙසය. තමන්ට ආදරය කළ අය හා තමන් ආදරය කළ අය සිහිකිරීම සඳහා මාසයක් වෙන්ව තිබීම උතුම් දෙයකි.**

මළගිය අයට කෙසේ වෙතත් "මළවුන්ගේ දවස" ජීවත්ව සිටින අයට මංගල්‍යයකි. මංගල්‍යයයි කීවේ මළවුන් ගැන කියමින් තමන්ම කන තවත් දවසකි. "මල් පොකුරු" රැගෙන ලොකු ලොකු ඉටිපහන් දල්වා ගෙන මිනිපිට්ටනිය තුළ ද තම සල්ලිවල උජාරුව පෙන්නන්ට සමහරු මෙදිනද අවස්ථාවක් කරගනිති. චේතනාව කෙසේ වෙතත් පිට්ටනි නැවත සකසා මල්, ඉටිපහන් දල්වා වසරකට වරක්වත් ඒවායේ පාළු බව නැති කිරීම අපි සහෘද සිතින් දකිමු.

කෙසේ වෙතත් තම සහෘදයින් ජීවත්ව සිටියදී කෑවාද බීවාද නොබලා, බෙහෙතක් ගන්නට රුපියල් සියයක්වත් නොදී තම සැප රථයෙන් යනවිට අහක බලාගෙන ගොස් මළවුන්ගේදා පිට්ටනියට ගොස් ඇඬුවාට පලක් නැත. මල් පොකුරක් තැබුවාට, ඉටිපහනක් දැල්වුවාට පලක් නැත. එහෙත් ඔවුන් ජීවත්ව සිටියදී ඔබට ආදරය කළ නිසා, යහපත් සිතින් ඔබ යමක් කළහොත් එය මළ ගිය තැනැත්තාට නොව ඔබ දෙස බලා සිටින දෙවිඳාණෝ ඔබට දයානුකම්පා කරන සේක.

මළ ගිය අය වෙනුවෙන් යමක් කරන්නට බැරි වූවා යයි සිතමින් තව දුරටත් තුන් වේලම පමණටත් වඩා කුස පුරවා ගන්නවාද? ජීවත්ව සිටින අය අතර යමක් බෙදා ගනිමින් අළුත් සිතිවිල්ලකට යනවාද? "මෙන්න සමිඳුන්ගේ දොරටුව, දැහැමියෝ එයින් ඇතුල් වන්නෝ ය." (ගීතාවලිය 118 /20)

✍ **නිමල් වාස් - ඇත්ගාල**

## නිහඬ යාච්ඤාව තුළින් ගැඹුරු දේව සබඳතාවයක් ගොඩනඟා ගනිමු

**පසුගිය සතියෙන්...**

යාච්ඤාව වනාහි දෙවිඳුන් හා තමා අතර ඇතිවන සංවාදයකි. නිහඬ යාච්ඤාව යනු තමා තුළ වැඩ වසන දෙවිඳුන් හා ගැඹුරින් නිහඬව සම්බන්ධ වීමයි. "ඔබ යාච්ඤා කරන කල ඔබේම ඇතුළු කාමරයට වැද දොර වසාගෙන අදෘෂ්‍යමානව වැඩවසන ඔබේ පියාණන් වහන්සේට යාච්ඤා කරන්න" (මතෙව් 6/6)

නිහඬ යාච්ඤාවට ප්‍රධාන ක්‍රම වේදයක් ලෙස විවිධ භාවනා ක්‍රම භාවිත කළ හැකිය. ජේසු සමිඳුන් නිහඬ යාච්ඤාවේ යෙදුනු අවස්ථා කිහිපයක් දෙස බලමු.

"ජේසුස් වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව ජොර්දානයෙන් ආපසු ආ විට ආත්මයාණන් වහන්සේ විසින් උන්වහන්සේ පාළුකරයට ගෙන යනු ලැබූ සේක" (ලූක් 4:1)

"තවද ඒ දවස්වලදී උන්වහන්සේ යාච්ඤා කරන පිණිස කන්දකට නැගී දෙවියන් වහන්සේට යාච්ඤා කරමින් මුළු රැය ගෙවූ සේක" (ලූක් 6:12).

නිහඬ යාච්ඤාව තුළින් ගැඹුරු දේව සබඳතාවයක් ගොඩ නගා ගැනීමට ක්‍රියා කළ යුතු අවස්ථා තුනක් වැදගත් වේ. ⋆ පවිත්‍ර වීම, ⋆ සමාධිගත වීම, ⋆ දේව සබැඳියාව

මනුෂ්‍යයා උපතින් ම දුර්වලයි. එම නිසා පාපයට යොමු වේ. එබැවින් නිතරම පංචේන්ද්‍රයීයයන්, සිතිවිලි, හැඟීම් හා ආශාවන් නිසා පාපයට ඇද වැටෙයි. පවිත්‍ර වීම යනු බාහිර මෙන්ම ඇතුළාන්ත ජීවිත පවිත්‍රත්වයයි. එනම් තමා කළ වැරදි සිහිකර සමාව ලබා ගැනීමයි. තමාගේ දුර්වලකම් පිළිගැනීමයි. වැරදි ආශාවන්ට යොමු අවස්ථාවන්ට අවදි වී ඒවාට පසුතැවිලි වීමයි. එලෙසම සියළුම බැඳීම් වලින් නිදහස් වීමයි. මෙලෙස ඇතුළාන්ත සිතිවිලි හා හැඟීම් පවිත්‍ර වූ විට ඇතුළාන්ත නිශ්චල බවක් හා සාමකාමී බවක් දැනෙයි. එනම් සිත සමාධිගත වේ.

සමාධිගතවීම ගැඹුරු වන තරමට ඇතුළාන්තය නිහඬ වේ. තම ශරීරය ගැන හෝ ඇතුළාන්ත සිතිවිලි හා හැඟීම් පිළිබඳව කිසිසේත් අවදි නොවෙයි. එවිට ගැඹුරින් දෙවිඳුන් හා සම්බන්ධ වී ඇත. එය නිහඬ යාච්ඤාවේ අවසාන ප්‍රතිඵලයයි. සැබෑ නිහඬ යාච්ඤාව ජීවිත වෙනසක් ඇති කර විශ්වීය පුද්ගලයකු බවට පත් කරයි.

✍ **නුවරඑළිය**
**ගරු ශිරෝමා ප්‍රනාන්දු ප්‍රැන්සිස්කන්**
**නිකායික පැවිදි සොයුරිය**

## දේවමාතාවන් හා මළවුන්ගේ මාසය

**මරිය වහන්සේ අප සැමට කිතු සමිඳුන් දායාද කර ඇත. ඒ ශ්‍රී කුරුස ගසේදී ජුවාම් ගෝලයා හට මරිය මව සම්බන්ධ කිරීම තුළිනි. ජුවාම් තුමා මඟින් ධ්වනිත වන්නේ අප ශුද්ධවූ කතෝලික සභාවයි. සත්‍ය වශයෙන් එය ඊයෙත් අදත් හෙටත් නොමියෙන යථාර්ථයක් ද වේ.**

මෙම නොවැම්බර් මාසය අප අතරින් සමුගත් පුද්ගලයන්ට, මළවුන්ට කැප කොට තිබේ. මරණය අප සැමට පොදු දෙයකි. යථාර්ථයකි. මෙම යථාර්ථයට මල් පලසක් එක් කරනුයේ මරියතුමිය බව බොහෝ දෙනෙක් නොදනිති.

එහෙත් එතුමියගෙන් ජීවතුන්ට මෙන්ම මළවුන්ටද සම්බන්ධ වන ජීවමාන මාතාවකි. ජීවතුන්ගේ ජීවිත අවශ්‍යතා, ගැටලු, වේදනා, කඳුළු මැද මරිය තුමිය නිහඬව නොසිටින බව මූලික කරුණකි. අප මරිය මෑණියන්ට යදින කළ එතුමිය අපගේ අවශ්‍යතා සඳහා ඉඳුරාම මධ්‍යස්ථ වෙයි. එපමණක් නොව ඒ සියල්ල කිතු හිමියන්ගේ ශ්‍රී පාද මුල ඕ තුමිය තබන්නීය. එපමණක් නොව ඒවාට විසඳුම් ලබා දෙන්නට ද ඕ උත්සුක වෙයි. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ඕ තොමෝ දිරිය මවකි. මෙහිලා අපගේ අවධානයට භාජනය විය යුතු තවත් කරුණක් තිබේ.

එනම් එතුමිය අප අතරින් සමුගත් මළවුන් සම්බන්ධවද ධනාත්මකව සිතා බලන උත්තමාවක් බවයි. ඒ උන්වහන්සේට නිසර්ගයෙන් උරුම වූ ආදරය නිසාය. කාරුණිකත්වය නිසාය. මිනිසියාව නිසාය. මධ්‍යස්ථ භාවය නිසාය. සාන්තුවරයන්ගේ සමෝස ධර්ම ලාභය අනුව අප එනම් මෙලොව වසන්නන්, ජීවතුන් අයත් වන්නේ සටන් කරන සභාවට ය. අප යක්ෂයා සමඟ දුර්පරික්ෂා සමඟ, ගැටලු සමඟ සටන් කොට දෙවිඳුන් වෙතට යා යුතුයි. ඊට මරිය මවද එක්වන්නීය.

අප මළවුන් වෙනුවෙන් යාච්ඤා කරන කල ශුද්ධිකා ගිනිස්ථානයේ දුක් විඳින ආත්මයන් සඳහා ද මරිය මවගේ මධ්‍යස්ථභාවය ඔවුන් වෙනුවෙන් ලබා දෙන ලෙස ආයාචනා කළ යුතුය. එපමණක් නොව එදිනෙදා ජීවිතය තුළදීද කළ යුතු තවත් දෙයක් ඇත. ඒ මරිය මාතාව අනුගමනය කිරීමයි. අපගේ යැදුම් තුළින් පමණක් නොව ජීවිතය තුළින් ද අපෙන් වියෝ වූ ආත්මයන් හට මරිය වහන්සේගේ නොවරදින සුළු මධ්‍යස්ථභාවය සිහිපත් කරමින් ශුද්ධිකාගිනිස්ථානයේ පවතින අසීමිත වේදනාව තුනී කරන ලෙස අයැද සිටිය යුතුය.

යාච්ඤාව හුදෙක් පාලමක් බඳුය. මෙහි මැද මරිය තුමිය ජීවතුන්ට සහ මළවුන්ට යාච්ඤා කරයි. දෙව් සරණ අයැදී. මළවුන් වෙනුවෙන් අප යාච්ඤා කරන කල ඔවුන් තුළ තිබූ සොඳුරු ගුණ දහම් අප ජීවිත වලට බද්ධ කරන ලෙස



මරිය මාතාව වෙතින් පැතිය යුතුය. "නමෝ මරිය" නමැති අති විශිෂ්ටතම අවිය භාවිත කරමින් අප දිනපතා යදින කල අනිවාර්යයෙන්ම මියගිය තැනැත්තන්ද සිහිපත් කළ යුතුය. දිව්‍ය පූජා යාග ඔප්පු කළ යුතුයි.

මෙය අර්ථශූන්‍ය, පදනම් විරහිත විශ්වාසයක් ලෙස කෙනෙකුට සිතෙන්නට හැකිය. එය වැරදි බව අපට තහවුරු කරන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ ය. මරිය වහන්සේ ද සිය විශාරද බුද්ධිය සනිටුහන් කරමින් කිතුනු විශ්වාසය ජීව ගැන්විය යුතුය.අප සවිමත් විය යුත්තේ ලෞකික දේ වලින් නොවේ. ශුද්ධාත්මයාණන් පෙරදැරි කොටගෙන එම බලශක්තියෙන් මරියෝත්තමාවද වසා ගන්නා ලෙස බලාපොරොත්තු සහගත යැදුම් මඟිනි.

අපගේ මෙම යැදුම්, පැතුමන් නොවැම්බර් මාසයට පමණක් සීමා නොකළ යුතුය. මතකයට එන සියළු අවස්ථාවලදී මිය ගිය ආත්මයන් කෙරෙහි මරිය මව සමඟින් මෙත් වැඩිය යුතුය. යහපත ප්‍රාර්ථනා කළ යුතුය. ඔවුන් වෙතින් සිදු වූ සියළු වැරැදි දුරු කරන්නට අප පුදන පූජාවන් ඉවහල් කර ගත යුතුය. නොපෙනෙන මරිය මාතාවගේ පෙනෙන ස්වරූපය වන්නේ ශුද්ධවූ ජපමාලයයි. එම බැතිය නිතර පෝෂණය කර ගන්නට වෑයම් කළ යුතුය. ඊට අවදියෙන් සිටිය යුතුය.

මා බලවත් කරන තැනැන් වහන්සේ තුළ සියල්ල කළ හැකිය යන දේව හඬ මියගිය ආත්ම වෙත ද යන ලෙස දෙවිඳුන්ට යැදිය යුතුය.

මියගිය පුද්ගලයෝ ස්ථිර ලෙසම අසරණ වෙති. අප ඔවුන්ට යාච්ඤා කළ යුත්තේ ස්වකීය අසරණ භාවය තුළ මරිය මෑණියන්ගේ ආදරය ළං කරන ලෙසය. සවිමත් කරන ලෙසය. අප ජීවිත ජීවත් කරන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේය.

☛ 15 පිටුවට

✍ **දළුගම - කැලණිය**
**මලින්ත**
**බෝපෙආරච්චි**

ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## දෙවන සතිය සිකුරාදා උදා යාම යැදුම

### 51 වැනි ගීය

**පසුගිය සතිය හා සබැඳේ...**

### 147 වැනි ගීය

**විග්‍රහය සහ අරුත**
(අ) වගන්ති 1-6 :
මෙම ආරම්භක කොටස තුළ සඳහන් වන ක්‍රියා පද සමූහය ("ගොඩ නඟන සේක", "රැස් කරන සේක", "සුව කරන සේක", ආදි වශයෙන්) දෙවි සමිඳාණන් වහන්සේ ස්වකීය ජනතාවට සෙත සලසන අන්දම මනාව චිත්‍රණය කරයි. එමඟින් ප්‍රශංසාවේ සැදැහැවතුන්ගේ හදවතෙහි ජනිත වන අන්දම මනාව දිස්වේ.

<u>යහපත්ය, පියකරුය, හොබනේය :</u>
දෙවි සමිඳාණන් වහන්සේට තුති පැසසුම් දීමේ අවශ්‍යතාවද ඒ සඳහා සාමූහිකව කෙරෙන ආරාධනය ද අවධාරණාත්මකව මින් පෙන්නුම් කෙරේ. හෙබ්‍රෙව් බසින් යෙදෙන "හලල්" වදනින් දේව වන්දනාව තුළ දෙවිඳුන් පැසසීමේ උත්තරීතර බව වඩාත් පැහැදිලිව පෙනේ (ගීතා 135:3, 92:2).

<u>විප්‍රවාසි වූ ඊශ්‍රායෙල් සෙනඟ:</u> බබිලෝනීය විප්‍රවාසයෙන් පසුව ජෙරුසලෙම් නගරය යළි පිළිසකර කරනු ලැබුවේ ක්‍රි.පූ. 538 න් පසු එළඹි පර්සියාන ආධිපත්‍යය පැවති සමයේ දී ය. බොහෝ විශාරදයෝ මෙම ගීය පශ්චාත් විප්‍රවාසී ගීතයක් ලෙස හඳුන්වති.

<u>බිඳුනු සිත් ඇත්තන් සුව කරන සේක...ඔවුන්ගේ තුවාල බඳින සේක.:</u>
දේව සංරක්ෂණයේ ස්වභාවය ඉතා ළයාන්විත ලෙස මින් විස්තර කෙරේ. දෙවියන් වහන්සේ ජෙරුසලම යළි ගොඩ නඟමින් ජනතාවට රැකවරණය සලසන්නේ එඬේරකු විලසිනි. (එසකි. 34:16) විවිධ දුෂ්කර පීඩා මැද දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබූ සෙනඟ උන්වහන්සේගේ සමීපතාව සහ ආරක්ෂාව හිමි කරගත් අන්දම දිවැසාවලිය දක්වයි. (යෙසායා 61:2, හොසියා 6:1, යෙසායා 57:18-19).

<u>ගණන් නියම කළ සේක ... නම් තබන සේක:</u> නම් තැබීමේ ක්‍රියාවලිය බයිබලීය පසුබිමෙහි ආධිපත්‍යය හඟවයි. සකල මැවිල්ල කෙරෙහි දෙවි සමිඳුන්ගේ අසමසම ආධිපත්‍යය මේ සිරිත තුළින් දැක්වේ. (යෙසායා 40:26)




ශුද්ධ ලියැවිලි වසර
**(73)**
**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

☛ ලබන සතියට

## ඔවදනක්

**දෙවියන් වහන්සේගේ අභිප්‍රායෙන් අපි ඉපදෙමු.
උන්වහන්සේගේ අණසක යටතේ අපි ජීවත් වෙමු.
උන්වහන්සේගේ නියමයෙන් මරණයට ගොදුරු වී දූවිල්ලට නැවත හැරී පාපයේ රැහැනින් මිදී යමු.
ඔබවහන්සේගේ පුත්‍රයාණන්ගේ මරණය හේතුකොටගෙන ගැලවීම ලැබූ අපි, ඔබවහන්සේ නියම කර ඇති දිනදී ඔවුන් වහන්සේගේ උත්ථානයේ මහිමය කරා නැවත නැගී සිටින්නෙමු. (ශු. බයිබලය ඇසුරිනි)**
**- මැටිල්ඩා නානායක්කාර -**

# බෞතිස්මීය කැඳවීම

**පසුගිය සතියෙන්...**

**බෞතිස්මය ඔස්සේ ඉස්මතු වන "එඬේරික කාර්යය" නිවැරදිව අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වනුයේ සමාජ ව්‍යුහය මඟින් ඉස්මතු කරනු ලබන වටිනාකම් මෙම කාර්යභාරය අවතක්සේරු කිරීම සඳහා බෙහෙවින් දායක වන නිසාය. එඬේරික කාර්යභාරය නායකත්වයකි. මඟ පෙන්වීමකි. තව කෙනෙක් වෙනුවෙන් ජීවත් වීමකි. ස්වාමින් වහන්සේගේ ශ්‍රාවකත්වයට සෘජු ලෙස ඒකාබද්ධ වීමකි.**

"ඔබ අතරින් යම් තැනැත්තෙක් මා අනුගමනය... තමකම නසා කුරුසිය දරා...." ස්වාමින් වහන්සේට පැමිණි පරීක්ෂාවන් පිරික්සා බැලීමේදී එය තව දුරටත් පහසුවෙන් ග්‍රහණය කර ගත හැකිය. ධනය, බලය සහ කීර්තිය (යසස්ශ්‍රීය) ඇසුරින් ඉශ්‍රායෙල් නායකත්වයේ (රජකමේ) අනන්‍යතාවය ගොඩනැගුණ බව පැහැදිලි වන සත්‍යතාවයකි. ඉශ්‍රායෙල් රජ පෙළපත් අසාර්ථක වූයේ ලෞකිකත්වය යන රාමුව ඔස්සේ මහෝත්තම වූ දෙවියන් වහන්සේව නියෝජනය කළ යුතු වුවද එය පසෙකලා තමා වටා ජනතාව එක්රොක් කරවීමට මාවත සලසා ගත් බැවිනි. මෙය පැවැත්මේ ප්‍රයත්නයකි.

එනමුත් ස්වාමින් වහන්සේට පැමිණි පරීක්ෂා උන්වහන්සේගේ "රාජකීයත්වය" ධනය, බලය සහ කීර්තිය මත ගොනු කර ගැනීමට පෙළඹුවද උන්වහන්සේ යක්ෂයා පරාජය කොට ධනය, බලය සහ කීර්තිය ප්‍රතික්ෂේප කරමින් දුක, වේදනාව සහ මරණය මත තම අනන්‍යතාවය ගොඩනඟා ගනිමිනි. මෙලෙස තව දුරටත් මෙනෙහි කිරීමේදී උන්වහන්සේ දුක් විඳින රජ කෙනෙක් පමණක් නොව මරණ මංචකයේ සිටි රජ කෙනෙකි.

"මම යහපත් එඬේරා වෙමි. යහපත් එඬේරා තම ජීවිතය බැටළුවන් උදෙසා පූජා කරන්නේය" (ජුවාම් 10:11).

රැළට ඉදිරියෙන් ගමන් කරමින් තම රැළ සතුරු ආක්‍රමණවලින් රැක ගැනීමේ වගකීම මෙහිදී ඉස්මතු වන සත්‍යතාවයකි. තවද තම රැළට ඇති ලෙන්ගතුකම සහ ප්‍රේමයද ඉස්මතු වන වැදගත් පැතිකඩකි.

මෙවැනි ප්‍රේමයකින් යුත් එඬේරික කාර්යභාරය සඳහා ප්‍රබල ලෙස සාක්ෂි දරන්නට බෞතිස්මය මඟින් ඇරියුමක් ලැබෙන අතර "දෛනික දිවි පෙවෙත" තුළ ඊට ලබා දෙන සුබවාදී ප්‍රතිචාරය සම්බන්ධවද මෙහිදී අවධානය යොමු වේ.

☛ 15 පිටුවට

✍ අගරදගුරු පදවි ධර්මෝපදේශ අධ්‍යක්ෂ
**ගරු ඉන්ද්‍රා රත්නසිරි පියතුමා**

## පූජා සතිය
## නොවැ. 17 - 24 දක්වා

| | |
|---|---|
| 17 ඉරිදා | **සාමාන්‍ය සමයේ තිස්තුන්වන ඉරුදින**<br>(කොළ) මලාකි 4:1-2 ගීතාවලිය 98:5-9<br>2 තෙසලෝනික 3:7-12 ලූක් 21:5-19 |
| 18 සඳුදා | **ශු. පේදුරු පාවුළු දේව මන්දිරය කැප කිරීම**<br>(කොළ/සුදු) 1 මකබි 1:10-15, 41-43, 54-57, 62-64<br>ගීතාවලිය 119:53,61,134,150,155,158<br>ලූක් 18:35-43 හෝ<br>ක්‍රියා 28:11-16, 30-31<br>ගීතාවලිය 98:1-6 මතෙව් 14:22-33 |
| 19 අඟහරුවාදා | (කොළ) 2 මකබි 6:18-30<br>ගීතාවලිය 3:1-7 ලූක් 19:1-10 |
| 20 බදාදා | (කොළ) 2 මකබි 7:1,20-31<br>ගීතාවලිය 17:1,5-6,8,15 ලූක් 19:11-28 |
| 21 බ්‍රහස්පතින්දා | **කන්‍යා මරියාවන් දේව මාළිගයේ පුදකිරීම**<br>(සුදු) සෙකරියා 2:10-13<br>(සංගීතය) ලූක් 1:46-55 මතෙව් 12:46-50 |
| 22 සිකුරාදා | **සා. සිසිලියා කන්‍යාව අනිවාර්ය අනුස්මරණය**<br>(රතු) 1 මකබි 4:36-37,52-59<br>1 වංශාවලිය 29: 10-12 ලූක් 19:45-48 |
| 23 සෙනසුරාදා | **සා. ක්ලෙමන්ට් පාප්තුමා, සා. කොලොම්බන් මුනි අනුස්මරණය**<br>1 මකබි 6:1-13 ගීතාවලිය 9:1-3,5,15,18<br>ලූක් 20:27-40 |
| 24 ඉරිදා | **සාමාන්‍ය සමයේ අවසාන ඉරුදින**<br>**ක්‍රිස්තු රාජ මංගලෝත්සවය**<br>(සුදු) 2 සාමුවෙල් 5:1-3<br>ගීතාවලිය 122: 1-5 කොලොස්සි 1:12-20<br>ලූක් 23: 35-43 |

ගරු හෙන්රි සිල්වා පියතුමා

# එළිදරව්වෙහි 01 පරිච්ඡේදය පිළිබඳ විවරණයක්



**පසුගිය සතිය හා සබැඳේ...**

ස්වාමින් වහන්සේගේ දවස යනු පැරැණි ගිවිසුමේ දිවැසාවලියේ දක්නට ලැබෙන සංකල්පයකි. (ආමොස් 5:16-20; ජොඑල් 1:15; 2:1-11) ඒ අනුව දෙවි ස්වාමින් වහන්සේ යුගාන්තයේ දී ධර්මිෂ්ඨයන්ට ගැළැවීමත්, පාපිෂ්ඨයන්ට දඬුවමත් දෙන බව ඊශ්‍රායෙල්වරු තරයේ විශ්වාස කළහ.එවැනි අදහසක් මෙම වගන්තියේ අඩංගු කරුණු සඳහා නොගැලපෙන නිසා "සවාමින් වහන්සේගේ දවස" යන ක්‍රිස්තුන් වහන්සේගේ දවස යැයි නොහොත් කිතුනුවන්ගේ ජනවන්දනාවේ දවස යයි විශේෂඥයෝ පවසති. ග්‍රීක පිටපතේ ඇති "කුරියකේ" යන්නේ වචනාර්ථයෙන් එකී අදහස සනාථ කිරීමට විශේෂඥයෝ පරිශ්‍රමයක් දරති. ජොහාන්ට ඇසෙන
හොරණෑ ශබ්දය දෙවියන් වහන්සේගේ ප්‍රකාශ වීම හා මනුෂ්‍ය ඉතිහාසයේ ඔවුන් වහන්සේගේ මැදහත්වීම හඟවයි. (නික්මයාම 19:16; 1 තෙසලෝනික 4:16)

**11 වන වගන්තිය**

"ඔබ දකින දර්ශනය පොතක ලියා එපීසිය, ස්මිර්නය, පෙර්ගමෝව, තියාතිරා, සර්දිස්, පිලදෙල්පිය, ලවොදෝසියා යන මේ සභා සතට යවන්නැයි ඒ හඬ පැවැසීය."

එළිදරව්ව පොත මෙකී දුක් විඳින සභා සතට යැවීමට ලියැවුනු බව පැහැදිලිය. එළිදරව් සාහිත්‍යයේ ප්‍රධාන පරමාර්ථය නම් පීඩා විඳින ජනතාව දිරිගන්වා ඔවුන් තුළ විශ්වාසය තහවුරු කිරීමට ඉවසීම කෙරෙහි අවධානය යොමු කිරීමය.

**12 සහ 13 වගන්තීන්**

"එවිට මට කථා කළ ශබ්දය කිමෙක්දැයි බලනු පිණිස මම හැරුණෙමි. එසේ හැරුණු කල පහන් රුක් සතක් ද ඒ පහන් රුක් මැද පාද දක්වා දිග වස්ත්‍රයක් හැඳ ළය රන් පටියක් බැඳ සිටි මනුෂ්‍ය පුත්‍රයකු වැනි තැනැත්තකු දුටිමි."

☛ ලබන සතියට

# යහපත ඉටු කිරීම මෙන්ම අයහපතින් වැළකෙමින් දෙවිඳුන් වෙත පා නඟමු

## සාමාන්‍ය සමයේ 33 වන ඉරුදින




**ධර්මිෂ්ඨකම යනු හුදෙක් අප විසින් යහපත ඉටුකිරීම පමණක්ම නොව අයහපතින් වැළකෙමින් දෙවියන් වහන්සේ වෙත ගරු බිය පෑමද වේ. ධර්මිෂ්ඨකම ඉටුවනු වස් යුක්තිය සහ සාධාරණත්වය එය තුළ ගැබ්ව පැවතිය යුතුය.**



දෙවියන් වහන්සේගේ යුක්තිය සහ සාධාරණත්වය ඉටුවන යුගාන්තයේ දී උඩඟු, නපුරු අය පිදුරු පෝරණුවක දැවී යන්නාක් මෙන් විනාශ වී යන බව අද පළමු කියවීම තුළ මලාකි දිවැසිවරයා පෙන්වා දෙයි.

දෙවියන් වහන්සේට පමණක් හිමි ගෞරවය ලබා නොදෙමින්, වංචා සහගත ලෙස ජනතාව පූජාවක් ඔප්පු කරන විට උන්වහන්සේගේ විනිශ්චය ගැන එහි තවදුරටත් ප්‍රකාශ වේ. අපගේ ජීවිත තුළ ද දෙවියන් වහන්සේට හිමි ස්ථානය කුමක් ද යන්න ගැටලුවකි. ලෙඩ දුකේ දී සහ ප්‍රශ්න වලදී පමණක් අප උන්වහන්සේව සිහිපත් කරන කතෝලිකයන් ද? බාහිර වත්පිළිවෙත් වලට පමණක් සීමා වී උඩඟුකම තුළ උන්වහන්සේව අමතක කරන කල, ගෞරවය කෙළෙසන කල අපගේ විනිශ්චය ද මෙයින් ඉතා ම පැහැදිලි වේ.

ආදි මව්පියන් යෙදෙනුයේ ද උඩඟුකමේ පාපයේ ය. ඔවුන් එල අනුභව කරනුයේ හොඳ නරක අවබෝධ කරගැනීමේ ගසෙනි. එනම් හොඳ සහ නරක අතර පවතින සෑම දෙයක්ම උරුමකර ගැනීමට උත්සාහ දැරීමකි. ඒ තුළ ඔවුහු උඩඟුකමේ පාපයේ යෙදේ. සමහර අවස්ථාවලදී අපද උත්සාහ දරනුයේ දෙවියන් වහන්සේට පමණක් උරුම වූ සකල දැනුමම අපට ද උරුම කර ගැනීමටය. ඒ නිසාම උන්වහන්සේ වෙනුවෙන් වැය කරන්නට කාලයක් නොමැතිව පවතී.

දෙවන කියවීම තුළ අපට පෙන්වා දෙනුයේ අප වෙහෙස මහන්සියෙන් යුතුව උපයා ගත යුතු බවයි. සෑම දෙයක්ම ක්ෂණිකව ලබා ගැනීමට උත්සාහ දරන යුගයක අපට ආරාධනා කරනුයේ අලසකම දුරලා, වෙහෙස මහන්සියෙන් වැඩ කළ යුතු බවයි. අපගේ වෙහෙස මහන්සිය උන්වහන්සේට ප්‍රශංසාවකි.

උන්වහන්සේගේ දුක් විඳීමට හවුල් වීමකි. ජීවත් වීමට දරණ වෙහෙස දෙඋරට දැනෙන විට, එය ක්‍රිස්තුන් වහන්සේගේ කුරුසිය රැගෙන යාමට අපද හවුල් වීමකි. දේව කැමැත්ත ඉටුකරනු වස් ක්‍රිස්තුන් වහන්සේ කල්වාරිය වෙත පිය මැන්නාක් මෙන් අප ජීවිත තුළ අපට උරුමවන කුරුසයන්ද අප ආදරයෙන් බාර ගත යුතුය. අපගේ වෙහෙස මහන්සියෙන් යුතුව ක්‍රියා කිරීම සැමට ආදර්ශයකි. එසේ නම් වෙහෙසීමේ දුක් විඳීමේ යථාර්ථය තුළ සැනසීම ස්වාමින් වහන්සේ ය. අප උන්වහන්සේ තුළ යැපෙන විට අපගේ ජීවිත අරගලයන් ගැටලු හා වේදනාවන්ට විසඳුම් ලැබෙනු ඇත. එහෙත් උන්වහන්සේ නිසාම අපට අපගෙන්ම කෙනෙකු වෛර බඳිනු ඇත.

නමුත් ස්ථිර ඇදහිල්ල තුළ අපට කිසිදාක හානියක් නොපැමිණෙනු ඇත. උන්වහන්සේගේ දේවත්වය අභිමුව සැම දෙයක්ම සුළඟට ගසාගෙන යන දෙයක් වැනිය. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රබලම වැඩසිටීම වන කතෝලික අපටම පමණක් උරුම වූ දිව්‍ය සත්ප්‍රසාදය තුළ අපගේ ජීවිතයන් උන්වහන්සේට භාර කරමු.

උන්වහන්සේ නිසාම අපට ඇතිවන පීඩාවන් ආදරයෙන් බාර ගනිමු. ඉවසීමෙන් යුතුව දරා ගනිමු. ඒ තුළ දෙවන පැමිණීමට සූදානම් වෙමු.

✍ ජාතික දෙව්සත්හලේ ගොන්සාල්වෙස් සිංහල ආයතනයේ
**ගරු ෂෙමාන් වික්‍රමසිංහ සහෝදරතුමා**

# මෝදර දලාසාල් විදුහලට පැවිදි සහෝදරවරයෙක් අවශ්‍යයි

**කතුතුමනි,**

කොළඹ - 15 මුතුමෝදර නොහොත් මෝදර 1905 දී ආරම්භ කරන ලද අද උතුරු කොළඹ දිසාවේ පැරණිතම කතෝලික පාසල් අතරින් දලාසල් සහෝදරවරුන්ගේ නිකායට අයත් දලාසාල් විදුහල (ඈ බ්‍රී්කකැ ඤකකැටැ) පසුගිය කාලයේදී උගතුන් බුද්ධිමතුන්, නොයෙකුත් දක්ෂයන්, විශිෂ්ටයන් සමූහයක් බිහිකළ විදුහලකි. මෙම විද්‍යාලයට මෑත කාලයක සිට ගරු විදුහල්පති තනතුරට දලාසාල් නිකායට අයත් ගරු සහෝදර විදුහල්පති තුමකු නොමැති වීම නිසා විදුහල විශාල අර්බුදයකට මුහුණ දී ඇත.

දලාසාල් මාතාවගෙන් බිහිවු එකම ගරු කාදිනල් වරයාණන්ද, ගරු අගරදගුරුතුමන්ලා, ගරු පූජාප්‍රසාදීවරු, ගරු සහෝදරවරු, ගරු ගුරුභවතුන්, දොස්තරවරු, නීතිඥයන්, සෙනෙට් සභා මන්ත්‍රිවරු, පාර්ලිමේන්තු මන්ත්‍රිවරු, ත්‍රිවිධ හමුදාපතිවරු, තානාපති වරු, ව්‍යාපාරිකයන් සහ දිවයිනේ සහ ලෝකයේ කීර්තිමත් නම් දරා සිටින කලාකරුවන් රැසක් බිහිකර ඇති මෙම පාසල අද ඉතා අසීරු තත්ත්වයකට පත්ව ඇත.

දැනට මෙම විදුහලේ පරිපාලනය ගෙන යාම සඳහා තාවකාලිකව වැඩ බලන ගිහි විදුහල්පතිවරියක දැඩි කැපවීමකින් සහ උත්සහයකින් කටයුතු කරයි. එහෙත් මෙම වසරේ 2013 ඔක්තෝබර් මස 28 වෙනි දින එතුමියද විශ්‍රාම යාමට නියමිතව ඇත. වසර ගණනාවක් මෙම විදුහල හොඳ තත්ත්වයකට ගොඩනගා දැනට මාස 6 කට පමණ පෙර මෙම විදුහලේ විදුහල්පති වශයෙන් සේවය කළ දලාසාල් නිකායට අයත් ගරු ඒ. ඊ. තාසියස් සහෝදරතුමා කුරුණෑගල ශාන්ත මරියා විද්‍යාලයට මාරු වීමක් ලබා යන ලදි. එයට හේතුව මෙම විදුහලේ විදුහල්පතිව සිටි දලාසාල් නිකායට අයත් ගරු සහෝදර තුමා ස්වර්ගස්ථ වීම හේතු වෙනි. ගරු තාසියස් සහෝදරතුමා එතුමාගේ සේවා කාලයේදී මෙම විදුහල අධ්‍යාපනය, අධ්‍යාත්මික, විනය සදාචාරය සහ ක්‍රීඩා අතින් උසස් තත්ත්වයකට ගෙන එන ලදි. එතුමාට දලාසාල් විදුහලේ ගුරුමණ්ඩලයද, දෙමව්පියන්ද නොමද සහයක් දෙන ලදි.

මෝදර ග්‍රාමයේ අද සියයට හැටකට වඩා මුස්ලිම් ප්‍රජාවට අයත් ප්‍රදේශයකි. මුස්ලිම්, බෞද්ධයන් සහ හින්දු භක්තිකයන් වෙසෙන මෙම ප්‍රදේශයට කිසියම් ආකාරයකින් හෝ දේශපාලන බලපෑමක් තුළින් අන්‍යාගමික ගිහි විදුහල්පති තුමකු හෝ විදුහල්පතිනියක මෙම කතෝලික විදුහලට පැමිණියහොත් දලාසාල් විදුහල් මාතාවට දෙවියන්ගෙ පිහිටය.

එම නිසා වසර 118 පැරණි මෙම කතෝලික පාසල එසේ වීමට ඉඩනොදී මෙම විදුහලට දලාසාල් නිකායට අයත් ගරු සහෝදර විදුහල්පතිවරයෙක් හෝ ගරු පියතුමකුගේ සේවය ලබාදීමට අවකාශයක් ඇත්නම් වඩාත් සුදුසුය. මොරටුව ශාන්ත සෙබස්තියන් විදුහල සහ වත්තල ශාන්ත අන්තෝනි විදුහල දලාසාල් නිකායට අයත් පාසල්ය.

දැනටමත් ගරු පියතුමන්ලා විදුහල්පතිවරු වශයෙන් සේවය කරති. ඉහත සඳහන් පාසල් දෙකටම ලබාදුන් ආකාරයේ නිවැරදි තීරණයක් ලබාදී ශිෂ්ටසම්පන්න කතෝලික පරිසරයක් අප අනාගත පරපුරට ලබාදීමට කතෝලික සභාවේ වගකිව යුත්තන් හා දලාසාල් නිකායේ ශ්‍රී ලංකාවේ ප්‍රාදේශාධිපති තුමාගේ අවධානය යොමු කරන මෙන් බැගෑපත්ව ඉල්ලා සිටිමු. කතෝලික පාසලකට අන්‍යාගමික විදුහල්පති වරයකුගේ සේවය කිසිදු ආකාරයකින් අවශ්‍යවනුයේ නැත.

කතෝලික පසුබිමක් ඇතිව විදුහල්පතිවරයකු පත්කර ගතහොත් කතෝලිකයන් වන අපට මෙන්ම, යහපත් එඬේරෙකුගේ සේවය ලැබ පැහැබර අනාගතයක් අනාගත පරපුරට ද ලබාදිය හැකි බව මාගේ විශ්වාසයයි.

**රනිල් රාජපක්ෂ**
දලාසාල් ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු උපසභාපති, දැනට කමිටු සාමාජික සහ කලාභූෂණ

# දිව්‍ය පූජාවේ කියවීම් ගැන

**කතුතුමනි,**

දිව්‍ය පූජාව සියලුම සැදැහැ ජනතාවගේ සහභාගිත්වයෙන්, ජනතා අදහස් වෙනුවෙන් දෙවිපියාණන් වෙත පිදෙන උතුම් වූ යාගයකි. එවන් වූ දිව්‍ය පූජා යාගයක පළමු හා දෙවැනි කියවීම් පැවිදි සොහොයුරියන්ට පමණක් ලබා දීම සුදුසු බවට වූ අදහසක් කෝට්ටේ සාම විනිසුරු ඩී. ඩී. ඊ ඉසෙඩ් එඩ්වඩ් මහතා විසින් ලියා ඔක්තෝබර් මස 27 වැනි දින ප්‍රදීපයේ ජනතා හඬ තීරයේ පළකර තිබුණි.

ඊට හේතු දක්වන ඒ මහතා කියවීම් සඳහා ඉදිරිපත් වෙන තරුණියන් කාන්තාවන් අඟ පසඟ, පපුව පිට හා කළවා නිරාවරණය වන අන්දමේ විලාසිතා ඇඳුමෙන් සැරැසී කියවීම් සඳහා ඉදිරිපත් වීමය. එවැනි විලාසිතා ඇඳුමෙන් සැරැ සුනු කාන්තාවන් අපේ ප්‍රදේශවල දෙව්මැඳුරුවල කියවීම් වලට යොදා නොග න්නා බව සඳහන් කළ යුතුය. සාමාන්‍ය ඉරිදා දිනෙක හෝ මංගල දිනකවත් එසේ නොවේ. එවැනි සංකර ඇඳුමෙන් සැරැසී එන අයට කියවීම් ලබාදීම කෝට්ටේ මීසමෙහි සිදුවන්නේ ඇයි මම නොදනිමි. දෙව්මැඳුරු වල එසේ වන්නේ නම් එයට විරුද්ධ ව කටයුතු නොකිරීම මීසම් සේවක පියතුමන්ලාගේ දුර්වල කමකි. නැතහොත් මීසම් සභාවේ වරදකි. නාගරික කරණයට නතු වී ඇති ප්‍රදේශයන් හී මීසම් වල මෙලෙස වන්නේ නම් එය කණගාටුවට කරුණකි.

දිව්‍ය පූජාවට සහභාගි වන වැඩි පිරිස ගිහි ජනතාවය. පැවිදි සොහොයුරියන් ඇත්තේ 5 හෝ 6 පමණි. එවැනි තත්ත්වයක් තුළ දිව්‍ය පූජාවේ කියවීම් සුදු ඇඳුමෙන් සැරසුන පැවිදි සොහොයුරියන්ට පැවැරීමට යෝජනා කිරිම හාස්‍ය ජනකය. අනෙක හැම මීසමකම කන්‍යාරාම නැත. ඒ තත්ත්වය තුළ නැති තැන් වලට පැවිදි සොහොයුරියන් පිටින් ආනයනය කළ යුතුය. කියවීම් කියවන ගිහි ජනතාව සුදු ඇඳුමෙන් සැරසී එය සිදුකළ යුතු බව යෝජනා කළේ නම් එය පිළිගත හැකිය. සහභාගිශිලි සභාවක් කරා යන ගමනේ දී ගිහි ජනතාව දෙවැනි තැනට ලා කථා කිරීම ගැන කණගාටු වෙමි.

**ට්‍රිසිල් ඇෆ්. මැන්දිස්**
විල්ලෝරාවත්ත

# මුහුණු පොත පරිහරණය පරෙස්සමෙන්

**කතුතුමනි,**

නව යොවුන් වියට එළඹීමත් සමග මිතුරු මිතුරියන් සෙවීමට කවුරුත් උනන්දු වේ. ඒ සඳහා අතීතයේද විවිධ ක්‍රම සහ විධි පැවතුනි. නවීන තාක්ෂණයත් සමග එය අන්තර් ජාලයේ ෆේස්බුක් දක්වා විහිදී ඇත. පසුගිය දා වාර්තා වු සිද්ධියකට අනුව මෙවර අ.පො.ස (සා.පෙ) විභාග යට පෙනී සිටීමට සූදානම් වූ සිසුවියක් සම වයසේ තරුණයකු සමග ෆේස්බුක් ඔස්සේ මාස ගණනාවක සිට මිතුරුදමක් පැවතිණි. කිසි දිනක පියවි ඇසින් නොදුටු මෙම මිතුරා පිළිබඳව තම අනෙක් මිතුරියන්ටද ඇය වර්ණනා කරන්නට වූවාය.

මෙසේ මාස ගණන් ගත වෙත්ම දිනක් ඇයට දැනගන්නට ලැබුනේ තමා මිත්‍රත්වය ගොඩනගාගෙන සිටින මෙම තරුණයා අංගවිකල පුද්ගලයකු බවය. එතැන් සිට තම අනාගත බලාපොරොත්තු බිඳ වැටුණු ඇය තම ජීවිතය වෙනස් කර ගත්තේ ගෙල වැළලාගෙන ජීවිතයට සමුදීමෙන්........ දහම් පාසල් අධ්‍යාපනයක් නොලද සහ මුදල් පසු පස හඹා යන දෙමාපිය පරිසරයක ජීවත් වූ ඇය, වැඩිහිටි අපට කියා දුන් පාඩම මෙම මළවුන් සමරන මාසයේදී සිහිපත් කර ගනිමු.

එතැනින් නොනැවති, දහම් පාසල් අධ්‍යාපනය ගොඩනැංවීමට විවිධ කණ්ඩායම් වෙර දරද්දී සුළු ටියුෂන් කඩ මුදලාලි වරුන් දහම් පාසල් දිනවල තම ව්‍යාපාරය කරගෙන යෑමට සිසුන් පොළඹවා ගෙන ඇත. සමාජ සාරධර්ම පිරිහෙමින් පවතින මෙවන් වකවානුවක දහම් පාසල් අධ්‍යාපනය දියුණු කර ගැනීමට රජයේ වගකිව යුතු අංශ මෙන්ම ගිහි - පැවිදි පිරිස් ද ඉදිරියට පැමිණීමට කාලය එළඹ ඇත.

**එන්. ජයන්ත පෙරේරා**
මහජන සෞඛ්‍ය පරීක්ෂක
බොරැල්ල

# දේව මෙහෙයේ භක්තිය වැඩි කිරීමක්

**කතුතුමනි,**

2013 ඔක්තෝබර් 27 වන ඉරිදා ඥානාර්ථ ප්‍රදීපය, ජනතා හඬ තීරයේ පළවු ලිපියක් සම්බන්ධවයි. 'දේව මෙහෙයේ කියවීම් පැවිදි සොයුරියන් අතට' යන මැයෙන් කෝට්ටේ සාම විනිසුරු ඩී. ඩී. ඊ ඉසෙඩ් එඩ්වඩ් මහතාගේ ලිපියයි. එම යෝජනාවට අප සැමගේ භක්ති ප්‍රණාමය ඔහුටයි. මෙය ශුද්ධවු සභාවෙන් ක්‍රියාත්මක කළ යුතු ඉතා අගනා යෝජනාවකි.

එම ලිපියේ සඳහන් පරිදි බෞද්ධ ආගමිකයන් අප ආදර්ශයට ගත යුතුයි. ඒ මහතා ලියා තිබෙන්නේ දෙව්මැඳුරට විනීත ඇඳුමින් සැරසී ඒමට නොහැකිද? එය සත්‍යයකි. දේව මව්ට කැපකර ඇති මේ වසරේ පටන්වත් අපගේ පැවිදි සොයුරියන්ව දේව මෙහෙයේ කියවීම්වලට යොදවා දේව මෙහෙයට තව තවත් උනන්දුව වැඩි කිරීමට කටයුතු කිරීම ඉතා අගනේය. සමහරු වේලය නොපැලඳ කියවීම්වලටද සහභාගි වෙති (කොරින්ති 11:2-16). හිස නොවසා යාච්ඤා කර ස්ත්‍රිය තමාගේ ප්‍රධානියාට අගෞරව කරයි.

විවාහ මංගල්ලයන්හිදීද, මනාලියගේ යෙහෙලියන්ද කියවීම්වලට සහභාග වන්නේද අඟපසඟ පෙනෙනා ඇඳුම්වලින් සැරසීගෙනය. දේව මෙහෙයේ ගරු පියනමට ඉදිරිපසින් මෙලෙස සැරසීගෙන සිටින විට එය ගරු පියනමටද බාධාවක් නොවන්නේද? සමහරුන් වැරදි කියවීම් කියවන විට ගරු පියනම පැමිණ නිවැරදි කරන අවස්ථාද සිදුවේ.

සමහරු දේව මෙහෙයේදී යම් උත්සව අවස්ථාවල හැඳින්වීම කියවන අවස්ථාවල සභා පාලකයනට (රදගුරු තුමාට) අතිඋතුම් යන වචනය නොයොදා ගරු රදගුරු හිමි කියා පවසති.

ගරු පැවිදි සොයුරියන් දේව මෙහෙයේ කියවීම්වලට සහභාගි වන්නේ නම් මෙවන් වැරදි සිදුවන්නේ නැත.

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**
බදුල්ල

# ගිහි සහභාගිත්වය දුරස්කරලීමක්

**කතුතුමනි,**

සදාචාරාත්මක නොවන ඇඳුමෙන් සැරසුන කාන්තාවන් දේව මෙහෙයන් වලදී පළමු හා දෙවැනි කියවීම් වලට සහභාගිවීම වැලක්වීමට එම කාර්යයන් ගරු පැවිදි සොයුරියන් අතට පත් කළ යුතු බවට අදහසක් ජනතා හඬ තීරුවේ පළවී තිබුනි.

ඇත්තවශයෙන්ම දේව මෙහෙයන්වලදි ගිහි සහභාගිත්වය කැපී පෙනෙන අවස්ථාවන් වන්නේ උක්ත කියැවීම් හැඳින්වීම් හා විශ්වාසකයන්ගේ යාච්ඤාවන්ය. මෙම අවස්ථාවන් සදාචාරාත්මක නොවන ඇඳුමින් සැරසුන නිසා අහිමි කර ගරු පැවිදි සොයුරියන් යෙදවීම ප්‍රශ්නයට පිළිතුරක් නොවන්නා සේම එකී ඇඳුම් වලින් සැරසීමට තව තවත් ඉඩකඩක් ලබාදීමක් ද වන්නේය.

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් කියැවෙන ගිහියාට තැනදීම මෙන්ම සහභාගිශීලි සභාවක ලක්ෂණයන්ද මෙයින් ලොප්වී යන්නේය. ප්‍රශ්නයට විසඳුම එය නොවන අතර මර්යදාවයට හානිකර උඩගෙඩි දෙන ඇඳුම් ඇඳීම පිළිබඳ දැනුම්වත් කර සභා ශ්‍රේෂ්ඨයන් විසින් අදාල පියවර ගැනීම නොවලහ කළ යුත්තක් වන්නේය. හිස් වැසුම් රහිතව කාන්තාවන් අල්තාරයට ප්‍රවිශ්ටවීම මෙහිදී සිහිපත් වන අතර පූජනීය ස්ථානවල පූජනීයත්වයට හානිකර ලෙස නොහැසිරීම ගිහි වගකීමක්ද වන්නේය. එසේම මෙම අදහස් ගරු පැවිදි සොයුරියන්ගේ අමිල සේවාවනට විරුද්ධ වීමක්ද නොවන්නේය.

**තියබෝල්ඩ් සමරතුංග**
රත්නපුර

# පාලක සේවක සමගිය වැදගත්

**කතුතුමනි,**

අද ඔඩුදුවන ආර්ථික උද්ධමනය හමුවේ විවිධ රැකියාවල නියුතු අයගේ පාලකවරු තමන් සුපිරි මුදල් වැටුපක් ලබාග නිද්දි මධ්‍යම පාන්තික ලෙස දිවිගෙවන සේවකයන්ගේ අතිකාල දීමනා ලබාගැනීමට හැකි මාර්ග වගු ලෙස හා වක්‍ර ලෙස කපා හැරීමට ක්‍රියාකිරීම කාලෝචිත නොවන බව මතක් කරනු කැමැත්තෙමි.

විදුලිබිල, ටෙලිෆෝන්, වතුර, බස්ගාස්තු වැඩිවීම ආදිය හේතුවෙන් පඩිපතට සරිලන ඉහළ දැමීමක් නොමැතිව ලතැවීමට සිදුවන කාත් කියාත් කරගැනීමට නොහැකි මධ්‍යම පාන්තික රැකියාලාභීන්ගේ බඩට වැදී ඇති පහර සුළුපටු නොවේ.

ඇත්තෙන්ම පාරේ හිඟාකන්නාට වඩා මධ්‍යම පන්තික රැකියා ලාභියා පෙළෙන්නේ දුකිනි. තම දරුමල්ලන් හට තමාගේ මාසික වැටුපෙන් දුකින් තොරවූ වැදගත්, පෞද්ගලික අභිමානයෙන් යුතුව ජීවත් වීමට හැකි යැයි මානව සමාජයට පෙන්වමින් කරන ආර්ථික අරගලය සුවිශාලය.

එම නිසා ඉහළ නිලතල දරන අයගේ අනුකම්පාව දුප්පත්දනගේ සිත සුව පිණිස වෙනුවෙන් තීරණ ගැනීමට යෙදවීම යුගයේ අත්‍යවශ්‍යතාවයකි.

**මැක්සිමස් රෝයි පෙරේරා**
ජාඇල



# මරිය වසර සඳහා වූ එ

දයාබර සහෝදරවරුනි,

"Lumen Gentium" නම් වූ ශාන්ත සභාව පිළිබඳ දෙවන වතිකාන කතිකාවේ අපෝස්තලික අනුශාසනා පත්‍රය භාග්‍යවත් ස්වර්ගීය මාතාවන් වූ කන්‍යා මරියාවන් පිළිබඳව මෙසේ ප්‍රකාශ කරයි.

"සුරදූතයාගේ පණිවුඩය ලත් සැනින් අප කන්‍යාවන් දේව වචනය ඇගේ හදවතට හා ජීවිතයට ලබා ගනිමින් ලෝකයට ද ජීවනය ලබා දුන් සේක. මෙසේ උන්නේ පටන් ඉදිරියට, ඇය සැබවින්ම ගැළවුම්කරුවාණන්ගේ මාතාවන් හා, දේව මාතාවන් බවට ගෞරවාන්විතව පිළිගැනුනු සේක. තම පුතනුවන්ගේ පුණ්‍ය විශිෂ්ටත්වයට පංගුකාරවීම, කිට්ටුවන්තවීම හා බිඳලිය නොහැකි සේ උන්වහන්සේ හා බැඳීම තුළ ලබා ගත් උත්කෘෂ්ඨ වූ ද සුවිශේෂිත වූද කැඳවීම නිසාම දේව පුතනුවන්ගේ මව වීමේ මහත් වූ ආශිර්වාදයකට හා අති උසස් තැන් හි වූ මහිමයකට ද ඔසවනු ලැබීමට එතුමිය වරම් ලද්දීය.

මෙහි ප්‍රතිඵලයක් නිසාම ඈ දෙවිඳුන්ගේ ප්‍රසාදය ලත් දියණිය මෙන්ම ශුද්ධාත්ම ආනුභාවයේ උත්කෘෂ්ඨ වරප්‍රසාදය ලත් තැනැත්තිය බවට ද පත් වූ සේක. එලෙසින්ම මේ ලත් ත්‍යාගය නිසාම ස්වර්ගයෙහි හා පොළොවෙහි සියළුම ආකාරයේ මැවීම් අභිබවාලන්නටත් එතුමිය සමත් වූ සේක. එනමුත්, ඒ අතරම එතුමිය ආදම්ගේ වංශ පෙළපතට ද උරුමකම් කී බැවින් ගැලවීමේ ක්‍රියාදාමය අවැසි සියළුම මනුෂ්‍ය වර්ගයා අතර ඇයද එක් තැනැත්තියක් වූවාය. ශුද්ධාත්ම අනුග්‍රහය තුළ ශුද්ධවූ සභා මාතාව මහත් වූ භක්තියකින් හා දුහිතෘ ආදරයකින් අති දයාවන්ත මාතාව වන ඇය ගරුත්වයකට පාත්‍ර කොට ඇත." (LG. 53)

## මරිය තුමිය : තෝරාගත් දේව දාසිය

ගැලවීමේ ඉතිහාසය තුළ මරියාවන්ගේ ක්‍රියාදාමය සැලකීමට ලක් කරමින් සභාවේ විශ්වාසය නැවතත් තහවුරු කරමින් ඉහත ප්‍රකාශය තුළින් මේ කතිකාව ඉටු කර තිබේ. ලෝකයේ ගැලවුම්කාරිය ලෙසත්, දෙවිඳු අතිජාත පුතනුවන්ගේ මව ලෙසත් ඇය තෝරාගනු ලැබුයේ දෙවියන් වහන්සේගේම අති මහත් තෝරා ගැනීම නිසාමයි. එතුමිය ලත් ඇයුලුමේ මහානුභාවය නිසාම හදවත පිරී ගිය උද්දාමයකින් ඈ සතුටට පත් වෙමින් සර්වබලධාරි දෙවිඳුනට පසස ගී නංවායුයේ, "එතුමන් ඇයට මහත් දේ කළ බැවින්" මය.

දීන දාසිය, මනුෂ්‍ය දියණිය දෙවිඳුන්ගේ තෝරා ගැන්ම තුළම එතුමාණන්ගේ දේව පුතනුවන්ව දරා ගැන්මට හා ඒ පුතණුවන් මනුෂ්‍ය ශරීර ගැන්වීමේ දිව්‍ය කරාඩුව බවට පත්වීමට හිමිකම එතුමිය ලැබුවාය. සුරදූතයා ඇයට "නමෝ මරියනී, ප්‍රිය ප්‍රසාද පූර්ණ වන්තියනී" යන්න ආශිංසනය කළේ දෙවිඳුන්ගේ තෝරා ගැනීමේ භාග්‍ය ඇයට උරුම වූ නිසා දෙවිඳු වරප්‍රසාදයෙහි හිමිකාරීත්වයට ද ඇය ලක් වී සිටි බැවින් නිසා පමණක් නොව (ලූක් 1:30) ශුද්ධාත්ම මහානුභාවය ඇයව "වසා ගත්" (ලූක් 1:35) බැවින් හා සර්ව කාලීනවූ ගැලවීමේ ක්‍රියාදාමය සම්පූර්ණ කරවීම එතුමිය තුළින්ම ඉටුවන බව තහවුරු වී තිබූ නිසාමය. මිනිස් වර්ග යාගේ නිත්‍ය නියෝජිතවරිය සේ පෑ පෙළහර තුළ දෙවිත්වය මිනිස් වෙස් ගෙන ඉපදීමේ අභිරහස්මය ක්‍රියාදාමය මතින් මනුෂ්‍යයා ගලවා ගැනීමේ කාර්යය ඉටු කළ හැකිය යන්න පිළිගත හැකි තත්ත්වයට පත්විණි.

ඒ නයින්, මරියාවන් දෙවිත්වය හා මිනිසියාව බද්ධ කරවන පාලමක් බවට පත්විය. ඒ පාලම මතින් මිනිස් වෙස් ගත් දෙවිඳුන්ගේ ආගමනය සිදුවූ අතර උන්වහන්සේ මිනිස් ඉතිහාසයට ඇතුළු විමද සනිටුහන් කරවයි. දිව්‍යසිවරුන් තුළින් මිනිස් වග ඇමතීමේ කාර්යය තවදුරටත් ඒ දිව්‍යසිවරුන් මඟින් නොව එකී ප්‍රකාශ වීම මුළුමනින්ම ක්‍රිස්තුන් වහන්සේගේ මනු බව ගැනීම තුළින්ම ඉටු වන බව ප්‍රත්‍යක්ෂ වූ නිසා ගැලවීමේ ඉතිහාසය තුළ මරියාවන්ගේ දායකත්වය කොතරම්ද යන්න සිතා ගත හැකියි. ඇත්තෙන්ම එය කෙතරම් අනර්ඝ වූ භාග්‍යයක් ද?

"එම්මානුවෙල්" - "දෙවියන් වහන්සේ අප සමඟය" යන්න තහවුරු කරවමින් අප අතරට දෙවිඳුන් රැගෙන ඒමේ මාර්ගය බවට ද ඈ පත් වූවාය. සදාකාලික වූ නොවෙනෙන දෙවිඳුන් කෙනෙක් නොව, මනු බව ගත් දේව පුත්‍රයා; ජේසුස් ක්‍රිස්තුන් වහන්සේම විය. මේ කරුණ නිසාම පූජා ප්‍රසාදිවරයෙක් දිව්‍ය යාගය පූද කරමින් ශුද්ධවූ අල්තාරය මත ක්‍රිස්තුන් වහන්සේ ජීවමාන කරවනවාටත් වඩා මරියාවන් ක්‍රිස්තුන් වහන්සේව පූර්ණ මනුෂ්‍ය ස්වභාවයෙන්ම ලෝකයට දෙවාලමින් එම්මානුවෙල් - දෙවියන් වහන්සේ අප සමඟය යන්න හුවාදැක්වීමේ විශිෂ්ට දාසිය සේ දෙවිඳුන් විසින්ම තෝරා පත් කරගනු ලැබූ සේක.

එම නිසා කල්වාරියේ පුද ලද ගැලවීමේ යාගය නැවත නැවතත් යාගික පිදීමක් සේ දිව්‍ය අල්තාරය මත පිදීම ප්‍රතිෂ්ඨාපනයට පත් කළේ මරියාවන්ම බව දේව මාතාවන් වීමට ඇගේ දැයි කැමැත්ත ප්‍රකාශ කිරීම තුළින්ම කදිමට නිරූපනය කරයි. එම නිසා ඇගේ කැමැත්ත "එසේය" යන්න පූර්ණ විශ්වාසයකින් ප්‍රකාශ නොකරන්නට ගැලවීම පමණක් නොව දිව්‍ය යාගය පවා අත් විඳීම සිදුනොවන්නට තිබුණි. මෙම හේතු කාරනය නිසාම භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු සසුන් පියාණන් විසින් ඇයව "දිව්‍ය සත්ප්‍රසාදයේ වනිතාව" ලෙසද හඳුන්වනු ලබයි.

මන්දයත් "මංගලම් කී මොහොතේදීම මරියාවන් දෙවිඳුන්ගේ මාංශය හා රුධිරයන් ඔවුන් වහන්සේගේම පුතනුවන් ඒ ශාරීරික යථාර්ථයෙන්ම ඈ තුළ පිළිසිඳගත් එකී සිද්ධාන්තමය සිදුවීම සිදුවූවාක් මෙන්ම සමිඳුන්ගේ ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය සේ දෘෂ්‍යමාන ලබා ගන්නා පූජ සහ මිදිරස මඟින් සක්‍රමේන්තු මය වශයෙන් තමන් තුළ දෙවිඳුන්ගේ පැවැත්ම අත්දකින්නට සැදැහැවතාට ද අවකාශ සලසයි". (Ecclesia de Eucharistia 55) තම අභ්‍යන්තර පැවැත්මෙන්ම "එසේ වේවා" යනුවෙන් දෙවිඳුන්ගේ ආරාධනාවට පිළිතුරු දීමෙන් පමණක් නොව තමකම නසා ක්‍රිස්තුන් වහන්සේ ඉටු කළ මහා යාගය සිදු වූ කුරුසිය පාමුල සිට එතුමිය අත් දුටු අති මහත් වේදනා සම්භාරය විඳීම තුළ ද නව ගිවිසුමේ සුවිශේෂ පූජකවර භූමිකාව සිහිගන්වමින් දිව්‍ය සත්ප්‍රසාදයේ මාතාව බවට මරියාවන් පත්වී සිටින්නීය.

## අප ආදරණීය මාතාවෝ

සැබැවින්ම කුරුසිය පාමුල දී සුවිශේෂක ශුද්ධවර ජුවාම් තුමන් පවසන අයුරින්ම (ජුවාම් 19:25-27) එතුමියගේ මාතෘභාවයේ කර්තව්‍යය නවමු හා අභියෝගාත්මක මුහුණුවරක් ආරෝපිත කරගත් බව පැහැදිලියි. ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ කිට්ටුවන්ත ශ්‍රාවකයාට ඇගේ පුත්‍රයා ලෙස එතුමියව පවරා දුන් අතරම මරියාවන්ව සිය මෑණියන්සේ ඒ ශ්‍රාවකයාටම පවරා දුන් සේක. ඒ අනුව ගැලවුම්කරුවාණන්ගේ මෑණියන් සේ එතුමියගේ මාතෘත්වයේ දිගු කර්තව්‍යය ලෝකයේ අවසානය දක්වාම දීර්ඝ කරනු ලැබ ඇත. තමන් වහන්සේගේ සියළු ශ්‍රාවක කැල ඔවුන් ලත් දිව්‍ය සත්ප්‍රසාදයේ මහඟු කැඳවීමට විශ්වාසවන්ත වීම ඔවුන් තුළින්ම තහවුරු කරන්නට මරියාවන් හට විශේෂ කාර්යය භාරයක් කුරුසිය මත සමිඳාණන් ලබා දුන් සේක. එය සමිඳාණන් සිය මෑණියන්ට පෑ උපහාරයක් බඳුයි. මන්ද පියාණන් වහන්සේ සමඟ සහායෝගීව දායක වෙමින් කල්වාරියේ පිදූ තමන් වහන්සේගේ පරිත්‍යාගයේ පිදුම අවසන් අදියර කරා යන තෙක්ම මහත් වූ ආදරය පෑමක් තුළ එතුමිය තමන් වහන්සේ "ළඟින්ම සිටිය" (ජුවාම් 19:26) බව උන්වහන්සේට ඒත්තු ගිය බැවිනි.

තමන් වහන්සේගේ ශ්‍රාවකයන්ගේ මාතාව මෙන්ම මුළු මහත් ශු. සභාවේ මාතාව මෙන් සුවිශේෂී අයුරින් එතුමිය ඉටු කරන භූමිකාව පිළිබඳව ජේසුස් වහන්සේ තුළ තිබූ සැබෑ වැටහීම එයින් මොනවට පැහැදිලි කරයි. මුල් තැන්හිලා තමන් වහන්සේ වෙත පෑ මරියාවන්ගේ රැකවරණය, පෝෂණය හා බලගැන්වීම සිය කාර්යය ඉටු කිරීමට බලාත්මක වූයේ යම් සේද ඒ අයුරින්ම මරියාවන් තුළින් ඒ රැකවරණය, බලාපොරොත්තු ඇති කිරීම හා දිරි ගැන්වීම තම ශ්‍රාවකයින් හටත් නොඅඩුව ලැබෙන බවට ඉඟිවන සාධක පිළිබඳව ඔවුන් වහන්සේ තහවුරු ගැන්වීමක සිටි බවද පැහැදිලියි.

එම නිසා උන්වහන්සේගේ ශ්‍රාවක ශු. සභාව සහ එහි සාමාජිකත්වයේ වරම ලත් අප සැම හට එතුමිය දිව්‍ය පරමාදර්ශි මාතාව ලෙස ප්‍රදානය කරනු ලැබ ඇත. මෙකී පරම හේතුව නිසාම කතෝලික සභාව මුල් කාලීන යුගවල සිටම ඉතා සමීපවන්ත බවක් මධ්‍යයේ එතුමියට විශේෂ ගෞරවයක් පෙන්වමින් ක්‍රිස්තුන් වහන්සේගේම තෝරා ගැනීම මත අප සැමගේ ආදරණීය මාතාව බවට ද ඇය පිළිගත්තාය. අප සැමට එතුමියවත්, එතුමිය හට අප සැමවත් ලබා දුන්නේ ඔවුන් වහන්සේමයි. ඒ නිසාම ක්‍රි.ව. 431 දී මුළු දුන් එපීසියේ කතිකාව තුළ දී දෙවිඳුන්ගේ මාතාව - තියොටොකොස් - යන්න ගාම්භීරව ප්‍රකාශ කළ අයුරින්ම 1964 නොවැම්බර් 21 වනදා පැවැති දෙවන වතිකාන කතිකාවතේ තුන්වන සැසිවාරයේ අවසන් දේව මෙහෙය තුළදී අති උතුම් සයවන පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් මරිය වහන්සේව ගරු ගාම්භීරව මුළු මහත් ශු. සභාවේම මාතාවන් ලෙස නම් කරන ලදි. ජේසුස් වහන්සේ සිය ගැලවීමේ කෘත්‍යය කල්වාරිය මුදුනත කුරුසිය මත සම්පූර්ණත්වයට පත් කළ ඒ මොහොතේම සිය මාතාවන්ව අප හටත් අප සැමව සිය මාතාවන්ටත් පවරා දුන් බව මේ ප්‍රකාශනවල සිහිගැන්වේ. මෙකී අභිනය තුළ තමන් වහන්සේ මෙලොව සිය ආදරය දැඩිව පල කළ එකම තැනැත්තිය හැටියට ඒ උතුම් මාතාව අපට ලබා දෙමින් ඒ ආදරයම අත් විඳින්නට අපට මඟ සැලසූ අයුරු නිවැරදිව වටහා ගත හැකියි. මෙනයින් තමන් වහන්සේගේ ආදරයේ ඉතා අනර්ඝ ත්‍යාග දෙකක් ඔවුන් වහන්සේම අපට උරුම කර දී ඇත. කුරුසිය මත සිඳ බිඳුණු තමන් වහන්සේගේ ශරීරය දිව්‍ය සත්ප්‍රසාදය තුළින් සදාතනික ආහාරයක් සේ අපට දුන්නා පමණක් නොව ශ්‍රාවකත්වය කරා අප යන ගමනේ දී අපව ධෛර්යයමත් කරමින් මාතෘක රැකවරණය තුළ බලවත් වන්නට තම ආදරණීය මාතාවන්වද අප හට ලබා දුන් සේක.

## අප ගෘහයන්හි මරිය රැජිණිය

මේ එකම කථාවලියෙහි හද සනහාලන පුවත් හමුවන්නේ භාරකාරත්වය පවසාලන පහත සඳහන් මේ වදන් වලිනි. "ඒ මොහොතේ සිට ඒ ශ්‍රාවකයා තම නිවසට ඇය පිළිගත්තේ ය." (ජුවාම් 19:27). එබැවින් මරියාවන්ගේ කර්තව්‍යය මෙයින් තවත් ඔබ්බට දිව යන්නකි. කුරුසිය පාමුලින් එය හමාර නොවීය. "එසේ සිදුවේවා" යන්න ඇගේ අවනත වීම නොනවතින සදාතනික කාර්යයභාරයක් බවට ජේසුස් වහන්සේ පත් කළ සේක. ජේසුස් වහන්සේගේ දූත මෙහෙවර තුළදී එතුමිය පෑ සෙනෙහස, රැ කවරණය, පෝෂණය, උවැටන හා දිරිමත් කිරීම තමන් වහන්සේගේ ශ්‍රාවකයින් කරා දිගු කරන්නටත් බලවත් හැඟුමකින්ම එතුමිය කැපවූ සේක. ශුද්ධ ලියැවිලි සඳහන් කරන අයුරින්ම "ඒ මොහොතේ සිට" ඒ ශ්‍රාවකයා තම නිවසට ඇයව "පිළිගත්තේය." "මෙන්න ඔබේ පුත්‍රයා" යන වදන් වලින් ඇයගේම දූ පුතුන් සේ අපව එතුමියට භාර දුන් අතරම එනයින්ම "මෙන්න ඔබේ මෑණියෝ" යන වදන් ඇසුරෙන් තමන් වහන්සේ ප්‍රේම කළ ශ්‍රාවකයාට එතුමියව භාර දුන් ආකාරයටම අපේ සැලකුම් ලබන්නටත් ස්වර්ගීය මාතාවන් අපට භාර දී ඇත. එම නිසා එතුමියව අප නිවෙස් වලට භාර ගනු දැකීම ඔවුන් වහන්සේගේ අපේක්ෂාවයි.

භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් සඳහන් කරන ආකාරයට "ගොල්ගොතාවේදී ගැළවුම්කරුවාණන් විසින් තමන් වහන්සේගේ ගිවිසුම් ප්‍රඥප්තියෙන් ආරම්භ කරමින් සිය මෑණියන් වෙත දායාද කරන ලද සක්සුදක් සේ පැහැදිලි වන මේ දාරක ප්‍රේමය විශේෂාකාරයෙන් ක්‍රිස්තු ශ්‍රාවකයකුගේ ජීවිතය තුළින් ද විහිද යනු ලබන්නේ මරියාවන් පිලිබඳ එකී පැතිකඩ ද ඉස්මතු කරමිනි. මරියාවන් වෙත දාරක ප්‍රේමයෙන් ශ්‍රාවක ජුවාම් තුමන් මෙන්, තමන්වම පවරා දෙමින් ක්‍රිස්තු සැදැහැවතා ද "තමන්ගේම නිවස තුළට" ක්‍රිස්තුන් වහන්සේගේ මෑණියන් "පිළිගනිමින්" තමන්ගේ ඇතුළාන්ත ජීවිතය සකසාලන සියළු දෑ වෙතට එතුමියව කැඳවාලනු ලබයි. එය සැබවින්ම කිතුනු හා මිනිස් පුද්ගලත්වයට" කැඳවීමක් වැනියි යන්නද පැවසිය හැකියි. ඒ මොහොතේ සිට ඔහු "තම නිවසට ඇය පිළිගත්තේය". "එලෙසින් කිතුනු සැදැහැවතා ද එතුමියගේ "ත්‍යාගශීලි මාතෘත්වය" තමන්ව රැගෙන යාමක් පිළිබඳව විමසීමක් කරන්නේ ගැලවුම්කරුවාණන්ගේ මාතාවන් සිය පුතනුවන්ගේ සියළු කිට්ටුවන්තයින් හට අපරිමිත දයාව දක්වන බැවින්මයි" (Redemptoris Mater 45).

එම නිසා කල්වාරියේ එකී කුරුසියෙන් ක්‍රිස්තුන් වහන්සේ එක් එක් ශ්‍රාවකයා මෙන්ම සමස්ත ශු. සභාවද මරිය වහන්සේට උරුම කොට දී ඇත. එයින් හැඟෙන අර්ථය නම් මෑණියන්ගේ එකී භූමිකාවෙන් තොරව කිසිදු අයුරකින්වත් කතෝලික විශ්වාසය පිළිබඳව සිතීමටවත් ඉඩක් නොමැති බවයි. අපේ කතෝලික විශ්වාසයේ මරියාවන් පිළිබඳ මේ පැතිකඩය විශ්වාසනීයත්වය ජීවමාන කරවන අයුරු විහිදාලන පූර්ණ සංරචකයක් නැතිනම් අවයවයක් බඳුයි. ක්‍රිස්තුන් වහන්සේ හා මෑදුව බැඳී තිබෙන අපේ මේ ඇල්ම අහකට ගනු ලැබුවහොත් සැබෑ ක්‍රිස්තු ශ්‍රාවකත්වයේ පැහැදිලි රික්තකයක් දැකිය නොහැකි වනු ඇත. මරියාවන් වූ අප ස්වර්ගීය මාතාවන් සියල්ල පහසු කරනවා පමණක් නොව එකී සියල්ල ආදරණීය බවට ද පත් කරන සේක. "මෙතුමාණන් ඔබට කියන කොයි දෙයක් වුවද කරන්නැයි" (ජුවාම් 2:5) යන අවවාදයෙන් එතුමිය අපව ධෛර්යවත් කරන සේක. මක්නිසාදයත් සමිඳුන් හට කිසිවක් මහත් සේ ප්‍රසන්න වන්නේද එතුමන් තුළින්ම ඒ උදෙසා ප්‍රේමාන්විත පිළිතුරක් අනාවරණය කර ගත හැකි බව එතුමිය නිවැරදිව දන්නා බැවිනි. එය වඩාත් පැහැදිලිව ඇය දන්නේ සමිඳුන් හට වඩාත්ම කිට්ටුවන්තව එතුමිය සිටි බැවිනි. කානා නුවර ප්‍රාතිහාර්ය හා සම්බන්ධ වීම පළමු මොහොතේ එතුමාණන් පිටු දැකියමුත්, තමන් වහන්සේගේ මෑණියන්ගේ වචනය අනුව සේවක පිරිස ක්‍රියා කළ අන්දම දැක ජලය මිදිරස බවට පත් කිරීමේ ඒ මහා ප්‍රාතිහාර්ය සමිඳාණෝ ඉටු කළ සේක. ක්‍රිස්තුන් වහන්සේගේ සැබෑ ශ්‍රාවකත්වය කරා යෑමේදී ප්‍රේමාන්විතව හා මෑදු භාවයෙන් යුතුව ඒ මඟ යන්නට මරිය මවුන් හට අප පොළඹවාලීමක් කළ හැකි බව මෙයින් පැහැදිලි වේ.

## පව්කරුවන්ගේ මාතාවෝ

ගැලවීමේ ඉතිහාසය පුරාත්, ශුද්ධවූ සභාවේ කාර්යාවලිය තුළත් එලෙසින්ම ගැලවීම උදෙසා අප තුළ තිබෙන සාපිපාසාව මතත්, මරියාවන් ඉටු කරන මැදිහත්බවේ භූමිකාව අගරදගුරු පදවියේ සැදැහැවත් කතෝලික ජනතාව හැටියට අවබෝධ කර ගැනීමත්, පිළිගැනීමත්, අගයාලීමත් අත්‍යවශ්‍ය බව පැහැදිලිය. ශුද්ධවූ සභාවේ මුල් කාලීන අවධිය තෙක් දිව යන භාග්‍යවන්ත මාතාවන්ගේ මේ ප්‍රේමාන්විත ක්‍රියාන්විතය පිළිබඳව වටිනාකමක් ඇති මූලික වූ මිනිය නොහැකි එකී ඉගැන්වීම සමස්තයක් සේ ශුද්ධවූ සභාව උරුම කොට ගෙන ඇත. එම නිසාම එතුමිය ගැන කථා නොකළ සභා පීතෘවරයෙක්, ශුද්ධවූ සභාවේ කතිකාවතක් හෝ සසුන් නායකයෙක් නොමැති තරම් ය. භාග්‍යවන්ත මෑණියන් වෙත ජේසුස් වහන්සේ තුළ තිබූ ප්‍රේමාන්විත බව, සිය ප්‍රසිද්ධ ජීවිතය පුරාම සමීපව සිටිමින් කුරුසිය පාමුල දක්වාම එය අඛණ්ඩව සිදුවීම, නැගී එන ශු. සභාව තුළ ශ්‍රාවකයන් සමඟින් එක්සිත්ව නොකඩවා යාච්ඤා කිරීම (cfr. ක්‍රියා: 1:14) මෙන්ම දෙදහස් වසරක ඉතිහාසයක් හරහා විවිධ ස්ථානවල අඛණ්ඩවම සිදුවූ ඕ තුමියගේ දර්ශනය වීම් තුළ ද ආත්මයන් ගලවා ගනු ලැබීම සඳහා එතුමිය දක්වන අඛණ්ඩ කරුණාවද පාපයෙන් මෙන්ම සදාතනික මරණයේ මාර්ග වලින් ඉවත්ව මනස්ථාපනයේ හදවතක් ඇතිකර ගන්නා මෙන් ඕතුමිය කරන ආයාචනය ද අප සියළු දෙනා වෙනුවෙන් එතුමිය විහිදුවන ශක්තිමත් මාතෘක ප්‍රේමය සැබෑවටම දිස් කරවනු ලබයි. සැබවින්ම ජෝන් මේරි වියානි මුනිඳුන්ම මෙකී නිමිත්ත පහත සඳහන් අයුරින් විමසීමට ලක් කරයි. "අපි බරපතල පව්කරුවන් සේ වැටෙත්ද, අප වෙනුවෙන් බරපතලව අප කෙරෙහි එතුමිය තුළ මහත් අනුකම්පාවක් හා ලයාන්විත බවක් ඇතිවන්නීය. සිය මෑණියන්ගේ දෑස්වලින් කඳුළු ඉහිරුවන දරුවෙක් වෙත් ද එකී දරුවා එම මෑණියන් තම හදවතට මහත් සේම සමීප කර ගනී. දුර්වල එමෙන්ම අනතුරට ඉමහත් ලෙස විවෘත දරුවන්ගේ පිහිටට නිරන්තරයෙන් අම්මාවරු දිව නොයත් ද? රෝහලක බරපතලව ඔත්පල වී සිටින රෝගීන් කෙරෙහි වෛද්‍යවරුන්ගේ වැඩිමනත් අවධානය යොමු නොවෙත් ද? මෑදු බවෙන් මුසපත් මරියාවන්ගේ හදවත අප වෙත කෙතරම් ද යත් ලෝකයේ සියළු මව්වරුන් එක ගොඩකට දා එතුමිය හා සමාන කරනු ලැබුවත් ඒ සියල්ලන්ම ඇගේ ආදරය ඉදිරියේ කුඩා අයිස් කැබැල්ලක් සේ දිස්වෙනු ඇත. (Little Catechism of the Cure' of Ars, Tan Books and Publishes, Inc. Rockford, Illinois 61105, 1951, p 16) මේ මුනිවරයාම සඳහන් කරන ආකාරයට දේවත්වයේ පරම පිවිතුරු බව තුළ පාපයට දඬුවම් පැමිණ වීමට ජේසුස් වහන්සේ යොමු වූවත් කරුණාබර හා ආදරණීය හදවතකින් විශේෂ කොට දුබල වුවන් වෙත දයාවන්ත වූ අප ස්වර්ගීය මෑණියන් සිය පුත් රුවන ඉදිරියේ අප වෙනුවෙන් මැදිහත් වන්නීය. ඒ සඳහා අප කළ යුත්තේ ඒ මාතාවන්ගේ හස්තය ආදරයෙන් ස්පර්ශ කිරීම පමණි.

## මරිය වසර

මේ කරුණු හා තවත් හේතුන් මත සභාවත් සමඟ එක්ව සහස්‍රක දෙකක ඉතිහාසය පුරා ස්වර්ගීය මාතාවන්ට ප්‍රේම කරමින් දේව මාතාව අපගේම මාතාවන් කර ගනිමින් අගරදගුරු පදවි සසුන් සංඝය විශ්වාසයේ වසර අවසන් වන දිනය වන 2013 නොවැම්බර් 24 වැනිදා සිට 2014 ආගමන සමයේ පළමුවන ඉරිදා වන 2014 නොවැම්බර් 30 වැනිදා දක්වා වූ වසර "මරිය වසර" ලෙස ප්‍රකාශයට පත් කිරීමට තීරණය කර ඇත. මරිය වසර විශ්වාසයේ වසරට දිගුවක් ලෙස ගැලපෙනුයේ මරියාවන් විශ්වාසයෙන් පිරි දිවියට කදිම නිදසුනක් වන හෙයිනි. එතුමිය තුළ විද්‍යමාන වූ ගැඹුරු විශ්වාසය දෙවියන් වහන්සේගේ දිව්‍යමය වූ ගැලවීමේ සැලසුම යථාර්ථයක් බවට පත් කළ නිසාම එතුමිය මේ මහඟු විශ්වාසයේ කැඩපත ලෙස ගිනිය හැකිවේ. අගරදගුරු පදවි ආධ්‍යාත්මික පුනර්ජීවය සඳහා දියත් කරන ලද දිව්‍ය සත්ප්‍රසාදයේ දශකය තුළ මේ සිවුවන වසර වන අතර එය "මරිය වසර" ලෙස අප ප්‍රකාශයට පත් කරන්නේ මහත් සතුටින් සහ දෙවියන් වහන්සේගේ පියකරු උද්‍යානයේ සුපිපුන අභිරහස්‍යමය රෝස කුසුම වන ස්වර්ගීය මාතාවන්ට බැති පුද දෙමිනි. එතුමිය කෙරේ ඒකායන විශ්වාසයෙන් පරම බැතියෙන් රදගුරුතුමන්, පියතුමන්, පැවිද්දන් හා සියලු සැදැහැවතුන් වන අප බාල මහළු වූවත් එකට පෙළ ගැසෙමින් මෙසේ යදින්නෙමු. "මෑණියෙනි, අහෝ ස්වර්ගීය මාතාවෙනි, ඔබතුමියගේ දයාබර පුත්‍රයාණන් සමීපයට පැමිණීමට අපට උදව් කරමින් සහ ඔබතුමියගේ මාතෘක මැදිහත්කම තුළින් ආත්මික සහ ශාරීරික ප්‍රීතිය අත්දකින්නටත්, ඔබතුමියගේ ප්‍රේමණීය ආරක්ෂාව සහ රැකවරණය ද ජීවිතයේ පරිපූර්ණ ශුද්ධවන්තභාවය ද අත්දකින්නටත් අපට වරම් දුන මැනව."

එතුමියට කැප කළ මේ වසර පුරා දෙවියන් වහන්සේගේ ගැලවීමේ සැලසුම තුළ ඇය සම්පූර්ණ කළ අලංකාර කාර්යභාරය වැඩිදුරටත් අධ්‍යයනය කර ඉන් ශක්තිමත් වී ඇය වෙත වන අපගේ පෞද්ගලික ප්‍රේමයේ ලීලාව ගෙනහැර පාමින් පෞද්ගලිකව, හෝ පවුල් වශයෙන් හෝ සංඝයන් ලෙස දිනපතා ජපමාලය උච්චාරණය කරමු. වන්දනා ගමන් වලට හවුල් වෙමින් එතුමියගේ ශ්‍රී ලංකාවේ සිද්ධස්ථාන කරා පමණක් නොව හැකියාවක් තිබේ නම් එතෙරද යන්නට පෙළ ගැසෙමු. අගරදගුරු පදවි මඩු හා ලූර්දු වන්දනා ගමන් මේ වසර තුළදී සංවිධානය කරන්නට සැලසුම් කර ඇති අතර ඒවාට සහභාගි වෙමින්ද, නිරන්තර පාපොච්චාරණය සහ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම මඟින් එතුමියගේ කැඳවීමට සවන් දෙමින් හදවත් වෙනස් කරගෙන, ස්වර්ගීය මාතාවන්ගේ ප්‍රෞඪ දූ පුතුන් ලෙස හද පත්ලෙන් නැගෙන "අම්මා" යන ආදරණීය ඇමතුමෙන් අමතන්න ද කටයුතු කරමු. මරිය හමුදාව සහ දේව මාතා දරු සමාගම, සුබාරංචියේ පෙර මඟ දූතයන්, "පූජකවරුන්ගේ මරිය ව්‍යාපාරය", "ජීවමාන ජපමාල" කණ්ඩායම්

# ඬේරික අනුශාසනා පත්‍රය

මරිය තුමන් හට විශේෂ ලෙස යදින්නට කැපවූ ව්‍යාපාර ද ශක්තිමත් කරමින් ඒවාට බැඳෙමින් මෙම ආධ්‍යාත්මික නවෝදය අත්දකිමු.

**වැඩසටහන්**

**අගරදගුරු පදවිය තුළ මේ නිසාම අප පවත්වන මරි මවුන් හට කැපවූ මේ වසරේ පහත සඳහන් ප්‍රායෝගික වැඩසටහන් ක්‍රියාවට නැංවීම තුළින් ද, ධර්ම ප්‍රබෝධයක් ද, මරිය බැතිය තුළ උදාවිය හැකි ආධ්‍යාත්මික ප්‍රබෝධයක් ද ඇතිකරලීමට කටයුතු කරන මෙන් අගරදගුරු පදවි විවිධ අපෝස්තලික සේවාවන්ගෙන් ඉල්ලා සිටිමි.**

**අගරදගුරු පදවි ධර්මෝපදේශ අපෝස්තලික සේවාව -**

**ජනතාවගේ ධර්මෝපදේශ සූදානම සඳහා පහත දැක්වෙන වැඩපිළිවෙළ ඔස්සේ අරමුණු කරා යන්නට මම යෝජනා කරමි.**

- දහම් පාසල් දරු දැරියන්ට ගැලවීමේ ඉතිහාසය තුළ මරිය මාතාවන්ගේ කාර්යභාරයේ වටිනාකම විශේෂයෙන් ශුද්ධ ලියවිල්ල පාදක කර ගනිමින් සකස් කරන විශේෂ අත් පත්‍රිකා හෝ පොත් පිංච මඟින් ඒත්තු ගැන්වීම.
- රචනා, ප්‍රශ්න, චිත්‍ර හා ගීත ගායනා ආදි ක්ෂේත්‍රයන්හි විශේෂ තරග සංවිධානය කිරීම තුළින් කතෝලික සභාවේ මරිය බැතිය සහ මරිය මාතා චරිතාපදානය පිළිබඳ දැනුම හා බැතිය නංවාලීම.
- දේව ධර්ම නිකේතනය හා එක්ව පොත් හෝ අත්පත්‍රිකා මඟින් මරියවේදය හඳුන්වා දීමත්, විශේෂයෙන් මූලධර්මවාදී කණ්ඩායම් මරිය බැතියට එරෙහිව කරන චෝදනා වලට පිළිතුරු ලබා දීම.
- දේව ධර්ම නිකේතනයේ ද සහය ඇතිව දේශන මාලාවක් හෝ සති අන්ත සමුළු මීසම් මට්ටමින් සංවිධානය කරමින් මරිය වහන්සේ පිළිබඳ කතෝලික ඉගැන්වීම් ද - ගැලවීමේ ඉතිහාසය තුළ එතුමියගේ වැදගත්කම ද විශේෂයෙන් දෙවි සමිඳුන් ජේසුස් වහන්සේ අපට ලබා දුන්නේ එතුමිය තුළින් බව තහවුරු කිරීම.

**අගරදගුරු පදවි අධ්‍යාපන අපෝස්තලික සේවාව**

රජයේ හා පෞද්ගලික පාසල්වල සියලු කතෝලික දරුවන්ගේ සහභාගිත්වයෙන් වසර පුරා විශේෂ වැඩසටහන් මඟින් සභාව තුළ මරිය තුමියගේ කාර්යභාරය සහ මරිය බැතිය පිළිබඳව අවදි කර දැනුම්වත් කළ යුතුය. මේ වසර තුළ මරිය හමුදාවේ නව ශාඛා, දරු සමාගම හෝ කනිටු මරිය හමුදා පාසල්වල ආරම්භ කරන්නේ නම් මැනවි.

මේ සඳහා මරිය යැදුම්, නොවාන සහ මරිය තුමියට කැප කළ මාස වලදී පැවැත්වෙන විශේෂ වැඩසටහන් ඉතා ප්‍රයෝජනවත් ය. මරිය තුමියට පුදන යාච්ඤා ඔස්සේ පාසල් දරුවන් අතර දේව කැඳවීමේ බීජය රෝපණය කළ හැකි නම් එය මේ වසරට ඉතා වැදගත්

මෙහෙවරකි. අගරදගුරු පදවියේ අධ්‍යාපන කාර්යාලයට මරිය හමුදාව, තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය, ජීසස් යූත් වැනි ශිෂ්‍ය ව්‍යාපාර එකතු කරගෙන මේ වැඩසටහන් සංවිධානය කරන්නැයි මම ඉල්ලා සිටිමි. විදුහල්පතිවරුන් මේ සඳහා කාරුණිකව සහය වන්න. පාසල් මට්ටමින් වාර්ෂිකව මරිය රැළියක් පැවැත්විය හැකි නම් එයද ප්‍රශංසනීය දෙයකි.

**අගරදගුරු පදවි බයිබල් අපෝස්තලික සේවාව**

**බොහෝ මරියවේදය ප්‍රකාශන ශුද්ධ ලියැවිලි හා බද්ධව පවතින අතර අගරදගුරු පදවි බයිබල් අපෝස්තලික සේවා කොමිසමෙන් මා ඉල්ලා සිටින්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි දේව ධර්ම නිකේතන හා සම්බන්ධ වී මේ ගැන ක්‍රියාකාරී වන ලෙසය.**

- කතෝලික සභාවේ මරිය දේව ධර්මයේ ශුද්ධ ලියැවිලි සහ දේව ධාර්මික මූලයන් අලලා විශේෂ සම්මන්ත්‍රණ හෝ අධ්‍යයන වැඩසටහන් සංවිධානය කිරීම.
- කතෝලික සභාවේ ගැලවීමේ ඉතිහාසය තුළ මරිය තුමියගේ කාර්යභාරය හා කතෝලික ධර්මයේ මරිය තුමිය පිළිබඳ සමහර පැතිකඩ පිළිබඳව පවතින හා පැතිර යන සාවද්‍ය මතවාදයන් පිටු දකින අත් පත්‍රිකා හෝ පොත් පිංච එළිදැක්වීම.
- භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු, ශුද්ධෝත්තම පියතුමාගේ "රෝසාරියුම් විර්ජිනිස් මරියේ" අපෝස්තලික ලිපිය පාදක කර ගනිමින් ජපමාලයේ වටිනාකම පිළිබිඹු කැරෙන අත් පත්‍රිකා හෝ ලිපි ඉදිරිපත් කරමින් ඒ ගැන එළදායි අධ්‍යයනයක් කිරීම.
- දේව මාතාවන් පිළිබඳව ශුද්ධෝත්තම පියතුමන්ගේ ලේඛනයන්හි සාරාංශගත ඉදිරිපත් කිරීම (අති උතුම් සවැනි පාවුළු සසුන් පිය 'මාරියාලිස් කුල්ටුස්' භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුළු සසුන් පිය 'රෙඩිම්ටෝරිස් මාටර්' සහ දෙවන වතිකාන කතිකාවේ ශුද්ධවූ සභාව පිළිබඳ ධර්මානුශාසනාවේ එනම් ලුමෙන් ජෙන්සියුම් හි මරිය තුමිය ගැන ලියැවී ඇති අටවැනි පරිච්ඡේදය මෙන්ම කතෝලික ධර්මෝපදේශයේ මරිය දහම

**අගරදගුරු පදවි ජනවන්දනා අපෝස්තලික සේවාව**

**මරිය වසර තුළ ක්‍රමවත් ජනවන්දනා මෙහෙයන්හි ආලෝකය සඳහා අගරදගුරු පදවි ජනවන්දනා අපෝස්තලික සේවාව කළ යුතු දේ..**

- වසර සඳහා නව ලාංඡනයක් මෙන්ම නව මරි මව් ගීතිකාවක් සම්පාදනය කර අගරදගුරු වසමේ මරිය බැතිය අවස්ථාවලදී එය ගායනා කිරීම. සමාජ සන්නිවේදන අපෝස්තලික සේවාව හා සම්බන්ධ වෙමින් ගීතිකා ඇතුළත් සී. ඩී. පට නිෂ්පාදනය කළ හැකිය. මරිය තුමිය තේමා කරගත් ගීතිකා හෝ ගීත සම්පාදනය සඳහා තරගයක් සංවිධානය කළ හැකිය.
- මරිය තුමිය ගැන සභා ඉගැන්වීම් හා ශුද්ධ ලියවිලි පාඨ අඩංගු බැනර්, මීසම් දෙව්මැඳුරු මට්ටමින් සකස් කර බෙදා හැරිය හැකිය.
- ජපමාලයේ අභිරහස් සඳහා භාවනාශීලි යැදුම් සහ ප්‍රතිචාර මීසම් හා පවුල් මට්ටමින් භාවිතයට සකස් කර ප්‍රසිද්ධ කළ හැකිය.
- මරිය වසරේ ආරම්භය සඳහා මීසම්, සංඝ හෝ පාසල් මට්ටමින් සමාරම්භක මෙහෙයයන් සංවිධානය කිරීමේදී මේ කාර්යාලයට කලාපීය නාහිමිපාණන්ගේ හා පාසල් වැඩසටහන් සඳහා අගරදගුරු පදවි අධ්‍යාපන අධ්‍යක්ෂ තුමන්ගේ සහය ලබා ගත හැකිය.
- වසරේ දේවමාතා බැතියේ විශේෂ දින සහ ඒ දිනවල මෙහෙයයන් සඳහා මඟ සලකුණු අඩංගු පත්‍රිකාවක් පොත් පිංචක් සකස් කළ යුතුය.
- කලාපීය රදගුරු හිමිපාණන්ගේ, කලාපීය නාහිමිපාණන්ගේ සහ කලාපීය සම්බන්ධිකාරකයන්ගේ ද සහය ලබාගෙන අගරදගුරු පදවි මරිය වසරේ මඩු වන්දනා ගමන සහ දේව මාතා රැළියක් පූජක, පැවිදි හා ගිහි නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පවත්වමින් එය ඇමතීමට සුදුසු සම්පත් දායකයන්ට ඇරියුම් කළ යුතු වේ.
- ලූර්දු පුදබිමට යෑමට සතුටු අය සඳහා ජාත්‍යන්තර වන්දනා ගමනක් මෙරට සංචාරක නියෝජිතයන්ගේ සහය ලබා ගනිමින් ද සාමාන්‍ය බැතිමතුන්ට ද ඊට සහභාගි වීමට අවකාශ සැලසෙන පරිදි මිල අඩු පහසුකම් සහිත තත්ත්වයෙන් ද සංවිධානය කිරීම.
- ආගමන කාලය සහ චතාරික සමය සමඟි සන්ධානයේ සක්‍රමේන්තුව සඳහා සැදැහැවතුන් ප්‍රබල ලෙස රැගෙන ඒමට අවස්ථාවක් කර ගැනීමට කටයුතු කිරීම. මීසම් සේවක පියතුමන්ගේ සහ විශ්වාස සජීවිකරණ කණ්ඩායම්වල සහය ලබාගෙන දේවමාතාවන් සිත් හරවාගෙන පාපොච්චාරණය කරා එන්නැයි කළ ඇරියුම ගැන ජනතාව දැනුම්වත් කරන විශේෂ වැඩපිළිවෙලක් සැකසිය යුතුය. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නිරන්තරයෙන් ලබා ගන්නා බොහෝ දෙනෙකු පාපොච්චාරණය නොකිරීම අවාසනාවන්ත තත්ත්වයකි. අවශ්‍යතාවය වන්නේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම සඳහා පව් කමාව වැදගත් බව තරයේ පෙන්නා දීමයි. මේ ප්‍රතිඵලය ලබා ගැනීමට වැඩසටහන් දියත් කළ හැකිය.

**අගරදගුරු පදවි කරිටාස්**

**භාග්‍යවන්ත මරියතුමියගේ එළිසබෙත් තුමිය බැහැදැකීමේ සිද්ධියත්, එහිදී එතුමිය ඉදිරියේ ගැයුනු "මැග්නිෆිකාත්" හි අරුතත්, එතුමියගේ මැදිහත් වීමෙන් කානා නුවර විවාහ මංගල්‍යයට එක්ව සිටි ජනතාව සතුටට පත්වූ අයුරුත් සිතා බැලීම  යෝග්‍යය. මේ අනුව මරිය වසරේ වැඩසටහන් අතර අගරදගුරු පදවි කතෝලික සංඝය දිළිඳුන් හා අවශ්‍යතා සහිත වූවන් සොයා ගොස් උපකාර කළ යුතුයි.**

**එහෙයින් අගරදගුරු පදවි යුක්තිය, සාමය, මානව සංවර්ධනය සහ මැවිල්ලේ ඒකාග්‍රතා කොමිසමට මම මෙසේ ඇරියුම් කරමි.**

- මීසම් මට්ටමින් සමාජ ක්‍රියාකාරකම් සඳහා සජීවිකරණ වැඩසටහන් මෙහෙය වන විට විශේෂයෙන් අඩු පහසුකම් සහිත හා පීඩා විඳින්නන් කෙරේ අවධානය යොමු කරන්න.
- මීසමේ ජීවත්වන සිංහල හා දමිළ ජන කොටස් අතර වඩාත් යහපත් සබඳතා සහ අවබෝධය ගොඩනැංවෙන වැඩසටහන් මෙන්ම උතුරුකරයේ හා අගරදගුරු වසමේ මීසම් අතර හඳුනා ගැනෙන, ආධාර කරන චාරිකා කෙරේ විශේෂයෙන් ද, කතෝලික හා සෙසු ආගමික සැදැහැවතුන් අතර සබඳතා නැංවෙන (සමයාන්තර සමගිය) වැඩසටහන් ගැන ද විශේෂ අවධානයක් යොමු කරන්න.
- මේ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ව්‍යාප්ත කිරීමේ සංවිධානාත්මක මඟ තුළින් සභාවේ සමාජ දර්ශනය පිළිබඳ තොරතුරු සැදැහැවතුන් අතරට රැගෙන යා හැකිය.
- මීසම් සජීවිකරණය යටතේ අවම වශයෙන් නිවාස කිහිපයක් ගොඩනඟන්නට හෝ ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගැනීමෙන් මීසමේ වෙසෙන දිළිඳුම ජන කොටස් වෙත දේව මාතාවන් කෙරේ ගෞරව උපහාර පිදිය හැකිය.
- සාන්ත වින්සෙන්ති පාවුලා හෝ සෙත් සරණ කණ්ඩායම් එකී වැඩසටහනට හවුල් කර ගැනීමෙන් ඔවුන් වඩාත් ක්‍රියාශීලි කරවා සමාජීය වගකීම් වෙත අන්‍යයන් යොමු කරන කාර්යභාරය ඔවුන් තුළින් ඉටුකරවා ගත හැකිය.

**අගරදගුරු පදවි සමාජ සන්නිවේදන අපෝස්තලික සේවාව**

**ශීඝ්‍රයෙන් වර්ධනය වන මුද්‍රිත මාධ්‍ය, ගුවන් විදුලිය, රූපවාහිනිය සහ අන්තර්ජාලය හමුවේ මරිය වසරේ වැඩසටහන් සජීවිකරණයේ දී සැදැහැවතුන් වෙත මේ සියලු මාධ්‍ය පහසුකම් යොදා ගැනීම වැදගත් හා අත්‍යවශ්‍ය වී තිබේ. එහෙයින් අගරදගුරු පදවි සමාජ සන්නිවේදන කොමිසමට මම මෙසේ ඇරියුම් කරමි.**

- මරිය වසරේදී සෙසු අපෝස්තලික සේවා සංවිධානය කරන වැඩසටහන් වලදී සහයෝගයෙන් අන්‍යොන්‍ය උපකාරයෙන් කටයුතු කිරීම මඟින් එම වැඩසටහන් ශක්තිමත් කිරීම.
- අගරදගුරු පදවි සසුන් සංඝය තුළ මරිය බැතිය වඩාත් ප්‍රචලිත කිරීමට තුඩුදෙන වෙනත් වැඩසටහන් හා උපකාරක සේවා සැපයීමට කටයුතු කිරීම.
- විවිධ වැඩසටහන් නිෂ්පාදනය කිරීම හෝ සුදුසු පුවත්පත් විශේෂාංග, ගුවන් විදුලි හා රූපවාහිනි වැඩසටහන් මේ අරබයා නිපදවා තබා ගැනීම.
- මේ සුවිශේෂී මරිය වසරේදී දේවමාතාවන්ට උපහාරයක් ලෙස අපගේම ගුවන් විදුලි නාලිකාවක් ආරම්භ කර විසුරුවා හැරීමට කටයුතු කිරීම.

**අගරදගුරු පදවි පවුල් අපෝස්තලික සේවාව**

මේ සියලු වැඩසටහන් වලදී ඒවායේ වැදගත්ම කාර්යභාරය උසුලනුයේ කතෝලික පවුල්ය. එකට යදින පවුල එකට සිටී යන්න පිළිගත් මතයයි. එහෙයින් මේ වසරේදී අගරදගුරු වසමේ සියලු කතෝලික පවුල් එකමුතුකමින් පවුල් ජපමාලය උච්චාරණය කරමින් දේවමාතාවන්ට උපහාර පුදන්නට පෙළ ගස්වන ප්‍රබල වැඩපිළිවෙලක් සංවිධානය කළ යුතුය. සියලු පවුල්, එකමුතුව හා ආධ්‍යාත්මික පිබිදීමක් අරමුණු කරගෙන යාච්ඤා කළ යුතුය. එහෙයින් පවුල් අපෝස්තලික සේවාව මේ යැදුම් වැඩපිළිවෙල පතුරුවා හළ යුතුය.

එමෙන්ම අගරදගුරු පදවි බයිබල් අපෝස්තලික සේවාව සමඟ හවුල් වෙමින් සෑම කතෝලික පවුලකට බයිබලයක් ලබා දී යාච්ඤා කිරීමේදී එය කියවමින් ශුද්ධවූ ජපමාලයේ දිව්‍යමය අභිරහස් මෙනෙහි කිරීමට යොමු කරවීමෙන් දෙවියන් වහන්සේ වෙත කැපවූ විශ්වාසය එකිනෙකා තුළ වර්ධනය කළ හැකිය. කතෝලික පවුල් සේවාවට තමන්ටම වෙන්වූ විශේෂ ඉලක්කයක් ඇති අතර, එනම් මේ වසරේදී හා ඉන්පසු අගරදගුරු පදවියේ සියළු කතෝලික පවුල් දේවමාතාවන්ට උපහාර පිණිස දිනපතා ජපමාලය උච්චාරණය කිරීමට පෙළගැස්වීමයි.

මේ සියළු වැඩසටහන් වල සාර්ථකත්වය පැහැදිලිවම රඳා පවතින්නේ මීසම් සේවක පියතුමන්, සහයක පියතුමන්, ආයතන ප්‍රධානීන් හෝ විවිධ වූ ඒ ඒ සංඝයන්ගේ කැපවීම මතයි.

එම නිසා මරිය වහන්සේ මූලික වූ ආධ්‍යාත්මයක ගොඩනැඟීමක් සඳහා සැදැහැවත් ජනතාව මේ වරප්‍රසාදයෙන් පිරි වසරේදී සජීවක කරන්නට සියළු මීසම් සේවක පියතුමන්, පැවිදි පංතිවල ප්‍රාදේශියාධිපතිවරුන්, ආයතන ශ්‍රේෂ්ඨයින් මෙන්ම, කතෝලික පාසල්වල, දේව ධර්ම නිකේතනවල, කතෝලික සරසවි විද්‍යායතන වල හා අනෙකුත් කතෝලික සියළුම ආයතනවල ප්‍රධානීන් හට මම ආයාචනා කරමි. සමහර අය පවසන ආකාරයට මරිය වහන්සේ මූලික කර ගත් ආධ්‍යත්මයක් කිසිසේත්ම ක්‍රිස්තුන් වහන්සේගෙන් බැහැර වූවක් නොවන බව දැඩිව අවධාරණය කළ යුතුව ඇත. නමුත් එහිදී සිදුවන්නේ වඩාත් ක්‍රිස්තුන් වහන්සේ වෙතට එකී ආධ්‍යත්මික පන්නරය ලං කර ගැනීමට හැකිවීමයි. දෙවිඳුන් මිනිස් බව ගැනීම යන සිද්ධාන්තය නැතිනම් මාංශගතවීමේ අභිරහස එතුමිය තුළින්ම පමණක් පරිපූර්ණත්වයට පත්වීම මේ සබැඳියාවේ පදනමයි. එබැවින් මාංශගතවීමේ අභිරහස එතුමිය තුළින් සාක්ෂාත් වීම නිසා අප වඩ වඩාත් එතුමිය වටා එක් රොක් විය යුතු වන්නේ ඒ තුළින් ක්‍රිස්තුන් වහන්සේට සමීප වීමටය. අති උත්තම සයවැනි පාවුළු ශුද්ධෝත්තම පියතුමා ප්‍රකාශ කළ පරිදි සැබෑ කතෝලික දර්ශනය පිළිබඳවත්, භාග්‍යවත් දේවමාතා වහන්සේ පිළිබඳවත් දැනීම සැමවිටකම ක්‍රිස්තුන් වහන්සේගේ සහ ශු. සභාවේ අභිරහස් තේරුම් ගැනීමට මූලික වන කාරණාවයි. (Discourse of 21 st November 1964, AAS 56 (1964) 1015)

මේ අනුව අදාළ සියල්ලන්ගෙන්ද, විශේෂකොට මීසම් සේවක පියවරුන්ගෙන් ද මා ඉල්ලා සිටිනුයේ මරිය වසර අපගේ කතෝලික සැදැහැවතුන් භාග්‍යවත් දේව මාතාවන් කෙරෙහි අවදි කර එතුමිය ගැලවීමේ ඉතිහාසය තුළ ඉටු කළ අත්‍යවශ්‍ය දූත කාර්යය ගැන දැනුම්වත් කරන ලෙසයි. එමෙන්ම ආධ්‍යාත්මික සතුට සහ ගැලවීම සොයා යාමේ දී එතුමියගේ කාර්යයභාරය සාක්ෂාත් කර ගනු සඳහා මීසම් මට්ටමින් සැදැහැවතුනගේ දේව මාතා භක්තිය වැඩි දියුණු කිරීමට හැකි තරම් විවිධ වැඩසටහන් සංවිධානය කරන ලෙසත් විශේෂයෙන් මුද්‍රිත, දෘෂ්‍ය සංගත තැටි, සංගත තැටි සහ වෙනත් නිෂ්පාදන මඟින් මරිය දහම සහ දේව ධර්මය පහදා දෙමින් පවුල් යැදුම් දිරි ගන්වන්නටත්, විශේෂයෙන් පවුල් ජපමාලයත්, කොට්ඨාශ මට්ටමින් ජපමාල උච්චාරණයත් ප්‍රචලිත කරන්නට වැඩසටහන් ද, සමඟි සන්ධානයේ සක්‍රමේන්තුව නිරන්තරයෙන් ලබා ගැනීම සඳහා අවස්ථා සංවිධානය කරමින් ඊට ජනතාව දිරි ගන්වන්නටත් දේව මාතා මංගල්‍යයන් සහ වන්දනා ගමන් විශේෂයෙන් අගරදගුරු පදවි වන්දනා ගමන් සහ විශේෂ වැඩසටහන් වලට සැදැහැවතුන් දිරිගන්වා සහභාගි කරවන්නටත්, යාච්ඤාව තුළින් පවුල් එකමුතුව සජීවිකරණයට විශේෂ වැඩසටහන් සංවිධානය කරන්නට හා ඒවාට සහභාගි වන්නට ජනතාව දිරි ගන්වන්නටත්, දිළිඳුන් කෙරේ අවධානය යොමු කරමින් සමාජ වෙනස්කම්වල නියෝජිතයින් ලෙස ඒවාට බලපාන හේතූන්, සාමය ගොඩනැඟීම සහ සංවාදය දේව මාතාවන්ට ඔප්පු කරමින් අපගේ ස්වර්ගීය මාතාවන් මඟින් මේ වසර අවසානයේදී සැදැහැවතුන් සිය ජීවිත වෙනස් කර ගැනීම තුළින් දෙවියන් වහන්සේට පුදන තිළිණයක් බවට පත් කර ගන්නටත් පෙළ ගැසෙමු.

එලෙසම මේ වසර තුළ පූජක අපද, අප ජනතාවගේ ආධ්‍යාත්මික ජීවිත ශක්තිමත් කරලමින් එතුමිය කෙරේ විශේෂ ගෞරවාදරය දැක්වීමේ මාර්ගයක් ලෙස අප දෙව්මැඳුරු අලංකාර කර, පවුල් බැහැදැකීම හා ජනවන්දනා මෙහෙයයන් භක්තියෙන් හා ප්‍රේමයෙන් සිදු කිරීම, දිළිඳුන්ට උදව් කිරීම හා ඔවුන් කෙරේ කාරුණිකව කටයුතු කිරීමේ මුදු ගුණ ඇති එඬේරුන් ලෙස ක්‍රිස්තුන් වහන්සේගේ එඬේරික මුහුණුවර අප සතු කරගනිමින් ජනතා ආධ්‍යාත්මික ප්‍රබෝධය වෙත කැපවෙමු.

මෙම අපෝස්තලික හසුන අවසන් කිරීමට අති උත්තම සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා මේ අවස්ථාව අළලා කළ යැදුමක් යොදා ගනිමි.

"සාන්ත මරියනි, දේව මෑණියනි,
ඔබවහන්සේ ලෝකයට සැබෑ ආලෝකය වූ ජේසුස් වහන්සේ,
එනම් දේව පුත්‍රයාණන්
ඥඔබවහන්සේගේ පුත්‍රයාණන් ලෙස අපට දානය කළ සේක.
ඔබවහන්සේ මුළුමනින්ම දෙවියන් වහන්සේගේ කැඳවීමට හිස නමා,
තමන් ත්‍යාජ කරගනිමින් ඔවුන් වහන්සේ තුළින් ගලා එන යහපතේ
උල්පත බවට පත් වූ සේක.
අපට ජේසුස් වහන්සේ අනාවරණය කරමින් ඔවුන් වහන්සේ වෙතට
ගමන් කරන්නට මඟ පෙන්නුව මැනව. ඔවුන් වහන්සේට ප්‍රේම
කරන්නට හා ඔවුන් වහන්සේ ගැන දැනගැනීමට ද,
අපට ඉගැන්වුව මැනව.
ඒ මඟින් අපට ද සැබෑ වූ දේව ප්‍රේමයෙන් පූර්ණ වී මේ ලෝකය
මධ්‍යයේ යහපතේ පිපාසයෙන් පෙළෙන්නන්ට ජීවනදායක ජලයේ
උල්පත් වන්නට වරම් දුන මැනව. ඔබවහන්සේගේ
පුත්‍රයාණන් පිළිබඳව විශ්වාසයේ ගැඹුරු දැක්මක් ගොඩනඟා
ගන්නට උදව් කරමින් ඔබවහන්සේට ප්‍රේම කරන්නටත්, ඔවුන්
වහන්සේ පිහිටුවා වදාළ සභාව සහ ඔබවහන්සේ
ප්‍රේමයෙන් රැකගන්නටත් අපට වරම් දුන මැනව. ආමෙන් .

✠ **අති උතුම් මැල්කම් කාදිනල් රංජිත්**
කොළඹ අගරදගුරු හිමි

2013 සැප්. 08 දේවමාතාවන්ගේ උපන් මංගල්‍යය දිනයේදී නිකුත් කරන ලදි.
කොළඹ - ශ්‍රී ලංකාව

කලා සංග්‍රහය

# ජාතික කතෝලික ලේඛක හවුලට යොවුන් ලේඛක පරපුරත් එක්කර ගත යුතුයි

## විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණෝ අවධාරණය කරති

"ජාතික කතෝලික ලේඛක හවුල සිය 28 වන සංවත්සර උලෙළ සමරණ මේ මොහොතේ එහි ප්‍රගතිය පිළිබඳව ගැඹුරින් සිතා බැලිය යුතුයි. මෙම හවුල සඳහා යොවුන් ලේඛක පරපුරත් එක් කර ගැනීම නව නිලධාරී මණ්ඩලයේ වගකීම බව මගේ හැඟීමයි.

අද නවීන තාක්ෂණය කොතරම් දියුණු වුවත්, පෑන තුළින්, මොලය මෙහෙයවා ලේඛනයේ නියැලිය යුතුයි. ලේඛන කලාව හැම මාධ්‍යයකම උල්පතයි. කතෝලික ලේඛකයා හුදු මංගල්‍යය වාර්තා කරන්නකු නොවී, නිර්මාණශීලීව සිතා බලා ලේඛනයේ යෙදීම අනිවාර්ය වෙනවා. සිංහල භාෂාව මෙන්ම ඉංග්‍රීසි භාෂාවද ප්‍රගුණ කිරීම වැදගත් වෙනවා."

කොළඹ විශ්‍රාමික අගරදගුරු අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් මෙසේ අවධාරණය කළේ, කොළඹ 11, මල්වත්ත පාරේ, 6 වන පාවුළු මධ්‍යස්ථානයේ, කාදිනල් කුරේ ශ්‍රවණාගාරයේ දී, ඉකුත් ඔක්තෝබර් 27 දා මුළු දුන් ජාතික කතෝලික ලේඛක හවුලේ 28 වන සංවත්සර උලෙලේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වෙමිනි.

සභාපති පීටර් කැනියුට් පෙරේරා හා ලේකම් මැක්සිමස් රෝයි පෙරේරා මහත්වරු ප්‍රමුඛ පදවි විධායක කමිටුව උලෙළ සංවිධානය කර තිබුණි. මෙහිදී ජාතික කතෝලික ජනසංනිවේදන අධ්‍යක්ෂ, 'සියැලි හඬ' ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ගරු බෙනඩික් ජෝශප් ප්‍රනාන්දු පියතුමා මෙසේ පැවසීය. "28 වසරක ගමන් මගේ දී ජාතික කතෝලික ලේඛක හවුල සැබෑ මෙහෙවරක් ඉටුකර තිබෙනවා. අද මෙය "හැරවුම් ලක්ෂය" කට පිවිස ඇත. වර්තමාන යුගයේ මාධ්‍යය ජංගම දුරකතන, ෆේස් බුක්, වෙබ් අඩවි, අන්තර් ජාල



ආදියෙන් පූර්ණ වෙලා. තරුණ පෙල නවීන දේ සොයා යාමේ පිපාසයෙන් පෙලෙනවා. 'සියැලි හඬ' තුළින් එය ඔප්පු වී තිබෙනවා. ජාතික කතෝලික ලේඛක හවුල අද තරුණ ජවයකින් ශක්තිමත් වීම අවශ්‍ය යි."

"දේශීය කතෝලික අනන්‍යතාවය හා ජනමාධ්‍යය" යන තේමාව යටතේ තේමා දේශනය කළ ප්‍රවීන ලේඛක "ලේඛක ශිරෝමණී" කැලිස්ටස් ජයමාන්න මහතා මෙසේ පැවසීය. "සකල ජාතීන් ගෝලයන් කර ගන්නා ලෙසත් කල්පාන්තය දක්වා තමන් වහන්සේ සභාව සමග සිටින බවත් ජේසු සමිඳුන් වදාරා ඇත. පේදුරු තුමා ප්‍රථම ශුද්ධෝත්තම පියතුමා වශයෙන් කතෝලික සභාවේ නායකත්වය දැරූ බවත්, පාප් පරපුර එතුමන්ගෙන් පැවත එන අඛණ්ඩ පරපුරක් බවත් සඳහන් කළ යුතුයි. ලොව පැරණිතම වූත් කිතු සමිඳුන් විසින් ස්ථාපිත කරනු ලැබූවාවූත් එකම සභාව කතෝලික සභාවයි."

මෙහිදී ලිව්සුරු සම්මානය නෝමන් පලිහවඩන, කලාසූරු සම්මානය සිරස මාධ්‍ය ජාලයේ ප්‍රියන්ත විජේසිංහද කිව්සුරු සම්මානය ආර්. ජෝශප් ප්‍රිය මහතාටද පිරිනැමීය.

වසරේ කිතුනු කවියා ලෙස පස්කල් ජයමාන්න (සිංහල), ඇන්ටනට් ඩි කෘාස් (ඉංග්‍රීසි), 'ඥානාර්ථ ප්‍රදීපය' හොඳම පාඨක චින්තනය ජූඩ් ජේ ප්‍රනාන්දු, 'මැසෙන්ජර් හොඳම පාඨක චින්තනය ෆ්‍රැන්සිස් මාදිවල, වසරේ කිතුනු ඡායාරූප ශිල්පියා හැරල්ඩ් විතානගේ, කැමිලස් පෙරේරා විශේෂ සම්මානය, පුෂ්පා රොවෙල්, කුරුණෑගල රදගුරු හිමි සම්මානය බී. කේ. ටී. රෙජිනෝල්ඩ්, සභාපති ගෞරව සම්මානය. මැක්සිමස් රෝයි පෙරේරා වෙත පිරිනැමින.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි සහ පර්සි ප්‍රනාන්දු**

# "තුන්පෙති මල" ජූඩිත් චම්පිකා

**මීගමු කලාපයේ සෞන්දර්ය අංශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂිකා ජූඩිත් චම්පිකා අධ්‍යාපන ක්ෂේත්‍රයේ මම දකින්නේ ඒ භාරදූර වගකීම කරදරා සිටියද එය අකුරට කරමින් සැහැල්ලු සිතින් පොළොවේ පය ගසා සිටින්නියක ලෙසයි.**

බොහෝ සෞන්දර්යය විෂයන්හි න්‍යායාත්මක දැනුමෙන් ඉහළට පැමිණියවුන්ට, ප්‍රායෝගික තම විෂයෙහි දිග පළල නොදන්නා සේය. නමුත් ජූඩිත් චම්පිකා න්‍යායට මෙන්ම ප්‍රායෝගිකත්වයටද දක්ෂ බව 2013/10/26 ශනිදා මීගමු පුරවරයේදී හෙළි පෙහෙළි කළේය.

මාරිස්ටෙල්ලා ගෘහස්ථ වේදිකාවේ මුළුදුන් 'තුන්පෙති මල' නම් වූ ඒ අපූර්ව සංගීත සැඳෑවේ සුන්දරත්වය කාගේත් මතකයේ රැඳේවි. ගීත දොලහකින් සමන්විත මෙම සංයුක්ත තැටිය දොරට වැඩීමේ උත්සවයට හේතු වූ කරුනු කාරණා බොහෝ තිබෙන්නට ඇත.

ජයන්ත චන්ද්‍රසිරි කලාකරුවාණන් වේදිකාවේ කෙටි දෙසුමක් පවත්වමින් කියා සිටියේ තමා තවමත් සිතන්නේ ඇයි ජූඩිත් චම්පකා ජනප්‍රිය අග්‍රගන්‍ය ගායිකාවක් ලෙස ලංකාවේ සුපතළ නොවුනේ කියාය.

ඉතා මනරම් ලෙස මෙම උලෙළ මෙහෙයවූ ලාල් ආනන්ද අබේදීර සහෘදයාද පුන පුනා පැවසුවේ එයයි. සභා ගැබේ අදහසත් එයමැයි මට සිතේ. අසූව දශකයේ ගුවන් විදුලියේ A ශ්‍රේණියේ සරල ගී ගායිකාවක් ලෙස සංගීත ක්ෂේත්‍රයට පැමිණි ඇය තම හඬින් 'වැඩගත්ත මදි නේද?' කාටත් සිතුණි.

ජූඩිත් චම්පිකා නිමේෂයකට අදහස් බෙදා හදා ගන්නට තම කටහඬ අවදිකරයි. "මට මේ අවස්ථාව උදාකර දුන් දෙවිමහෝත්ත මයාණන්ට ප්‍රශංසා වේවා! ඇය නැවතත් කියයි.

දෙවියන්වහන්සේට ස්තූති වේවා! උන්වහන්සේ මගෙන් බලාපොරොත්තු වන්නේ සිරිලක පුරා දූ දරුවන්ට පාසල තුළින් සේවය කරන්නයි. උන්වහන්සේගේ සැලැස්ම වෙනස්. ඒකයි මගේ දේව කැඳවීම. මමත් සතුටින් ඒ කැඳවීම තුළ ජීවත් වෙමින් පාසල් පද්ධතියට උදවු කරනවා. සභාගැබ අත්පොළසන් නදින් පිරී යයි. 'තුන්පෙති මල' උලෙළ හමාර වී මා සමග අපේ ගායිකාව පළකළ අදහස මගේ හදේ තවමත් දෝංකාර දෙයි.

"මගේ දිවියට ශක්තිය සපයන බලවේග තුනයි. දෙවියන්, අම්මා සහ සංගීතයයි.

'තුන්පෙති මල' මෙම සංයුක්ත තැටියත් අම්මාගේ සිහිනයක්. එය අද සැබෑ වෙලා. මට හරි සතුටුයි. ජූඩිත් චම්පිකාගේ ඇස්වල සතුටු කඳුළු.

ගේය පදරචනයෙන් සුරම්‍යා මාපිටිය, මහින්ද චන්ද්‍රසේකර. ප්‍රසන්න ලියනගේ ඇතුළු කලාකරුවන්ද, ගී තනු නිර්මාණයෙන් රෝහණ වීරසිංහ, කපිල පුගලආරච්චි, නන්දසේන කටුවාවල, නවරත්න ගමගේ, සමන් නිශාන්ත ඇතුළු ශිල්පීන් දායක වී තිබුණි.

සංගීත ක්ෂේත්‍රයේ ඉදිරි ගමනට නිහතමානි කලාකාරිය, ජූඩිත් චම්පික සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂිකාවනි, ඔබට 'ප්‍රදීපයේ' සුපැතුම්!




**මෙරිල් මීපුර**

ෆිලීෂන් අබයකෝන්ගේ
# සුබස 251

## ප්‍රදීපය

ශාස්ත්‍රාලෝක, විද්‍යාලෝක, ඥානාලෝක, ඥානප්‍රකාශ යන වචන පේළිය දැනුමයි එළියයි වෙන්නොකළ හැකි බව හෙළිකරයි. ලංකා පුවත්පත් ඉතිහාසය පුරා බොහෝ සිංහල පත්‍රවල නම් ආලෝකය හා සම්බන්ධයි. ලංකා+ආලෝක=ලංකාලෝකය (1860) ලක්මිණි පහන (1862) ලක්රිවිකිරණ (1863) සරසවි සඳරැස (1880) සූර්යාලෝකය අර්ථය ඇති දිනකර ප්‍රකාශය (1885) රිවිරැස (1887) සත්‍යාලෝකය (1895) මීට නිදසුන්ය. කාලයක් පැවති දවස පත්‍රයේ ඉරිදා පත්‍රය වූ රිවිදින පෝය නිවාඩු ක්‍රමය සමග රිවිරැස විය. පළමු කතෝලික පුවත්පත අරුණෝදය (1863) යි. 1866 සිට ඥානාර්ථ ප්‍රදීපය නිරුපද්‍රව ම තවමත් පළවේ. 2010 දී පටන්ගත් දමිළ කතෝලික පුවත්පත ඥාන ඔලියි. තේරුම ඥානාලෝකයයි. දිනමිණ, රිවිර හා සංස්කෘත දිනකර කෙරෙන් නම් ලත් තිනකරන් පත්‍ර සූර්යයා අර්ථයෙනි. ලංකාදීප හා කලකට පෙර නතරවුණ ජනතා පත්‍රවල නම් ප්‍රකෘතියෙන් පිහිටීම විශේෂයකි. ලංකාදීප සඳහා තේරුම ගතහැක්කේ ලක්පහන් ලෙසය. දූපතට දීප කියන්නේ පාලියෙනි. සකු වදන ද්වීපයයි.

"ලංකාදීපයේ දීපයයි ඔබ" යන ගීතිකා පදයේ මෙන් පහනට හරි වදන දීපයයි. දීපනී යයිද වචනයකි. දීපනී දැරියකට ලස්සණ නමකි. ප්‍ර' උපසර්ගය නිසා ප්‍රදීපය ඇතිවිය. ප්‍රයත්න, ප්‍රමුදිත, ප්‍රචණ්ඩ, ප්‍රකෝප, ප්‍ර+ආරම්භ=ප්‍රාරම්භ මෙනි.

'කුකුළා නැති ගෙදර එළිවෙනවා නොදැනේ' යැයි පැල්කවි පදයකි. අද රෑ ලැග පහන්වූ කල මෙන් දරුවන් නිදිගන්වා පහන් වූ කල යයි වෙස්සන්තර ජාතකයේ දැක්වේ. එළිවෙලා, පහන් වුණා, පාන්දර, හඳපාන යයි වහරේ එමටය. රෑ පානේ නම් රෑ යාමේ යනුයි.

ශුද්ධ බයිබලය ආරම්භයේම ආලෝකය වේවායි වදාළ ප්‍රථම දේව වචනය සේ ප්‍රදීප මංගල කලාපයේ මුල්පිටුවේ ගීතාවලියේ 119:105 මුදුන්ගතවේ. "ඔබවහන්සේගේ වාක්‍යය මගේ මාර්ගයට පහනක්ද ගමනට එළියක්ද වේ."

නැණරුත් පහන් පළමු කතුතුමාණෝ තම ගැඹුරු දැනුම නම් පහන දල්වා එය බඳුනකට යට නොකොට සියල්ලනට එළිය විහිදෙන ලෙස එය පහන් රුකක් මත තැබූහ. ලෝකයා ඔබේ සත්ක්‍රියා දැක ස්වර්ගයෙහි වැඩ වසන ඔබේ පියාණන් වහන්සේට ප්‍රශංසා කරන පිණිස ඔබේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබලවන්න (මතෙව් 5:16).

# නර්තනයේ දක්ෂ කිතුනු ශිල්පිනිය



උඩරට පහත රට නර්තනයෙන් දස්කම් පාන දක්ෂ කිතුනු කලාකාරියක් පසුගියදා අපට කඳාන උස්වත්ත ප්‍රදේශයේදී මුන ගැසුනි. අනාගතයේදී **අපගේ හෙළ කලාවට, දිදුලන මැණිකක් බවට පත්වනවාට සැකයක් නැති ඇය, කොටහේන යහපත් එඬේරාගේ කන්‍යාරාමයේ සිප් සතර හදාරන ශෙහානි ලාවන්‍යා සිසුවියගේ අනාගත එකම ප්‍රාර්ථනාව නම් අප කලා ක්ෂේත්‍රයට යසස් කීර්තියක් ලබාදෙමින් දිවයිනේ සුපතල නර්තන ශිල්පිනියක් වීමටය.**

පුංචි සංදියේ සිටම ඇය නර්තනයට දැක්වූයේ ඉමහත් ආශාවකි. ඒ ආශාව මුදුන්පත් කර ගැනීමේ පරම අභිලාශයෙන් ඇය වසර 10 ක් තිස්සේ බුදවත්ත ගුරු පියාණන් හා හේමාලි බුදවත්ත ගුරු මැණියන් යටතේද ශාස්ත්‍රීය කොටස් හැදෑරීම සඳහා ප්‍රවීන නර්තන ආචාර්ය දේශශක්ති. දේශ කීර්ති, නාට්‍ය කලා විශාරද, දේශ බන්ධු ආචාර්ය සුනිල් තල්ගහගොඩ හා නිර්මලා තල්ගහගොඩ ගුරු මැණියන්ගෙන්ද උඩරට නර්තනය හදාරා ඇති ශෙහානි ලාවන්‍යා ඔවුන්ගේ ආභාසය තුරුළු කරගෙන පසු ගියදා මීගමුව අඟුරුකාරමුල්ල පන්සල් භූමියේදී සුනිල් තල්ගහගොඩ ගුරු පියාණන් යටතේ ශිර්ෂ ආභරන පැළඳ නාට්‍ය ශිල්පි සම්මානයෙන් පිදුම් ලැබුවාය.

ශෙහානි ලාවන්‍යා නර්තන තලයේ මුදුන් හිනි පෙත්තටම යෑමේ පරමාර්ථය පෙරදැරි කරගෙන කලා භූෂණ නර්තනාචාරිනී පද්මිනී දහනායක ගුරු මැණියන් යටතේ භාරත නාට්‍යම් හදාරමින් නර්තනයට අමතරව පාසලේ බාහිර කටයුතුවලට මුල්තැන දෙමින් පාසලේ තූර්ය වාදක කණ්ඩායමේ නායිකාව ලෙසින් ද කටයුතු කරමින් සිටින ඇය ඇගේ උපන්ගම වන කඳානට පමණක් උරුමවූ සිය ආදරණීය පියා වන හැරල් මල්ලවආරච්චි මහතා විසින් අධ්‍යක්ෂණය කරන ලද "ශුද්ධවූ සෙබස්තියන් මුනිඳුන්ගේ ජීවන චරිතය නොහොත් වාසප්පුවෙහි නැටුම් අධ්‍යක්ෂණයෙන්, ඇඳුම් නිර්මාණයෙන් හා නර්තනයෙන් ඇගේ දායකත්වයද ලබාදී ඇති බැව් ඇය අප හා පැවසුවේ ඉමහත් සොම්නසකිනි.

ශෙහානි ලාවන්‍යා උසස් පෙළ විෂය ධාරාවන්ගෙන් තවදුරටත් නර්තනය හදාරන ඇගේ එකම අනාගත පැතුම වන්නේ තම හැකියාවෙන් කලා ලොවට යසස් කීර්තියක් ගෙනදීම බැව් පවසන්නීය. අපි ඇගේ අනාගත ප්‍රාර්ථනාවල මල් පල හට ගැන්වේවා යැයි ශුභාසිංශන පතමු.

**ඩබ්. එම්. ලෙස්ලි පෙරේරා**

# චීන සැඟවුණු සභා රදගුරු හිමි ස්වර්ගස්ථ වේ



චීන සැඟවුණු කතෝලික සභාවේ රදගුරු හිමිවරුන්ගේ ප්‍රධානියා මෙන්ම එම රදගුරු මණ්ඩලයේ සභාපති වරයා ද වශයෙන් සේවය කළ, පීටර් ලියු ගුආංදොන් හිමි 94 වසරක් ආයු වළඳා. ඔක්තෝබර් මස 28 වෙනිදා ස්වර්ගස්ථ වූ බැව් කතෝලික පුවත් වාර්තා කරයි.

උන්වහන්සේ වතිකානයේ ශුද්ධාසනය විසින් අනුමත කරනු ලැබූ රදගුරු තුමා වශයෙන් සැඟවුණු සභාව තුළ සක්‍රීයව කටයුතු කළ සේක. ඉහතදී, නිවාස අඩස්සියට ගනු ලැබූ එතුමා, පූජක පිරිසකගේ මෙහෙයුම යටතේ සිර අඩස්සියෙන් රහසේ බේරී ගොස් 16 වසරක් හොර රහසේ ජීවත් වූ සේක. ස්වර්ගස්ථ වූ අතිඋතුම් ගුආංදොන් රදගුරු තුමාගේ සිරුර පූජක වරුන් හා ගිහියන් පිරිසක් විසින් රහසේ භූමදාන කරනු ලැබීය.

අතිඋතුම් ගුආංදොන් රදගුරු හිමිපාණන් විසින්, 1989 වර්ෂයේදී, චීනයේ ඊනියා දේශානුරාගී සංවිධානයට එරෙහිව සැඟවුණු රදගුරු සම්මේලනය ස්ථාපිත කරනු ලැබීය. කීප වතාවක්ම එතුමා චීන බලධාරීන් විසින් සිර බාරයට ගනු ලැබීය. තාඩන පීඩන හා සිරගතවීම් උග්‍ර වෙද්දී එතුමාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් රදගුරු කොස්මස් ෂී එරුදාන් පත් කරනු ලැබීය; ඉන් පසුව, වර්ෂ 1994 දී අතිඋතුම් ගුආංදොන් රදගුරු තුමා නිවාස සිර අඩස්සියේ තබනු ලැබීය; ඊට වසර 3 කට පසුව එතුමා රහසේ පූජකවරුන් විසින් ගෙනයනු ලැබීය. එලෙස මරණය දක්වා එතුමා රහසේ ජීවත් වූ සේක. එතුමා නිරතව සිටි සේවාවෙහි කොස්මස්හි රදගුරු තුමා නිරතව සිටියත්, 2001 වර්ෂයේදී එතුමාව ද බලධාරීන් විසින් පැහැර ගනු ලැබීය; එතෙක් මෙතෙක් එතුමා කොහේදැයි කිසිවෙක් නොදනිති.

# සිරියාවේ දරුණුතම කිතුනු ඝාතනය

ඔක්තෝබර් මස 04 වෙනිදා සිරියානු ත්‍රස්තයෝ සදාද් නම් ඓතිහාසික කිතුනු ගම්මානයකට කඩා වැද, කිතුනුවන් 45 දෙනෙකු මරා දැමූහ.

ඝාතනය කැරුණු කිතුනුවන් අතර, ස්ත්‍රීන් ද කුඩා දරුවන් ද වූවා; මෙම පහරදීමෙන් කිතුනුවන් 30 කට වැඩි සංඛ්‍යාවක් දරුණු තුවාල ලබා ඇත. එමෙන්ම තවත් 10 කට වැඩි සංඛ්‍යාවක් සොයා ගන්නට බැරිය. තවද, කිතුනු නිවාස හා දේපොල ගණනාවක් ගිනි තබා විනාශ කොට ඇත. පසුගිය දෙවසර තුළ ඇති වූ අති දරුණු කිතුනු ප්‍රහාරය මෙය බැව් කිව යුතුය. මෙම වේදනාකාරී පුවත් ජාත්‍යන්තර මාධ්‍ය වෙත හෙළි දක්වනු ලැබුවේ, සිරියානු ඔතොඩොක්ස් සභාවේ අගරදගුරු සෙල්වානෝස් බූට්‍රෝස් අල්නෙමේ හිමිපාණන්ය.

තවද ඒ ඒ මාධ්‍යයන් විසින් වාර්තා කැරෙන පරිදි ගිනි තබා ඇති දෙව් මැඳුර තුළ තුබූ ඓතිහාසික කිතුනු පත පොත හා ලේඛණ ගිනි බත් කොට ඇත. එමෙන්ම කිතුනු පාසල් ද, ආරෝග්‍ය ශාලාවන් ද විනාශ වී ගොස් ඇත. මෙම විනාශය පසුගිය වසර දෙක තුළදී සිරියානු ගැටුමෙන් සිදුවූ දරුණුතම ඝාතනය වශයෙන් ලෝ පුරා මාධ්‍යයන් විසින් ද වාර්තා කොට ඇත. "අපි අපේ කිතුනු ශෝකාලාපය ලොවට හඬගා ප්‍රකාශ කළත්, අපේ සහයට තවමත් කිසිවකු ඉදිරිපත් වී නොමැත.

ලෝක ජනතාවගේ හෘද සාක්ෂියට කුමක් වී ඇත්ද? අප ලෝකවාසි කිතුනු ජනතාව ගෙන් ඉල්ලා සිටින්නේ, සිරියානු කිතුනුවන් වෙනුවෙන් නොතිත් දේව කන්නලව්වේ යෙදෙනා ලෙසයි.

# ආගමික නිදහස වෙනුවෙන් සටන් කළ දෙදෙනෙක් හිරේට

වියට්නාමයේ වින් හි ප්‍රදේශයේ අධිකරණය විසින්, ඔක්තෝබර් මස 23 වෙනිදා නාගෝ වැන් කොයි සහ නුයෙං වැන් හායි යන මැදිවියේ කතෝලික බැතිමතුන් දෙදෙනා ආගමික නිදහස හා ප්‍රසිද්ධියේ කතාබහා කිරීමේ වරදට මාස 07 ක සිරදඬුවමකට පාත්‍ර කරනු ලැබීය.

එම වරදට චූදිතයන් සේ ඔවුන් සිරභාරයට ගනු ලැබුවේ, මේ වසරේ ජූනි මාසයේදීය; ඔවුන්ට විරුද්ධව කැරුනු චෝදනා අති අසාධාරණ බැව් පවසමින් කිතුනු පිරිස් විරෝධතාවයක් පැවැත්වූයේ පෝල් නුයෙං තායි හොප් රදගුරු තුමාගේ නායකත්වය යටතේය. මෙම විරෝධතාවට ජාත්‍යන්තර සහය ද ලැබී, එම චූදිතයන් නිරපරාදේ සිරගත කිරීමෙන් නිදහස් කරනා ලෙසට මහජන ඉල්ලීම් වර්ධනය වෙද්දී නඩු විභාගයක් අරඹා ඇත්තේ එම අවිහිංසාවාදී සිරකරුවන් දෙදෙනාගේ පවුලේ අය පවා දැනුවත් නොකර හොර රහසේය. එලෙස උසාවියේ දොරගුලු ලා පැය තුනක විභාගයකින් පසුව, ඔවුන් දෙදෙනා මාස 07 ක් සිර දඬුවමකට පාත්‍ර කොට දඬුවම් දී ඇතැයි යන්න පමණක් ප්‍රකාශයට පමුණුවා ඇත.

# සිරියාවේ යුද ගැටුම් මත ජේසුගේ යෝධ පිළිරුවක්

අති දරුණු යුද බිමක් බවට පත්ව ඇති සිරියාවේ ක්‍රිස්තුන් වහන්සේගේ යෝධ ලෝකඩ පිළිමයක්, දෙසතියකට ඉහතදි නිරාවරණය කරනු ලැබීය.

මෙම පිළිරුව අඩි 40 ක් උසය; ඊට පාදක වන උස් භූමි නිර්මාණය සමගින් පිහිටි අඩි 104 කි. දෑත් දිගු කරගිති පීතෘක සෙනෙහසින් යුත් පිළිරුව සිරියාවේ පැරන්ණන් පා තැබූ කොන්ස්තන්තිනෝපල් සිට ජෙරුසලමට ගිය මාර්ග යට මුහුණලා වෙරුබිම් කඳු වැටිය මත පිහිටා ඇත. යුධ කෝලාහල මැද මෙම දැවැන්ත ප්‍රතිමාව නිමකිරීමට වසර 8 ක් ගතවී ඇත. දිගින් දිගට පවත්නා කිතුනු ප්‍රහාරයන් මධ්‍යයේ මෙවන් කාර්යයක් කිරිම පිළිබඳව බොහෝ දෙනෙකු ට ඇත්තේ මවිතයකි. එහෙත් එම නිර්මාණ පිරිසගේ මතය වන්නේ, එසේ දැවැන්ත ජේසුගේ ආදරය පිළිබිඹු කැරෙන පිළිමයක් ඔසවා නංවාලීම සමිඳුන්ගේ කැමැත්ත බවයි.

මෙම දැවැන්ත කාර්යය සඳහා මූලිකත්වය දී ඇත්තේ මහා බ්‍රිතාන්‍යයේ කිතුනු සංවිධානයකි. තවද ඒ සඳහා විවිධාකාරයෙන් සහාය සපයාදී ඇත්තේ රුසියාවේ ඇතැම් පිරිස් විසිනි. මෙම කාර්යයේ තේමාව වී ඇත්තේ, "මා පැමිණියේ ලෝකය ගලවා ගන්නයි" වශයෙනි.

# සසුන් පියා සූ කී හමුවෙයි



ප්‍රැන්සිස් සසුන් පියා, ඔක්තෝබර් මස 28 වෙනිදා, වතිකානයේදී, මියන්මාරයේ විරුද්ධ පක්ෂ නායිකා හා නොබෙල් ත්‍යාග ලාභී අවුන් සාන් සූකී හමුවූ සේක.

එතුමා විසින් ඇගේ දිගු ප්‍රජාතන්ත්‍රවාදී අරගලය පිළිබඳව සාකච්ඡා කළ බැව් ද වාර්තා වේ. ප්‍රජාතන්ත්‍රවාදී දිගු ගමනක් වෙනුවෙන් ඈ ගෙන ගිය අවිහිංසාවාදී ක්‍රියාදාමය ද එතුමන් විසින් අගය කළ බැව් ද ප්‍රකාශ කළ සේක. එතුමා මෙලෙස ද ප්‍රකාශ කළ සේක. "රට තුළ අන්තර් ආගමික සංහිඳියාව සඳහා මම නිරන්තරයෙන් යැදීමි. පක්ෂපාති නොවී සියළු ආගමිකයන් සමග කටයුතු කරමින්. මියන්මාර සමාජය එක්සත් කැරුමට කතෝලික සභාව කටයුතු කරනා බවට මම සහතික වෙමි."

මියන්මාර ආගමික සංහිඳියාව වෙනුවෙන් විරුද්ධ පක්ෂයේ ප්‍රධානියා ලෙසින් ඈ දිගින් දිගට ක්‍රියාමාර්ගයන් නොගන්නා බවට, ඈ වෙත චෝදනාවක් පවතිනවා. මේ සමයේ, සුදොතුම් පියා හමුවීම වැදගත් යයි ද දේශපාලන විචාරකයෝ පවසති. මෑත කාලයේ මියන්මාරයේ ඇතිවූ ආගමික අරගලයන්ගේ ප්‍රතිවිපාක කෙරෙහි ජාත්‍යන්තර කළ කිරීමක් තවම පවතී.

පසුගිය 2012 ජූනි මාසයේ සිට මේ දක්වා මියන්මාරයේ බෞද්ධ හා මුස්ලිම් බැතිමතුන් අතර ඇතිවූ ආගමික අරගල හේතුවෙන්, 250 ක් පමණ දෙනා මරුමුවට පත්ව, 140,000 වැඩි දෙනෙක් උන් තැන් අහිමිව අසරණ වී ඇතැයි ද වාර්තා වේ.

# මුස්ලිම් සහෝදරත්වයේ ත්‍රස්තයෝ දෙව් මැඳුරකට පහර දෙති

ඊජිප්තුවේ නැගෙනහිර ප්‍රදේශයේ, ෂේටූන් හී දේව මාතාවන්ට කැපකළ දෙව් මැඳුර රටේ සියළු කිතුනුවන්ගේ ගෞරවාදරයට ලක්වූ පිදුම් ස්ථානයකි. වර්ෂ 1968 ජූනි මස 02 දිනැ පැවැති මෙහෙයකදී දේව මාතා වහන්සේ සියළු බැතිමතුන් හමුවේ දර්ශණය වූ සේක.

එම නිසාවෙන් මෙම දෙව් මැඳුර ඊජිප්තුවේ සකළ කිතුනු ජනතාවගේ මෙන්මැ ඇතැම් මුස්ලිම් වරුන්ගෙ ද වන්දනා ස්ථානයක් බවට පත්ව ඇත. මේ නිසාවෙන්, මෙම ජාතික දෙව් මැඳුර බොහෝ අවස්ථාවන් හිදී කිතුනු විරෝධි මුස්ලිම් ත්‍රස්තයන්ගේ පහරදීම් වලට පාත්‍රවී ඇත. ඔක්තෝබර් මස 20 වැනි දිනැද මෙම දෙව් මැඳුරට පහරදීමක් සිදුවිය. මෙම දෙව් මැඳුර ආසන්නයේ මුස්ලිම් පල්ලියක් ද වේ. මුස්ලිම් වරුන්ගේ සිකුරාදා යාච්ඤාවෙන් පසුව, බොහෝවිට කිතුනු විරෝධි මුස්ලිම් සහෝදරත්වයේ ත්‍රස්තයෝ දෙව් මැඳුරට පහරදීමට මාන බලනා හෙයින් කිතුනු තරුණයෝ ද අවධානයෙන් පසුවෙති.

නොවැම්බර් මස 01 වෙනි සිකුරාදා දිනැ ද මුස්ලිම් පල්ලියේ යාච්ඤාවෙන් පසුව දෙව් මැඳුර ආසන්නයෙන් යද්දී දේව මාතා දෙව් මැඳුරට පහරදීම ආරම්භ විය; ඒ පිළිබඳව දැන සිටි කිතුනු තරුණයන් ද පිරිසට පහරදීමට සූදානම් වූහ. එතැනට වහා පැමිනි පොලිස් නිළධාරීන් කිතුනු හා ඉස්ලාම් නායකයන් දෙපාර්ශවය අතරට පැන මහත් උත්සහයක් දරා දිගින් දිගට පැතිර යමින් පැවැති දෙපාර්ශවය අතරේ ගැටුම එදිනැ සමාදානයක් කරා ගෙන යන ලදි. සිදුවූ සියල්ල වීඩියෝ ගතකොට ජාත්‍යන්තර මාධ්‍යයන් විසින් හෙළි දක්වා ඇත. එම වීඩියෝ දර්ශණ අනුව, මහා විනාශයක් වැළැකී ගොස් ඇති අයුරු දැක බලා ගත හැක. එහෙත් මෙවන් ගැටුම් වලැ නිමාවක් කවදා සිදුවේ දැයි සියල්ලෝ කම්පාවෙන් පවසති.

# ඉන්දීය හින්දු ත්‍රස්තයෝ ප්‍රොතෙස්තන්ත කිතුනුවන්ට පහර දෙති

ඔක්තෝබර් 27 වෙනි ඉරිදා, මහාසස්ත්‍ර ප්‍රාන්තයේ එක් ප්‍රොතෙස්තන්ත යැදුම් ශාලාවකට කඩා වැදුණු. "බජ්රාන්ග් ඩාල" නම් ත්‍රස්ත කණ්ඩායමට අයත් 35 ක පමණ තරුණ ත්‍රස්ත පිරිසක්, යකඩ පොලු වලින් කිතුනු බැතිමතුන්ට පහර දුන්හ.

තවද ඔවුන් විසින් කෑ මොර දෙනු ලැබුවේ, කිතුනුවන් විසින් හින්දු භක්තිකයන් බලහත් කාරයෙන් කිතුනු ආගමට හරවා ගනු ලබන්නේ යයි පවසමිනි; පහරදීමෙන් සතර දෙනෙකු මාරාන්තික තුවාල ලබා ඇත; මෙම පුවත දන්වනු ලැබීමෙන් එතැනට පැමිණි පොලීසිය හින්දු ත්‍රස්තයන් 23 දෙනෙකු අත් අඩංගුවට ගනු ලැබීය.

දෙසතියකට ඉහතදී ද එම ශාලාවේදී මෙහෙයන් පවත්වද්දී කඩා වැදුණු හින්දු තරුණ පිරිසක් විසින් පූජක වරයාට මාරාන්තික පහර දී ඇත. මෙම සිද්ධීන් කතෝලික මාධ්‍ය වෙත ප්‍රකාශ කරමින් පළාතේ කතෝලික සංගමයේ ලේකම් ජෝශප් ඩයස් විසින් පවසා ඇත්තේ, මෙම සිද්ධීන් වෙනුවෙන් පොලීසිය විසින් ද මන්දගාමී පිළිවෙතක් අනුගමනය කරනා බවයි.

# ක්‍රීඩාව සභා හදවත කරා දිව යයි



ක්‍රීඩා ලෝකයේ කතෝලික සභාවේ කාර්යභාරය සාකච්ඡාවට පාත්‍ර කරවීම සඳහා "ක්‍රීඩා ලෝකයේ ඇදැහිළි වන්තයෝ" යන තේමාව යටතේ සම්මන්ත්‍රණයක්, පසුගිය සතියේ, ශුද්ධාසනයේ සංස්කෘතික කවුන්සලය විසින් වතිකානයේ පවත්වනු ලැබීය.

සාකච්ඡා වාරය අරඹමින් කවුන්සලයේ ලේකම් මොන්සිඤ්ඤෝර් මෙල්කොර් සාන්චේස් තුමා මෙලෙසින් ප්‍රකාශ කළසේක. "ක්‍රීඩාව ද, පූර්ණ කිතුනු ජීවනයක් සඳහා අවැසි බවයි; නූතන ලෝකයේ ක්‍රීඩා පැවැත්ම ද දූෂණය වී ඇති හෙයින් ක්‍රීඩාවේ වටිනාකම් යළි ස්ථාපිත කිරිම සඳහා කතෝලික සභාව විසින් කළ හැකි හා කළ යුතු කාර්ය භාරයන් ද වේ."

මෙම සම්මන්ත්‍රණය පවත්වනු ලැබුවේ, විශ්වාසයේ වර්ෂය පදනම් කරගෙනය. මෙම සම්මන්ත්‍රණයට සහභාගි වූවන් අතර, ජාත්‍යන්තර වෘත්තිමය ක්‍රීඩකයෝ ද, කතෝලික ක්‍රීඩා සංවිධාන වලැ ප්‍රධානීන්ගේ ද රටවල් කීපයක රදගුරු මණ්ඩල වල නියෝජිතයෝ ද, වූහ. ශුද්ධාසනයේ සංස්කෘතික කවුන්සලයේ සභාපති කාදිනල් ගියන්ප්‍රැන්කෝ රවාසි උතුමාණන් විසින් කිතුනු ජීවිතය කෙරෙහි ධාර්මික ක්‍රීඩාව මහත් සේ බලපාන හෙයින්, මීසම් ද, සංවිධාන ද තුළට ක්‍රියාකාරීව සම්බන්ධ කර ගැන්ම ඵලදායි කාර්යයක් වනු ඇත. එලෙස කිරීමෙන් විශේෂයෙන් තරුණ තරුණියන් එක්වීම ද, කැපවීම ද හා බෙදා ගැන්ම ද තුළින් කිතුනු වටිනාකම් තුළ ජීවත්වීමට අවකාශ සැළැසෙනු ඇතැයි ද එතුමා විසින් අවධාරණය කරනු ලැබීය.

මෙම සාකච්ඡාවට පෙරහුරුවක් ලෙසින් සා. පීතර චතුරශ්‍රයේ සකස් කරනු ලැබූ මීටර් 100 ක් පමණ දිග ධාවන පථයේ "ඇදහිල්ලේ මීටර් 100 ක දිවිල්ල" යන තේමාව යටතේ ක්‍රීඩාවක් ද පැවැත්විණි. එම ඇදැහිල්ලේ ධාවන දිවිල්ලට 5000 ක් පමණ දෙනා සහභාගි වූහ. එම ධාවනය ජේසන් ගාර්ඩනර් නම් ඔලිම්පික් රන් පදක්කම් ලාභියා ඇතුළු තවත් බොහෝ ලෝ පතළ ක්‍රීඩකයෝ ද සහභාගි වූහ.

බැසිල් ෆොන්සේකා විසිනි

විශේෂාංග



# ගිලට්නය සුනිලුන්ට පමණක් ද?

**සුනිල් සාන්ත සමාජයේ ලේකම් විජිත් කුමාර් සේනාරත්න විසිනි**

**දඹදිව ගොස් ගැයුම් වැයුම් හදාරා, ඒ දෙඅංශයේ ම ඉහළ ම සංගීත සාමාර්ථයන් ලැබූ පළමු ලාංකිකයා ඔහු. ඉන්දියානුවකු සේ මුලින් කල් ගෙවූ හෙතෙම, කුමරතුඟු මුනිදසුන් ගේ හෙළ බස් ආරෙන් මත් වැ, ඉක්බිති වැ හැබෑ හෙළයකු වූයේ ය. සුනිල් ශාන්ති, සුනිල් ශාන්ත සහ සුනිල් සාන්ත ලෙසින් ඔහු ගේ නම පිරිපහදු වූයේ ද එකී හෙළ පිබිදීම කරණකොටගෙන ය.**

1946 වසරේ “ඕලු පිපීලා” සහ “හඳපානේ” යන ඔහුගේ මුල් ම ගීත තුළින් සුනිල් සාන්ත ඉතා සාන්ත වූ නවතම සංගීත රටාවක් අප රටට හඳුන්වා දුන්නේ ය. ඒ ගී සඳහා තාල තරංග එසේත් නැතිනම් තබ්ලාව වැනි තාල භාණ්ඩ වැයුණේ ඉතා අඩු හඬෙකිනි; ඇසෙන නෑසෙන තරමට සියුම් ව ය. සුනිලුන් එ සේ කළේ හේතු ඇතිව ය. එනම් ඔහු හඳුන්වා දුන් නවතම සංගීත ආර, උත්තර භාරත නොඑසේ නම් රාගධාරී ශෛලියෙන් මුදා ගැනීමට අවැසි ම පියවරක් සේ සැලකීමෙනි. ශාස්ත්‍රීය ගී පසෙක තිබේවා. සාමාන්‍ය සරළ හින්දි හෝ ද්‍රවිඩ ගීයෙක වුව, එහි රිද්මය උලුප්පාලනු වස්, බොහෝ විට තාල වාද්‍ය භාණ්ඩ ගණනාවක් වාදනය කෙරේ. විවිධ වර්ගවල බෙර පහක්, හයක් හෝ ඇතැම් විට දහයක්, පහළොවක් වුව යොදා ගැනේ. එහෙත් සුනිලුන් ඒ වෙනුවට මුල් තැන දුන්නේ, ගැයුමට, තනුවට හා පද මාලාවට ය. සංගීත භාණ්ඩ ගණනාවක් වැයීමේ හැකියාව, නොඅඩුව තිබූ සුනිල් සාන්තයන් ගේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වූයේ සිතාරය යි. එසේ වුවද ඔහුගේ මුල් අවධියට අයත් ගී කිසිවෙකින් සිතාර හඬ නොඇසිණි. ඊට ද හේතු වූයේ පෙර සඳහන් කරුණමැ යි. තමාගේ නවතම සංගීත ආර මැනවින් තහවුරු වන තෙක්, ඉන්දියානු සංගීතයේ ස්වරූපය දනවන සිතාරයේ හඬ ඊට ඇතුළුවීම වළකාලීමයි. අරිසෙන් අහුබුදු සූරීන්, පබැඳූ, “කුමරතුඟුන්ගේ අගේ - දවසැ දවසැ හෙළ දැයේ” සුනිලුන් තරමක් පසුකාලීන ව ගැයූ සිතාරය හැඬවුණු මුල්ම ගීත ය යි.

දේවාර් සූර්යසේන, හියුබට් ප්‍රනාන්දු, සරණගුප්ත අමරසිංහ බඳු ස්වල්ප දෙනෙකු හැර, එදා යුගයේ සිටි සංගීතඥයින් ගායක - ගායිකාවන් යොමු වූයේ ද අනුගමනය කළේ ද ඔවුනට පිහිට වූයේ ද උත්තර භාරතීය රාගධාරී සම්ප්‍රදායම ය.

එනමුත් සුනිල් සාන්තයන්, දේශීය, පෙරදිග, අපරදිග, වංග, බයිලා ආදී සෑම සංගීත ශෛලියකින් ම ගත යුතු පමණට ආභාෂය ලැබ ගත්තේ ය. කෙසේ වුවද සුනිලුන් එය සිදු කළේ රිළවුන් පළතුරු කන්නා සේ නො වේ. බෙහෙත් සීට්ටුවකට ඔසු කිරන්නා සේ ය. ඇවැසි පමණට කළං, මන්චාඩි වලිනි. ලාංකීය අනන්‍යතාව යටපත් නො වනා අන්දමට ය.

මේ අයුරින් සරු පොහොරකින් යුතු වූ හෙයින්, සුනිල් ගී නිර්මාණ, යසට පිපී, දසත සුවඳ විහිදුවාලන්නට සමත් වූයේ ය. නේක ශෛලියේ ගී ප්‍රිය රසික බඹරුන්, සුනිල් ගී මල් වටා රොද බඳින්නට වහ වහා යුහුසුලු වූහ.

නිමැවුම් බැරි නාමික වෙසරදයකු, රාගධාරී සංගීතයට ම ගැති ව එහි මැ ඇලුණු මහාචාර්යවරයකු ඇතුළු අල්ප වූ පිරිස්, මනා පෙනුමැති, නේක වූ මියුරු ගැයුම් වැයුම් සරි සුනිලුන් පිළිබඳ අපමණ බියෙන් හා ඊර්ෂ්‍යාවෙන් පෙළෙන්නට වූහ. ගුණයෙන් රසයෙන් මැනවින් වැඩෙන සුනිල් සංගීතය හා සුනිල් සාන්තයන් තවදුරටත් ක්ෂේත්‍රයේ රැඳී සිටියහොත් තම තමුන් ගේ නො හැකියාව ඉස්මතු වී සිය රාගධාරී ඇඹල ගායට තැන් ඇහිරෙන බැව් වටහා ගත්හ. එබැවින් ඔවුහු සුනිල් සංගීතයට එරෙහි ව අභූත චෝදනා ගොනු කරන්නට වූහ. සුනිල් සංගීතයේ ඇත්තේ පල්ලියේ කන්තාරු සංගීතය සහ වංග සංගීතය යැයි බලධාරිහු ඇවුළුහ. ශාස්ත්‍රීය ගී ගැයීමට නො හැකි බැවින් සුනිල් වෙනස් ගී ගයන්නේ යැයි අමතර දමා ගැසීමක් ද කළෝ ය. එවිට සුනිල් සාන්තයන් “මේ හෝ පලු වනයේ”, “මගේ හිමියාණනි”, “කෝ මගේ දරුවෝ”, “ලලිත ලවංග”, “සුමිහිරි සුවඳැති” වැනි රාගධාරි ශාස්ත්‍රීය රටාවේ ගී ගයා චෝදිතයන් නිරුත්තරව ඇද වැටුණු පඹයන් බවට පෙරළීය. විවිධ වෙස් ගෙන මේ කෙනහිලි කිරීම් යළි යළිත් සිදුවිණි. ඔවුහු සුනිලුන් යනෙන ගුවන් මැදිරි තුළ හිස් අරක්කු බෝතල් පවා සැඟවූහ.

සුනිල් සාන්තයන් ගේ සංගීත ක්‍රමයට එරෙහි, විලාප ආලාපයේ ම රැඳී හඬා



සුනිල් සාන්තයන් සමඟ අයිවෝ ඩෙනිසුන්

වැටුණවුන් හට රටේ පිළිගත් වියත්හු “සිළුමිණ”, “දිනමිණ”, “ලංකාදීප”, “සිංහල ජාතිය”, “සිංහල බෞද්ධයා” ආදී එකල ප්‍රචලිත ව පැවැති පුවත්පත් මඟින් නිසි පිළිතුරු සැපයූහ. සුනිලුන් යන මඟ නිවැරැදි බැව් ද පෙන්වා දුන්හ. එහෙත් රටේත් ජාතියේත් අවාසනාවට බළධාරිහු පෙර කී පුහු සෝෂාකාරීන් ගේ අසත්‍ය මතයට නැඹුරු වූ හ. මනහර ලෙස ගලාගිය සුනිල ගී ගඟ හරස් කිරීමේ වැඩ ඇරඹූහ. “අහිංසක”, “අංගුලිමාල”, කෙනෙකු කරවීම සඳහා භාත්ඛණ්ඩ සරසවියේ අධිපති, සුනිලුන්ගේ ම ගුරුතුමා, මෙරටට ගෙන් වූවෝ ය. සුනිල් සාන්තයන් ගැයුමෙහි වැයුමෙහි සැබෑ හපනෙකු යැයි සහතික කළ, ඉන් නොනැවතී එතැනට පත් පළමු ශ්‍රී ලාංකිකයා යැයි වෙසෙසින් සඳහන් කළ, රතන්ජන්කර් පඬිවරයා ලවා ම සුනිල් “අහිංසක” නො ව “අංගුලිමාල” යැයි සටහන් ලබා ගන්නට වෑයම් කළහ. පාලකයින් ද සුනිල් සාන්තයන් ගේ දස්කම් යටපත් කරන්නට එකඟ වූ තැන, සියල්ල ඉවසා ගත නො හැකි වූ ඔහු “අහිංසක” ලෙස ම සියල්ල හැර දමා ඉවත් ව ගියේ ය. සිංහයා සහ අසූචි තවරාගත් ඌරා අතර යෝජිත සටන අප්‍රමාණ වූ සුනිල රසිකයනට සිහිපත් වූවා නිසැක ය. වෙනෙසකි. මෙතැන අසූචි තවරා ගත් ඌරන් රංචුවකි.

සුනිල් සාන්තයන් ගේ ගුවන් විදුලි මුල් රස ගී මාලාව, වසර 1946 සිට 1952 වන සය වසරට සීමා විණි. ඉන් ඔබ්බට 14 වසරකට සුනිල් සංගීතයට ගුවන් විදුලියේ දොර නිසි ලෙස නැරිණි. එ සේ වූයේ තව තවත් රස නිර්මාණයන් හි යෙදීමට තිබූ ඔහු ගේ හොඳ ම කාල වකවානුවේ දී ය. ඒ සා පුළුල් කාල පරාසය තුළ සුනිල කෝකිලයා ගොළු කොට නො තබා කූජනයේ යෙදෙන්නට ඉඩ ප්‍රස්ථා ලැබුණේ නම්, අපට කොවුල් සරින් සරු අපේ මැ වූ ගීතාවලියක් ඇති බැව් ලොවට විදාලීමට යහමින් ඉඩ තිබිණි.

සුනිලුන් පෙරළා තම ගම් පියසට ගොස් දුෂ්කර, එහෙත් ආදර්ශවත් යහපත් දිවි පෙවෙතක් ගෙවනා සඳ, ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් ඔහු සොයා ජා-ඇල දෙහියාගාතට ගියේ ය. ඒ මර්සලීනු ජයකොඩි පියතුමා සමඟ ය. වදන් පොරෙන් මෙන් පීරිසුන්ගේ පළමු සිනමා සිත්තමේ ගී තනු නිමැවීමට ඔහු එකඟ කරවා ගති. ‘රේඛාව’ නමැති එම තිරපටයේ වූ, අදටත් බෙහෙවින් ජනප්‍රිය මියුරු ගී එකින් එක ගෙන දිගු පැහැදිලි කිරීම් වුවමනා නො වූවද, නැගිය යුතු පැනයක් වේ. සුනිලුනට අකුල් හෙළා නොඑනා ගම් ගියවුන් ගෙන් පැවත එන, තැන තැන, එහා මෙහා වන, නිසි




සෙවිල්ලක් බැලිල්ලක් නොමැති ව පෙර චෝදනා ම වමාරන අල්පයින්ගෙන් නැගිය යුතු පැනයක් වේ. ඒවා තුළ රැඳුණේ කිනම් කන්තාරු ශෛලියක් ද? කෙබඳු වංග ශෛලියක් ද? ඒ ගී තුළ පිරී ඉතිරී ගලා ගියේ මියුරු සුනිල් සංගීතය මිස අන් කවරක් ද?

ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් අදියුරු ඔහු ගේ දෙවැනි සිනමා පටයට ද සුනිලුන් ගේ සහභාගිත්වය තහවුරු කර ගැනීමට තරම් පින්වත් විණි. “සන්දේශය” නම් එහි ආ ගීතාවලිය ද පෙර පරිද්දෙන් ම යසට රසට ප්‍රකට විය. එහි ආ සුනිල් තනු සඳහා ආර්. මුත්තුසාමි පමණ ඉක්මවා යොදා තිබූ බෙර වැයුම් හා ෂනායි වැයුම් පිළිබඳ සුනිල් තුළ වූයේ කිසියම් අසතුටෙකි. එහෙත් ඉන්දියානු ආරට වූ එවැයුම්, එ ගී තුළ පැණි පිරී තිබූ මියුරු මධුර සුනිල් සංගීතය යටපත් කිරීමට තරම් කිසිසේත් රළු නො වී ය. පෙර පැනය ම නඟන්නට සිදු වේ.

සුනිල් සංගීතයේ සුවඳ මිස, තිබුණා ද කන්තාරු හෝ වංග පුසුඹක් එ ගී තුළ?

තේ කෝප්පයේ ද කිඹුලන් දුටු, විවේචනය මිස වැඩ බැරි ඔස්තාද්ලා සහ තමන් ගේ කල්පනා ලෝකය ම සහසුද්දෙන් නිවැරැදි යැයි සිතූ මහාචාර්යවරු, අපේ අනන්‍යතාව සහිතව මැනවින් වැඩී ආ සුනිල් සංගීතාවලියට දැමූ වස විසෙහි දුගඳ මනැසින් හෝ යටපත් කළ නොහේ. එහෙත්, මෙත් සිතින් ඒවා පසෙකැලා විමසිය යුතු අවබෝධ කරගත යුතු තවත් කරුණකට යොමු වීම ඉතා මැනව යයි සිතේ. ඒ අරබයා අප ද ඉතා ආශාවෙන් රස විඳි විඳිනා ගී තුනක් නිදසුනට ගනිමු. පළමුවැන්න, ඩබ්ලිව්. එච්. එන්. එස්. විජේසිරි ගේ පබැඳුමෙකි. රාගධාරි සංගීතයට ම බෙහෙවින් නැඹුරු ව සිටි, ඉතා ගැඹුරු නිවැරැදි ස්වර ස්ථානවල ම පිහිටා මනාව ගැයුම් කළ එච්. ඩබ්ලිව්. රූපසිංහ සංගීතවේදියාණන්, රුක්මණී දේවිය සමඟ ගැයූ මතු සඳහන් ගීතය විමසමු.

“ශ්‍රී මුනි ගෞතම - ශ්‍රී මුනි ගෞතම
දේවසි රස තැබූ ශ්‍රී පාදේ
මෛත්‍රී කරුනා වීත රාග හිමි
අමා සදන්නේ වී සැම ලෝසත
කළේ ප්‍රබෝධේ ආනන්ද වේ”

විලම්බ ලයෙන් ගැයෙන මේ ගීතයට තාල වාද්‍ය වැයුමක් නැත. මේ ලිපිය කියවන, ගීතය ද සිහිපත් කළ හැකි, සංගීත ඥානයෙන් ද පොහොසත් ඇත්තෝ අපමණ ය. මඳක් විමසන්න. සිතින් මුමුණන්න. නැද්ද එහි කන්තාරු ගී රටාව? මෙය ස්වතන්ත්‍ර ද අනුකාරක දැයි නො දනිමු. නැද්ද එහි ගීතිකා යැදුම් දෝංකාරය?

**දෙවැනි ගීය**

වන මල් පියලි සලා - මී අඹ පලා උරා
ලෙහෙණින් ගීත ගයන්නා - ලෙහෙණින් ගීත ගයන්නා

මෙය මල්ලිකා ද සිල්වා ගායිකාව ද තවත් වරෙක ඉන්ද්‍රාණි විජේබණ්ඩාර ගායිකාව ද ගායනා කොට තිබේ. පී. ඩන්ස්ටන් ද සිල්වා මෙහි සංගීත නිර්මාපකයා ය. ගීතයේ තාල වාදනය ද මැනවින් ශ්‍රවණය වේ. වංග සම්භවයක් ඇති “පන්කාජ් මලික්” නමැති සංගීතඥයා - ගායකයා ගැයූ ගීතයක් ඉහත සඳහන් ගීය ශ්‍රවණය වන සෑම විටෙක ම සිහිපත් වීම වළකාගත නොහැකි ය. නැද්ද එහි බෙංගාල නොහොත් වංග ශෛලිය? එහි එන තාල වාදනය බැහැර කොට ගීය සිතින් විඳ බලන්න. නැද්ද එවිට එහි කන්තාරු ශෛලියක්? එදා කවුරුන් හෝ මේවාට එරෙහි වූවාද? නැත. එසේ නම් සුනිලුන් ගේ ගීතවල පමණක් වංග හෝ කන්තාරු සෙවණැලි දුටුවේ කෙලෙසින් ද? ගල්මුල් වීසි කරන්නේ පල ඇති රුක්වලට පමණක් නිසා ද?

☛ 15 පිටුවට

## මරිය දහමේ අධ්‍යාත්මිකත්වය - 1

# "මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි"

"**එහෙත් කාලය සම්පූර්ණ වූ කල, දෙවියන් වහන්සේ ස්ත්‍රියකගෙන් උපත ලත්, ව්‍යවස්ථාව යටතේ උපන්, සිය පුත්‍රයාණන් එවා වදාළ සේක**" (ගලාති 4:4).

දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වූ ජේසුස් වහන්සේ තම පියාණන් වහන්සේගේ ගැඹුරුතම ස්වරූපය සහ ගුණ ලක්ෂණයන් පිළිබිඹු කරන සේක. දේවත්වය සැබවින්ම කුමක්ද කියා මේ ලෝකය තුළ පරාවර්තනය කරන ජේසුස් වහන්සේව පිළිසිඳ ගැනීමට සහ මේ ලෝකයට බිහි කිරීමට මරිය තුමියට දෙවියන් වහන්සේගේ ගාබ්‍රියෙල් නම් දේව දූතයා විසින් ආරාධනා කරන ලදි.

දේවත්වයේ පරිපූර්ණතාවය වරප්‍රසාදයෙන් පරිපූර්ණ වූ තැනැත්තිය තුළ මාංශගත විය. "ධර්මයාණෝ මාංශගතව අප සමග වැඩ විසූ සේක. දේව වරප්‍රසාදයෙන් ද සත්‍යයෙන් ද පූර්ණ උන්වහන්සේගේ තේජශ්‍රිය, එනම්, පියාණන් වහන්සේ කෙරෙන් වූ එකම පුත්‍රයාණන්ගේ තේජශ්‍රිය, අපි දුටිමු" (ජොහාන් 1:14).

මරිය තුමිය ද ජේසුස් වහන්සේ මෙන් වරප්‍රසාදයෙන් පූර්ණව සිටියාය; "විපුල ප්‍රසාද ලත් උත්තමිය, ඔබට මංගල වේවා. සමිඳාණන් වහන්සේ ඔබ සමගය" (ලූක් 1:28). දේව කැමැත්ත සහ දේව සැලැස්ම හඳුනා ගත හැක්කේ අවංකව ප්‍රශ්න කිරීම සහ ගැඹුරු විමසීම තුළින්ය. දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම යනු අඥාන, නිවට නියාලු, බයාදු සහ අන්ධ ක්‍රියාවලියක් නොවේ.

මරිය තුමිය ස්වභාවයෙන්ම සහ ඇතුලාන්තයෙන්ම ජීවිතය ගැන ඉතා ගැඹුරට මෙනෙහි කිරීම තුළින් කටයුතු කරන ලද කාන්තාවක් බව එතුමිය විසින් ගාබ්‍රියෙල් දේව දූතයාට දුන් පිළිතුරෙන් මොනවට පැහැදිලි වේ; "මට පුරුෂයෙකු නැති බැවින් මෙවැන්නක් කෙසේ විය හැකිද?" (ලූක් 1:34). ප්‍රශ්න ඇසීම අදැහිල්ලේ ක්‍රියාවකි. අප සාමාන්‍යයෙන් ප්‍රශ්නයක් අසන්නේ අපට යම්දුරකට හෝ විශ්වාස කළ හැකි පුද්ගලයකුගෙන් පමණි. අපට විශ්වාස කළ නොහැකි පුද්ගලයකුගෙන් කිසිවක් ඇසීමට අප පෙළඹෙන්නේ නැත. එය අර්ථ ශූන්‍ය ක්‍රියාවක් බව අපි අත්දැකීමෙන් දනිමු.

කිතුනු ඇදහිල්ල අන්ධ සහ නිවට යථාර්ථයක් නොවේ. කරුණු කාරණා විමසීම සහ එසේ විමසූ කරුණු කාරණා ගැන විශ්ලේෂණය කිරීම සහ මෙනෙහි කිරීම කිතුනු ඇදහිල්ලේ කේන්ද්‍රීය ලක්ෂණයකි. ජීවිතය ගැන ගැඹුරට මෙනෙහි නොකර දෙවියන් වහන්සේට සමීප විය නොහැකිය, උන්වහන්සේගේ කැමැත්ත ඉටු කළ නොහැකිය, උන්වහන්සේට ප්‍රසන්න වන ආකාරයට ජීවත් විය නොහැකිය.

කරුණු කාරණා විමසීමේ ක්‍රියාවලිය මගින් උපදින ආලෝකය තුළින්. අවබෝධ වන දේව අනාවරණය තුළින් අපගේ අදැහිල්ල තව තවත් ශක්තිමත් වීමට පටන් ගනී, ගැඹුරු වීමට පටන් ගනී. මරිය තුමිය සතු සුවිශේෂ ලක්ෂණයක් වූයේ ජීවිත අත්දැකීම් ගැන ඉතා ගැඹුරට මෙනෙහි කිරීමේ හැකියාවයි. "එහෙත්, මරිය තුමී එකී සියල්ල සිත්හි නිදන් කොට ඒවා මෙනෙහි කළාය" (ලූක් 2:19; 2:51) (වර්තමානයේ වල්මත් වී හිස් ජීවිත ගත කරන තරුණ තරුණියන්ටද එතුමියගේ මෙම ගුණාංගය වැඩිදියුණු කර ගැනීම අතිශයින්ම වැදගත්ය).

ස්වභාවයෙන්ම මෙනෙහි කිරීමට හුරුවී සිටි මරිය තුමිය විසින් අසන ලද ප්‍රශ්නයට ගාබ්‍රියෙල් දේව දූතයාගේ පිළිතුර වූයේ, "ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක. පරමෝත්තමයාණන්ගේ ආනුභවායද ඔබ වසා ගන්නේය. එහෙයින් උපදින පරිශුද්ධ දරුවා දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක" (ලූක් 1:35) යන්නයි. මෙවැනි පිළිතුරක් තේරුම් ගැනීමට දෙවියන් වහන්සේ පිළිබඳ ගැඹුරු දැක්මක් සහ අත්දැකීමක් එතුමිය සතුව තිබිය යුතුවේ. එමෙන්ම එවැනි පිළිතුරක් මුළු හදවතින්ම බාර ගැනීමට අති දැවැන්ත අධ්‍යාත්මික නිහතමානිත්වයක් එතුමිය සතුව තිබිය යුතුවේ. අප සතුවද එවැනි ගුණාංග තිබේ ද?

දේව දූතයාගේ අනාවරණය තුළින් එතුමිය දෙවියන් වහන්සේගේ කැමැත්ත සහ සැලැස්ම ක්ෂණිකව හඳුනා ගන්නා ලදි: "බලන්න, මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙස ම මට ඉටු වේවා" (Ecce ancilla Domini, fiat mihi secundum Verbum tuum). (ලූක් 1:38) දෙවියන් වහන්සේගේ දාසයෙක් හෝ දාසියක් වන පුද්ගලයා ලොව සිටින නිදහස්ම පුද්ගලයාය. එය මේ ලෝකය තුළ මිනිසුන් අත් දකින වහල්භාවය නොවේ. දෙවියන් වහන්සේගේ දාසයෙක් හෝ දාසියක් නොවන පුද්ගලයා වෙනත් බලවේග සහ ඇබ්බැහිවීම් වල දාසයෙක් හෝ දාසියක් බවට පත් වේ. වර්තමාන ලෝකයේ බහුතරයකගේ ඉරණම මෙය නොවේ ද? වෙනත් ආකාරයේ වහල්භාවයන් වලින් සැබවින්ම ගැළවී සිටින්නේ ඉතාමත් සුළුතරයක් නොවේ ද?

දෙවියන් වහන්සේගේ වහලෙක් වෙනවා යනු සැබෑ ඇතුලාන්ත නිදහස අත්දැකීමයි. එවැනි පුද්ගලයෙක් බාහිරවද නිදහසේ ජීවත් වන පුද්ගලයෙකි. දෙවියන් වහන්සේ සැබෑ නිදහසට අපව නිදහස් කරන සේක. දෙවියන් වහන්සේ අපගේ සැබෑ නිදහස වන නිසා අනෙකුත් සෑම ආකාරයකම වහල් භාවයන් වලින් උන්වහන්සේ අපව නිදහස් කරන සේක. සැබෑ නිදහසේ වහලෙක් තවදුරටත් වහලෙක් නොවේ. දෙවියන් වහන්සේ සැබෑ නිදහස වන නිසා, සැබෑ නිදහසේ වහලෙක් ලොව සිටින නිදහස්ම පුද්ගල යායි.

සැබෑ නිදහස යනු දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට අප තුළ ඇති හැකියාවයි. ඒ අනුව ලොව ජීවත් වූ නිදහස්ම කාන්තාව මරිය තුමියයි. එතුමිය පරිපූර්ණව. සර්ව සම්පූර්ණව දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටුකළ නිසා, එතුමිය පරිපූර්ණව, සර්ව සම්පූර්ණව ඇතුලාන්ත සහ බාහිර නිදහසකින් ජීවත් විය. එතුමිය විසින් භුක්ති විඳින ලද ඇතුලාන්ත නිදහස එතුමියගේ බාහිර හැසිරීමෙන් මනාව පිළිබිඹු විය.

වර්තමාන ලෝකය විසින් අගයකරන වල් බූරු නිදහස සැබෑ නිදහස නොවේ. එය ඉතා ප්‍රබල වහල් භාවයකි. එම වහල් භාවය තුළ ජීවත් වන පුද්ගලයන් ඒ බව අවබෝධ කොට නොගැනීම නිසා එම වහල් භාවය තුළ තවතවත් ගිලෙමින් සහ එරෙමින් සිටිති. එයින් නිදහස් වීමට නම් ඔවුන් මරිය තුමිය දෙස නැවත නැවතත් බැලිය යුතු වේ, එතුමියගේ ජීවිතයෙන් බොහෝ දේවල් ඉගෙන ගත යුතුවේ. එතුමිය තුළින් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේට සමීප වීමට මේ මොහොතේ පටන් තීරණයක් ගත යුතු වේ.

විශේෂයෙන් වර්තමාන තරුණියන්ට සිටින හොඳම ජීවිතාදර්ශය බොලිවුඩ් හෝ හොලිවුඩ් නිළියන්නොව මරිය තුමියයි. මරිය තුමියට පිටුපාන, එතුමියව ආදර්ශයට නොගන්නා සෑම තරුණියකගේම ඉරණම අතිශයින් ශෝකජනක වේ. වර්තමාන තරුණියන්ගේ අවුල් සහගත ජීවිත දෙස බලන විට ඒ බව මැනවින් පැහැදිලි වේ.

ජීවිතයේ සැබෑ සුරක්ෂිත භාවය, සැබෑ සංතෘප්තිය සහ සැබෑ ආත්මීය සුවය අපට ලැබෙන්නේ, එතුමිය මෙන් දෙවියන් වහන්සේගේ කැමැත්තට අවනත වීමෙන්ය, එය ධෛර්යවන්තව සහ නිහතමානීව ක්‍රියාත්මක කිරීමෙන්ය, එයට අපගේ පරිපූර්ණ එකඟතාවය පළ කිරිමෙන්ය. දෙවියන් වහන්සේගේ කැමැත්ත අපගේම කැමැත්ත ලෙස සම්පූර්ණයෙන්ම අයිති කර ගැනීමේ ක්‍රියාව අපගේ හදවතේ ගැඹුරුතම පතුලෙන් පැමිණ විය යුතුවේ. අපගේ හදවතට සම්පූර්ණ තෘප්තියක් ලැබෙන්නේ එය දෙවියන් වහන්සේගේ කැමැත්තෙන් පුරවා ගත් විට පමණි. වෙනත් දේවල් වලින් පුරවා ගන්නා ලද හදවත ඉතා අසතුටෙන්, අසහනයෙන් සහ කලකිරීමෙන් කල් යවන හදවතකි.

මරිය තුමියගේ හදවත දෙවියන් වහන්සේ තුළ සැබෑ සුරක්ෂිතභාවය අත්දකින ලද හදවතකි. එතුමියගේ හදවත කලකිරීමෙන් තොර වූ හදවතකි. එතුමිය අතිශයින් වේදනාකාරී අත්දැකීම්වලට මුහුණ දුන් බව ඇත්තය. නමුත් එතුමිය ඒ නිසා කලකිරිමට, අපේක්ෂා භංගත්වයට පත් වූයේ නැත. දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන හදවත සහ ආත්මය කලකිරීම් වලට ගොදුරු නොවූ හදවතකි, ආත්මයකි. දෙවියන් වහන්සේට සැබවින්ම ප්‍රශංසා කළ හැක්කේ කලකිරීම් වලින් ජය ගත් පුද්ගලයකුට පමණි.

මරිය තුමියගේ උදාන ගීතය මෙයට ඇති හොඳම සාක්ෂියයි; "මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි, මාගේ ආත්මය මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයි" (ලූක් 1:46-47). දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන හදවත ශක්තිමත්, ධෛර්යමත්, යථාර්ථවාදී, ප්‍රඥාවන්ත සහ නිහතමානි හදවතකි.

දෙවියන් වහන්සේගේ කැමැත්තට එකඟ වීමෙන් අපගේ ජීවිත තුළිනුත් දේවත්වයේ ලක්ෂණ බැබලීමට පටන් ගනී. එමඟින් අපගේ මනුෂ්‍ය ස්වභාවය දේවත්වයට එස වේ. දෙවියන් වහන්සේගේ කැමැත්තට එරෙහිවීමෙන් අපගේ මනුෂ්‍යත්වය පිරිහීමට පටන් ගනී. පිරිහුණු මනුෂ්‍යත්වයක් සහිත පුද්ගලයා ඉතා අසහනයෙන්, අසතුටෙන් සහ විඳවමින් ජීවත් වන පුද්ගලයෙකි.

ඇදහිල්ලෙන් ලැබෙන සුරක්ෂිතභාවය, නිහතමානිත්වය සහ ධෛර්යවන්තකම මරිය තුමිය සතු කැපී පෙනෙන ගුණාංග යන් විය. එතුමියගේ චරිතයේ කැපී පෙනෙන ලක්ෂණයක් නම් ආත්මීය නිහතමානිත්වයයි. දෙවියන් වහන්සේගේ කැමැත්තට සර්ව සම්පූර්ණ එකඟතාවය පළ කළ හැක්කේ අධ්‍යාත්මිකව ශක්තිමත් පුද්ගලයකුට පමණි. නිහතමානි පුද්ගලයා අධ්‍යාත්මිකව ශක්තිමත් පුද්ගලයෙකි. එවැනි පුද්ගලයෙක් ධනය, බලය, දැන හැඳුනුම්කම්, තාන්නමාන්න, තරාතිරම්, කීර්තිනාමය යනාදිය මත පදනම් නොවී තම ආත්මයේ ශක්තිය මත පමණක් පදනම් වේ. එනම් දෙවියන් වහන්සේ මත පමණක් තම සම්පූර්ණ විශ්වාසය තබයි.

අප සැමටම වඩා ඉතා අධික ලෙස වරප්‍රසාද ලත් මරිය තුමිය ඉතා නිහතමානි ජීවිතයක් ගත කළා නම්, එයින් ඔළුව ඉදිමුවා නොගත්තා නම්, අප කොතරම් නිහතමානි ජීවිතයක් ගත කළ යුතුද? අප තුළම ආඩම්බර වීමට, කයිවරු ගැසීමට. පුරසාරම් දෙඩීමට තරම් කිසි දෙයක් නොමැත. දෙවියන් වහන්සේ නොමැතිව අපි අළු සහ දූවිලි වෙමු. උන්වහන්සේ අප තුළ නොමැති නම් අප තුළ කිසිදු වැදගත්කමක්, වටිනාකමක් නොමැත.

අපගේ ජීවිතයේ ගුණාත්මක භාවය, වටිනාකම සහ අර්ථය අපි දෙවියන් වහන්සේට අපගේ ආත්මය තුළට ඇතුළු වීමට ඉඩ දෙන ප්‍රමාණයට සමානුපාතිකය. මේ සඳහා අපට අනුගමනය කළ හැකි සුවිශේෂ ආදර්ශය නම් මරිය තුමියයි.

ඉදිරි කලාපයට... »



මහාචාර්ය **ඇන්ටන් මීමන**

# මරියතුමිය සහ කතෝලික සම්ප්‍රදාය - 1

## "මෙවැන්නක් කෙසේ විය හැකිද?"

# සදාකාලික කන්‍යාභාවය

මරිය තුමියගේ සදාකාලික කන්‍යාභාවය (Perpetual Virginity) විශ්වාස කිරීමට තරම් අමාරු යථාර්ථයක්ද? එය කිසිසේත්ම සිදුවිය නොහැකි දෙයක්ද? එය පිළිගැනීමට බොහෝ පුද්ගලයන් මැලි කමක් දක්වන්නේ ඇයි? එය නොපිළිගන්නා පුද්ගලයන් බලාපොරොත්තු වන්නේ එතුමියට දෙන ගෞරවය අඩපණ කිරීමට ද?

දැනට අවුරුදු දෙදහසකට පමණ පෙර ජේසුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේගේ මාංශගතවීම මානව ඉතිහාසයේ සිදුවූයේ පළමුවන වතාවටය. එය අතිශයින් තීරණාත්මක සහ නැවත වතාවක් සිදු නොවන සිද්ධියකි. ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානයත් ඉතිහාසයේ සිදුවූයේ පළමුවන වතාවටය. එයද අතිශයින් තීරණාත්මක සහ ඉතිහාසයේ එක් වතාවක් පමණක් සිදුවූවකි. එක් තීරණාත්මක සිද්ධියකින් සමස්ත ඉතිහාසයටම බලපෑමක් දෙවියන් වහන්සේට කළ හැකිය.

දෙවියන් වහන්සේ මානව ඉතිහාසය තුල ක්‍රියා කරන ආකාරය ගැන අපට අනාවැකි පළ කළ නොහැකිය. එමෙන්ම උන්වහන්සේගේ නිදහසට අපට බාධා කළ නොහැකිය. උන්වහන්සේගේ නිර්මාණශීලිත්වය අපට පාලනය කළ නොහැකියි. දෙවියන් වහන්සේව දෙවියන් වහන්සේ මෙන් අපි බාර ගත යුතු වෙමු.

මරිය තුමියගේ ශාරීරික කන්‍යාභාවය නොබිඳී, නොසිඳී ජේසුස් වහන්සේට උපත ලබාදීමත් ප්‍රථමවරට මානව ඉතිහාසයේ සිදුවූ තීරණාත්මක සිද්ධියකි.

ඉතිහාසයේ මීට පෙර නොවූ මාංශගත වීමේ අභිරහස තේරුම් ගත හැක්කේ ඉතිහාසයේ මීට පෙර නොවූ සදා කාලික කන්‍යාභාවය හා සමග සම්බන්ධ කර තේරුම් ගැනීමෙන්ය. කිසිදු පුද්ගලයකුට හානියක් නොකර දෙවියන් වහන්සේට අප අතරට පැමිණිය හැකිය. තම මවගේ ශරීරයට හානියක් නොකර දේව පුත්‍රයාණන් මේ ලෝකයට ඉපදුන සේක.

ජේසුස් වහන්සේ මේ ලෝකයට පැමිණියේ කිසිම පුද්ගලයකුට හානියක් කිරීමට නොව, අප සැම දෙනාගේම ශාරීරික සහ ආත්මීය කන්‍යා භාවය නිවැරදි මාර්ගයට යොමු කිරීමටය. කන්‍යාභාවය තුළින් අපගේ ශාරිරික සහ අධ්‍යාත්මික ශුද්ධවත්භාවය පිළිබිඹු වේ. දෙවියන් වහන්සේට සේවය කළ හැක්කේ කන්‍යාභාවය ආරක්ෂාකර ගැනීමෙන්ය.

පරිශුද්ධ පුත්‍රයාණන් වහන්සේ මෙලොවට බිහිවූයේ තම මවගේ කන්‍යාභාවය ආරක්ෂා කර දීමෙන්ය. උන්වහන්සේගේ දූත මෙහෙවර ගැන අදහසක් අපට එයින්ම ලබාගත හැකිය. දෙවියන් වහන්සේ තමන් වහන්සේව අපට සන්නිවේදනය කරන්නේ අලුත් දෙයක් මඟින්ය. "මතු සිදුවන අලුත් දේ සිදුවන්නත් පෙර මම ඔබට ප්‍රකාශ කරමි" (යෙසායා 42:9).

යම්කිසි දෙයක් ඉතිහාසයේ මීට පෙර සිදු නොවී තිබුන නිසා එවැනි දෙයක් කිසිසේත්ම සිදුවිය නොහැකි යයි තර්ක කළ නොහැකිය. පළමුවන වරට සහ අන්තිමවරට සිදු වූ දේවල් ඉතිහාසයේ පවති.

කන්‍යාභාවය තුළින් පවා දෙවියන් වහන්සේට තම සැලැස්ම ක්‍රියාත්මක කළ හැකිය. කන්‍යාභාවය තුළින් පවා තම පුත්‍රයාණන්ව මේ ලෝකයට බිහි කළ හැකිය. දෙවියන් වහන්සේට සෑම දෙයක්ම කළ හැකි නිසා කන්‍යාභාවය නොබිඳ, නොසිඳ පවා දරුවකු මේ ලෝකයට බිහිකිරීමට කටයුතු කළ හැකිය. දෙවියන් වහන්සේ ඕනෑම තත්ත්වයක් යටතේ මානව සංහතියේ සුබසිද්ධිය සහ ගැළවීම උදෙසා කටයුතු කරන සේක.

"දේව දූතයා ඈට උත්තර දෙමින්...... "දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැතැ" යි කීවේය. (ලූක් 1:37; 18:27; උත්පත්ති 18:14; ජෝබ් 42:2; ජෙරමියා 32:17; මතෙව් 19:26; මාක් 10:27) දෙවියන් වහන්සේ හිතුමතේ කෙරුමෙක් මෙන් තම බලය තමන් කැමති කැමති ආකාරයට යොදවන බව මින් අදහස් නොවේ. දෙවියන් වහන්සේට මානව අපගේ ගැළවීම වෙනුවෙන් නොකළ හැකි දෙයක් නොමැත. දෙවියන් වහන්සේට සෑම දෙයක්ම කළ හැක්කේ උන්වහන්සේ තම බලය කිසිසේත්ම අයුතු ලෙස පාවිච්චි නොකරන නිසයි. බලය අයුතු ලෙස පාවිච්චි කරන්නා ඉතා දුර්වල පුද්ගලයෙකි.

තම බලය සේවය කිරීම සඳහා පමණක් භාවිත කරන්නා සැබෑ බලවන්තයායි. දෙවියන් වහන්සේ සැබැවින්ම බලවත්වනුයේ මෙම අර්ථයෙන්ය. අපගේ ගැළවීම වෙනුවෙන් උන්වහන්සේ සර්ව සම්පූර්ණයෙන්ම ඇප කැපවී සිටින සේක.

ශාරීරික කන්‍යභාවය සහ අධ්‍යාත්මික නිහතමානිත්වය එකිනෙකින් කිසිසේත්ම වෙන් කළ නොහැකිය. එතුමියගේ සදාකාලික කන්‍යාභාවය දෙවියන් වහන්සේට වඩාත් ප්‍රසන්න වූයේ ඒ තුළින් එතුමියගේ බැගෑපත්කම, ශුද්ධවත්කම සහ ධෛර්යය බැබළුණු නිසයි.

එතුමියගේ ශරීරය සහ ආත්මය යන දෙක තුළම කන්‍යාභාවය පිහිටා තිබුණේය. ආත්මික පිරිසිදුභාවය හෙවත් ඇතුලාන්ත පාරිශුද්ධතාවය නොමැතිව ශාරීරික කන්‍යාභාවයේ වටිනාකමක්, අගයක් සහ අර්ථයක් නොමැත. එමෙන්ම ආත්මයේ පාරිශුද්ධත්වය ශාරීරික පිරිසිදුභාවය තුළින් පිළිබිඹු විය යුතු වේ. එවිට ආත්මය මෙන් ශරීරයද දෙවියන් වහන්සේට කැප කළ, උන්වහන්සේට ප්‍රසන්න වූ ජීවමාන යාගයක් බවට පත්වේ.

ශාරීරික පරාශුද්ධ භාවය ගැන ශුද්ධවර පාවුලු තුමා ද මෙසේ සඳහන් කර ඇත;

ඉදිරි කලාපයට... »

දැල්වෙන පහන්

## කතෝලික මුද්‍රණාල දියුණුවට අඩිතාලම දැමූ

# ගරු බර්ට්‍රම් දබරේරා පියතුමා

**සමිඳු මිදි උයනේ අඩසියවසකට මඳක් වැඩි කලක්ද, ජීවන තක්සලාවේ අසූ එක්වසරක්ද ගෙවූ ගරු බර්ට්‍රම් දබරේරා පියතුමා 2013 නොවැම්බර් 10 වැනිදා සමිඳු තුරුළේ සදා සැතපෙන්නට ගියේය.**

බෝලවත්තේ විසූ ඇලෙක්සැන්ඩර් ජෝශප් දබරේරා හා මේරි එල් ප්‍රනාන්දු යුවළගේ අටදෙනකුගෙන් යුතු පවුලේ සිවු වැන්නා ලෙස 1932 දෙසැම්බර් 31 වැනිදා උපත ලැබීය. 1933 ජනවාරි 03 වැනිදා පූජ්‍ය ජාකොමේ ගොන්සාල්වෙස් පිය පහස ලද බෝලවත්ත දෙව්මැඳුරේ බෞතිස්ම ස්නාපනය ලද එතුමා වෙන්නප්පුව ජෝශප් වාස් විදුහලෙන් හා ගාල්ල සාන්ත ඇලෝසියස් විදුහලේ නේවාසිකව සිප් සතර හැදෑරීය. ඉගෙනුමට මෙන්ම ක්‍රීඩාවට ද දස්කම් දැක්වූ එතුමා ටික කලක් වැවිලි කරුවකු ලෙසද පුහුණුව ලැබීය. එහෙත් සිය කැඳවීම පූජකවරයට බැව් වටහාගෙන සමිඳු මිදි උයනේ සේවාවට ප්‍රවිෂ්ට වූ එතුමා 1962 සැප්තැම්බර් 01 වැනිදා කොළඹ අගරදගුරු අතිඋතුම් තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් වෙතින් පූජකවරය ලැබීය.

එවකට කොළඹ අගරදගුරු වසමේ සේවය කළ ගරු සකරියස් දබරේරා පියතුමාගේ ඥාති පුත්‍රයකු වූ ගරු බර්ට්‍රම් දබරේරා පියතුමා සිය පූජකවර ගමන් මඟට එතුමාව ආදර්ශයට ගත්තේය. 1962 දී තරුණ පියතුමකු ලෙස මීගමුව වැල්ලවීදිය සහයක ලෙස පත්ව ගිය එතුමා 1964 දී බොරැල්ල සියලු සාන්තුවර දෙව්මැඳුරේ සහයක ලෙස පත්විය. 1966 දී මීගමුව කොච්චිකඩේ පල්ලන්සේන මීසමේ මීසම් සේවක ලෙස පත්වූ අතර ඉන් පසු ටික කලක් කොටහේන සාන්ත ලුසියා ආසන දෙව්මැඳුරේද සේවය කළේය. පසුව බොරැල්ල සියළු සාන්තුවර දෙව්මැඳුරට යළි සපැමිණි එතුමා ගරු ජෝන් එම් හේරත් පියතුමාගේ සහයක ලෙස අගනුවර සුපතල සදාසරණ පල්ලියේ දශක දෙකකට වැඩි කලක් සේවය කළේය.

වර්ෂ 1977 දී අතිඋතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් කොළඹ අගරදගුරු වසමේ නව පුදැදුරාණන් ලෙස පත්වූ පසු ගරු බර්ට්‍රම් දබරේරා පියතුමා බොරැල්ල මීසම් සේවක විය. වර්ෂ 1982 දී කොළඹ අගරදගුරු වසමේ භාණ්ඩාගාරික ධූරයට එතුමාව පත් කැරිණ. භාණ්ඩාගාරික ධූරයේ කටයුතු කරන අතරවාරයේදීම 1985 දී කොළඹ කතෝලික මුද්‍රණාලයේ අධ්‍යක්ෂ ධූරයට එතුමාව පත්කරන්නට අගරදගුරු හිමිපාණෝ කටයුතු කළහ.

මෙරට ඉපැරැණිම මුද්‍රණාලයක් වශයෙන් ඓතිහාසික වටිනාකමක් තුබූ කොළඹ කතෝලික මුද්‍රණාලය මෙරට තවමත් පළවන ඉපැරැණිම සිංහල පුවත්පතේ තිඹිරි ගෙයයි. වර්ෂ 1866 ජූනි 07 වැනිදා ආරම්භ කළ ඥානාර්ථ ප්‍රදීපයත්, 1869 පෙබරවාරි මාසයේ ආරම්භකළ ද කැතලික් මැසෙන්ජර් පුවත්පත් දෙකම මුද්‍රණය කළ කතෝලික මුද්‍රණාලය එවකට පැවතියේ කොළඹ අගරදගුරු වසමට මහත් බරක් වෙමිනි. එහි නඩත්තු කටයුතු පමණක් නොව සේවක පඩිනඩි පවා කොළඹ අගරදගුරු මැඳුරෙන් ලබා දෙන්නට සිදුව තිබූ බව නොරහසකි. ඒ නිසාම කතෝලික මුද්‍රණාලයේ සේවය කිරීම ගෞරවයකට වඩා සමාජයේ හැල්ලුවට හේතුවක් වූ බැව් පැරැන්නෝ කීහ.

මේ නිසාම එහි අධ්‍යක්ෂ ධූරයට පත් ගරු බර්ට්‍රම් දබරේරා පියතුමාගේ උරමත පැවරුණේ බලවත් අභියෝගයකි. සියවසක් ඉක්මවා ගිය 'පහන් ගෙදර' නවීකරණය කර කාලයේ තාලයට ගැලපෙන්නට සැකසීම කළ යුතුවම තුබූ ඉතා වැදගත් කාර්යයකි. නවීන තාක්ෂණය ගුරු කොට ගනිමින් ඉපැරැණි ලෙටර්ප්‍රෙස් යුගයේ අතින් අකුරු ඇමුණු යුගය මෙන්ම මොනෝ ටයිපින් ලෙස ප්‍රකට විද්‍යුත් අකුරු ඇමිනුම් යුගයන්ට සමුදෙන්නට පිඹුරුපත් සැකසිණ.



ඕෆ්සෙට් මුද්‍රණ රටාවට කොළඹ කතෝලික මුද්‍රණාලය හැඩ ගස්වමින් නව මුද්‍රණ යන්ත්‍ර මිලදී ගත් අතර පියවරෙන් පියවර ඉදිරියට යමින් පරිගණක ටයිප් සෙටිං, ස්කැනර්, ඕෆ්සෙට් කැමරා හා ප්ලේට් මේකින් ආදි නවීන තාක්ෂණයේ සියලු අංශ එක වහලක් යටට රැගෙන එන්නට දිවා රෑ නොබලා වෙහෙසුණේය. නවීන තාක්ෂණය, විද්‍යානුකූල මුද්‍රණ කර්මාන්ත රටාවන් ඔස්සේ කොළඹ කතෝලික මුද්‍රණාලය යන්ත්‍ර සූත්‍ර වලින් නවීකරණය කරන්නට උරදුන්නා හා සමාන ලෙස ඊටත් වඩා වටිනා දේව සමාන කමට මැවූ දේව මැවිල්ලක් ලෙස කතෝලිකයන් අදහන ශ්‍රමයේ මහා දායක කාරකාදීන් වූ සේවක සේවිකාවන්නේ ජීවිත නැංවීමේ නිහඬ විප්ලවයක්ද ආරම්භ කළේය.

සේවක වැටුප් පත මෙන්ම වාර්ෂිකව එතෙක් ලබාදෙමින් තුබූ නාමික බෝනස් මුදල දස ගුණයකින් පමණ ඉහළ නංවා නත්තලේ සැබෑ අරුත වූ බෙදා ගැනීම 'පහන් ගෙදර' තුළින් ජීවගන්වන්නට පියවර ගත්තේය. පාලකයකු ලෙස ඉතා දැඩි තීරණ ගන්නට අවැසි තැන්වලදී දෙවරක් සිතා නොබැලූ එතුමා හදවතින්ම සිය සේවක පිරිසට ආදරය කළ උත්තම පූජක පුතකු විය.

සිවු වසරකට ආසන්න කාලයක් 'ඥානාර්ථ ප්‍රදීපය' වැඩබලන කර්තෘ ලෙස කටයුතු කළ සමයේ එතුමා සමග ඉතා සමීපව කටයුතු කරන්නට හැකිවිය. රටේ පැවැති විවිධ අරගල - දකුණේ තරුණ නැගිටීම්. පුවත් බලධාරී වාරණ ආදිය මැදත්, දකුණේ සටන්කාමීන්ගේ නිල නොවන ඇඳිරි නීතිය, තුණ්ඩුවෙන් කඩසාප්පු වසා දමන අරාජික ස්වභාවයන් හමුවේ ඥානාර්ථ ප්‍රදීපය මහා සැඩ සයුරේ ගල්පර වල වැදී විනාශ වන්නට නොදී රැගෙන යෑමට දායකවීමට ලැබීම මගේ ජීවිතයේ සුවිශේෂී මතක සටහනකි.

බාහිර පෙනුමෙන් සැර පරුෂ බවක් පෙන්නුම් කළද සහෝදර සේවකයන්ගේ පමණක් නොව දිළිඳු දේව ජනතාවගේද දුක වේදනාව හමුවේ හදවත වෙඩරු පිඩක් සේ උණුවන ල'තෙත් බවක් එතුමාට විය. සංවේදී හදවතක් ඇති එතුමා සිය විසි වසරක කතෝලික මුද්‍රණාල සේවාවේදී ඒ ගුණය ප්‍රකට කළේ වරක් දෙවරක් නොවේ. හදිසි අවස්ථාවල ප්‍රවාහන අර්බුද අවස්ථාවල බෝම්බ පිපිරීමේ සිද්ධීන් වලදී සේවක පිරිස පීඩාවට පත්වන්නට ඉඩ නොදී කල්වේලා ඇතිව කාර්යාලය වසා සේවකයන්ට ගෙදර යන්නට සැලසූ වාර බොහෝය. අනූව දශකයේ දී දෙහිවල දුම්රිය ස්ථානයේදී පුපුරා ගිය මාරක බෝම්බයෙන් ආයතනයේ සේවිකාවන් දෙදෙනකු ද තුවාල ලැබීය.

ඒ කෙරේ විශේෂ අවධානයක් යොමුකර නිසි සුවය ලැබෙන තුරු නිවාඩු ලබා දුන්නා පමණක් නොව ඔවුනට විශේෂ ආර්ථික ප්‍රදානයන් කරමින් පීඩාවට පත් අවස්ථාවේ සැබෑ කාරුණික පියකු මෙන් දයාබරිත විය. 2004 සිදුවූ සුනාමි ඛේදවාචකයේදීද පීඩාවට පත් සේවකයන්ට එතුමා නොමසුරුව උදව් උපකාර කළේය.

වැටුප් වර්ධක බෝනස් වලින් පමණක් නතර නොවී ආයතනයේ සේවක පිරිස උදෙසා පෞද්ගලික බැංකුවක ඉතුරුම් සුරැකුම් ගිණුම් අරඹා රු. 25,000/= ආරම්භක ප්‍රාග්ධනයක් තැන්පත් කරමින් තවත් සේවාවකට පුරෝගාමී විය.

කොළඹ කතෝලික මුද්‍රණාලය දෙපයින් සිටුවා තබන්නට ස්වාධීන මූල්‍ය ශක්තියක් ලබා දෙන්නට වෙහෙසවන අතරේ එවකට අග්‍රාමාත්‍ය ආර් ප්‍රේමදාස මහතා මාලිගාවත්ත ප්‍රදේශයෙන් ඉඩමක් අගරදගුරු වසමට ප්‍රදානය කළේය.

මාලිගාවත්ත සාමයේ රැජන දෙව්මැඳුරේ මූලාරම්භය එයවූ අතර ඉතා දර්ශනීය දෙව්මැඳුරක් ඉදිකරන්නට ගරු බර්ට්‍රම් දබරේරා පියතුමා පුරෝගාමී විය. පසුකලෙක අතුරුගිරියේ ද සාන්ත පියෝ දෙව්මැඳුර ඉදිකිරීමේ කමිටුවේ හිඳිමින් ඒ කටයුත්තටද දායකවන්නට එතුමාට හැකිවිය.

හුදු දෙසුමෙන්, සුළඟේ පාවී යන වදන් වලින් දේව ජනතාව ගැන දිළිඳුන් ගැන අසන්නට ලැබුණු කාලයක කියන දේ ක්‍රියාවෙන් ඉටුකොට පෙන්වන්නට සමත්වූ සමිඳු මිදි උයනේ සැබෑ සේවකයාණන් නමක වූ ගරු බර්ට්‍රම් දබරේරා පියතුමා සදා සාමය සොයා ගියේය.

පනස් වසරකට අධික පූජක සේවාවේදී තමන් විසින් ඉදිකරන ලද මාලිගාවත්ත සාමයේ රැජන පින්බිමේ වැතිර සැතපෙන්නට එතුමා සිහින දුටුවේය. අද එතුමා ජීවතුන් අතර නැතත් ඒ සිහිනයද සැබෑ වී ඇත. ගරු බර්ට්‍රම් දබරේරා පියතුමෙනි! ඔබවහන්සේට සුබ ගමන්!

**ශිරාන් මෛත්‍රී**

# අපෙන් සමුගත් ගරු රොමියුලා සොයුරියගේ සුවිශේෂ සේවාව

**අසූව දශකයේ මුල් භාගයේ මග්ගොන සාන්ත මරියා දේවස්ථානය ඇසුරේ සිටි අපට කිසිදා නෙත නොගැටුණ දුබල දසුනක් විය. එනම් පැවිදි සොයුරියක් විදුලි වේගයෙන් යතුරු පැදියක් පැදයාමයි.**

ඒ වෙන කිසිවකු නොව පසුගියදා අපෙන් සමුගත් අපෝස්තලික කාර්මෙල් නිකායේ රොමියුලා පැවිදි සොයුරියයි. පැවිදි ජිවිතය තුළ තම ධර්මදූත කාර්යය නොපිරිහෙළා ඉටු කළ ඇය මග්ගොන මීසමට ද අනුපමේය සේවයක් ඉටු කළාය. එය පුරා වසර 25 කි.

පැවිදි සොයුරියකගේ සේවාව මීසමක් තුළ විශේෂ කටයුත්තකි. එක් අයෙකු මාරු වී ගිය විට තව අයෙකු පැමිණේ. එය පැවිදි ජීවිතයේ සාමාන්‍ය ස්වභාවයයි. නමුත් ගරු රොමියුලා පැවිදි සොයුරිය පිළිබඳ මෙම අත්‍යවශ්‍ය සටහන තබනුයේ එතුමිය සාමාන්‍ය සාම්ප්‍රදායික පැවිදි සොයුරියකට වඩා එහා ගොස් වසර ගණනාවක් මග්ගොන මීසම හා ඒ අවට කිතුනු, බොදුනු. ඉස්ලාම් යන සියළු ජනතාවටද සිදු කළා වූ සුවිශේෂ සේවාව වෙනුවෙනි.

පස්දෙනෙකුගෙන් යුත් පවුලක තෙවැනි සාමාජිකාව වූ ඇය උපත ලැබුවේ කඳාන නම් ග්‍රාමයේය. ගම්පහ සිරිකුරුස විදුහලේ අධ්‍යාපනය ලබා තම දේව කැඳවීමට සාක්ෂි දරමින් අපෝස්තලික කාර්මෙල් නිකායට ඇතුලත් විය.

ගම්පහ, බොරැල්ල, බණ්ඩාරවෙල, ලුණුගල, මුතුර් යන ප්‍රදේශවල සේවාවලින් පසු මග්ගොන කන්‍යාරාමයට 1982 වසරේදී පැමිණෙන විට මග්ගොන කන්‍යාරාමය හා මීසම් ගෘහය වසර ගණනාවක් අතහැර දමා තිබූ හෙයින් ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයක පැවතුණි. මග්ගොන මීසම් භාර පියතුමා පදිංචිව සිටියේ දියලගොඩ මීසම් ගෘහයේය.

වසා තිබූ මීසම් ගෘහයේ තවත් පැවිදි සොයුරියක් සමග පදිංචි වූ ඇය, එහි වෙසෙමින් විනාශ වී ගිය කන්‍යාරාමය ගොඩනැගීමට පටන් ගත්තාය. කන්‍යාරාමය ගොඩනැගූ ඇයගේ ඊළඟ කර්තව්‍යය වූයේ ළදරු පාසලක් ආරම්භ කිරීමයි. දේවස්ථානය ආශ්‍රිතව එතුමිය එදා ආරම්භ කළ ළදරු පාසල ඉතා සුවිශේෂ එකක් විය. ළදරු පාසල් අධ්‍යාපනය එකල ප්‍රාථමික මට්ටමක පැවති අතර වර්ෂ අවසාන විවිධ ප්‍රසංග, ක්‍රීඩා උත්සව, ළදරු පාසල් වාදක කණ්ඩායම් මග්ගොන අවට ප්‍රදේශ පුරාවට දැකගත හැකි වූයේ එතුමිය විසින් ආරම්භ කළ ළදරු පාසල් තුළය. එය පසුකාලීනව ළදරු පාසල් සඳහා පරමාදර්ශයක් සපයන ලදී. මීසම තුළ පැවිදිවරියක සතු සියළු වගකීම් ඉටු කළ එතුමිය එයට අමතරව භාවිතයට නොගත් මීසම් ගෘහය ඇතුළත ගමේ දුප්පත් දරුවන් සඳහා ඉංග්‍රීසි පන්ති පවත්වන ලදී. එපමණක් නොව එතුමිය සුවිශේෂ වන්නේ පල්ලියට අනුබද්ධ ළදරු පාසලට පමණක් සීමා නොවී මග්ගොන ග්‍රාමයේ මුංහේන, නිර්මලවත්ත, විසෙන්තිගම, කිතුමුතුගම ආදී ස්ථාන සොයා ගොස් ඉතා දිළිඳු දරුවන් සඳහා එම ස්ථාන වල ප්‍රජාශාලා ඉදිකොට ළදරු පාසල් ආරම්භ කිරීමයි. ඒවා අධ්‍යාපනික ආයතනයකට පමණක් සීමා නොවූ අතර ප්‍රජාව සමාජීයව, අධ්‍යාත්මිකව, ආර්ථිකව නගා සිටුවීමත් ඉලක්ක කොට ගනිමින් විවිධ



සේවාවන් රාශියක් ඇති කිරීමට දායක වූවාය.

ගමේ තරුණියන් ගණනාවක් ළදරු පාසල් ගුරුවරියන් ලෙස පුහුණු කළාය. ආර්ථිකය ඉතා බෙලහීන වූ ළමුන්ගේ පවුල් වලට විදේශීය හිතවතුන් හරහා ආධාර ලබාදීමට මැදිහත් වූවාය. පසු කලෙක පරිගණක පාඨමාලාවන් දරුවන් සඳහා ආරම්භ කිරීමට පෙරමුණ ගත්තාය.

ක්‍රිස්තියානි ආදර්ශය සියළු ආගමිකයන් අතරට ගෙන යමින් කිසිදු භේදයකින් තොරව වමතින් දුන් දේ දකුණතට නොදැනෙන ලෙස බොහෝ ජනතාවකට උදව් උපකාර කරන ලදී. කුඩා යතුරු පැදියෙන් දවස පුරා සියළු ළදරු පාසල් අධීක්ෂණය කරමින් ඒවායේ අවශ්‍යතා සොයා බැලීය.

පසු කලෙක අලුත් මීසම් ගෘහයක් ඉදිකොට පියතුමකු පැමිණි අතර, මීසම් ගෘහය මුළුමනින් ප්‍රතිසංස්කරණය කොට වේදිකාවක් සහිත විශාල රංගශාලාවක් ලෙස මග්ගොන ජනතාව වෙත එතුමිය විසින් පිරිනමන ලදි.

සැබෑ ක්‍රිස්තු ශ්‍රාවිකාවක් වූ ඇය සැම විටම නැතිවූ බැටළුවන් සොයා ගියාය. ඔවුන්ට ආදරය කළාය. තම නිවෙස්වල අධ්‍යාපනික පසුබිමක් නොමැති දරුවන්ට අධ්‍යාපනික මග සැලසීය.

සාමාන්‍ය ගමක මෙන්ම මග්ගොන ග්‍රාමයේද අතලොස්සක් නගරයේ පෞද්ගලික පාසල් වල තම අධ්‍යාපනය ලබන අතර ඔවුන් අධ්‍යාත්මිකවද එම පාසල් තුළ මග පෙන්වීමක් ලබති. නමුත් ගමේ දිළිඳු පාසලේ ඉගෙනුම ලබන, මා පිය නෙත නොගැටුණු බොහෝ සමාජ ප්‍රශ්න තුළ ඇලී ගැලී ගිය දරුවන් නගරයේ පාසල්වල දරුවන්ගේ අධ්‍යාපනික මට්ටමට ගෙන ඒමට එතුමියට මහත් බලාපොරොත්තුවක්, සිහිනයක් තිබුනි.

එය වඩාත් තහවුරු කිරීමට එතුමිය මා සමග දොඩමළු වූ බොහෝ දෑ අතරේ එක් වදනක් පමණක් එතුමියගේ වචනයෙන් සටහන් කර තබමි.

"කොන්වන්ට් කොලේජ්වල ළමයි ගානටම අපි අපේ කෙල්ලෝ කොල්ලෝ ටිකත් උස්සල ගන්න ඕනා....."

ළදරු පාසලේ සිට උසස් අධ්‍යාපනය දක්වා බොහෝ දරුවන් ඇය විසින් ඔසවා තබා තිබේ. ඔවුන්ගේ දිවි මග වෙනස් කිරීමට එතුමිය විශාල දායකත්වයක් ලබාදුනි. මග්ගොන ග්‍රාමයේ අද වන විට පැවිදි සේවයේ යෙදී සිටින බොහෝ දෙනා ඒ මග ගෙන යාමේ නියමුවා වූයේ ඇයයි.

එබැවින් එතුමිය අපෙන් වෙන්ව ගියද අප ග්‍රාමයට ඉතිරි කර දී ගිය භෞතික දේ බොහෝය. එසේම එතුමිය ඉතිරි කර ගිය ගුණ සුවඳ හෙටත් පවතිනු ඇත. බොහෝ අභියෝග වලදී නොසැලී සිටි ඇය දේව කැමැත්ත තුළ තම දූත සේවාව ඉතා ඉහළින් ඉටුකළ කළාය.

උදාහරණ ලෙස මුල් යුගයේ එතුමිය යතුරු පැදියේ ගමන් කිරිම පවා සමහරුන්ගේ විවේචනයට ලක්විය. ඒවායින් නොසැලුණු ඇය තම දූත සේවාව තුළ ඉතා වේගවත්ව විශාල වැඩකොටසක් අවසන් කළේ සම්ප්‍රදායට කිසිදා වහල් නෙවෙමිනි.

පැවිදි වරියක සතු වු ආදරය, කරුණාව, බෙදා ගැනීම මෙන්ම නිර්භීත කමද එතුමිය සතුව හොඳින්ම පැවතුනි. තෙරේසා මව්තුමිය කී සැනින් කල්කටාව නිතැතින්ම සිහියට නැගෙනවා සේ රොමියුලා පැවිදි සොයුරිය කී සැණින් මග්ගොන ග්‍රාමයද සිහියට නැගෙනවා නිසැකය.

ඉතිං ආදරණීය මව්තුමියනි, ඔබ අප හැර ගියා ද, ඔබෙන් අප හට හෙටද ඉගෙන ගත යුතු දේ බොහෝය. ඔබ පැතු බොහෝ දේ වෙනුවෙන් අපටද කැපවන්නට ඔබ අපට ශක්තියක් වනු ඇත.

වසර ගණනාවක් පුරා අප ගමට, අප දරුවන්ට එතුමිය කළ සේවාවන් වෙනුවෙන් ස්වාමින් වහන්සේට තුති පුදමු. එතුමියට එම සේවාව සිදුකිරීමට අතහිත දුන් සියළුම දෙස් විදෙස් හිතවතුන්ට ස්තුතිවන්ත වෙමු. එතුමියට ඒ සඳහා ශක්තිය සැපයු අපෝස්තලික කාර්මේල් නිකායේ ශ්‍රේෂ්ඨ මව්තුමිය ඇතුළු සියළු පැවිදි සොයුරියන්ට ස්තුතිය පුදමු.

ගරු මේරි රොමියුලා සොයුරියනි ඔබට සදා මොක් සුව

**අජන්ත චානක**
විදුහල්පති
සාන්ත මරියා විදුහල
මග්ගොන